# අද city edition

2021-04-02
සිකුරාදා
010/ 065
RS.20/=

20420211

විජය ප්‍රකාශනයකි
wijeyanewspapers


# රවි ඇතුළු පිරිසට නඩු දෙකෙන්ම ඇප



ඡායාරූපය: ඉසුරු හර්ෂණ

රවිට ඇප ලැබීමෙන් පසුව පවුලේ සතුට...

● බුද්ධිමාල් රුබේරු

මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ අවස්ථා දෙකකදී රජයට රුපියල් කෝටි 5200ක පමණ පාඩු සිදුකිරීමේ චෝදනා මත දින 14ක කාලයක් රිමාන්ඩ් භාරයේ රඳවාගෙන සිටි හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා ඇතුළු විත්තිකරුවන් 08 දෙනා නඩු දෙකෙන්ම දැඩි කොන්දේසි සහිත ඇප මත මුදාහැරීමට ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුලු දෙකකින්ම ඊයේ (01දා) නියම කෙරිණි.

මහ බැංකුව විසින් 2016 මාර්තු 31වැනිදා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේදී රජයට රුපියල් කෝටි 1500ක පමණ පාඩුවක් සිදුකළ බවට හා මහ බැංකුව විසින් 2016 මාර්තු 29වැනිදා සිදු කළ බැඳුම්කර වෙන්දේසියේදී රුපියල් බිලියන 36.89ක් බැඳුම්කර සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම මඟින් රජයට පාඩු සිදු කිරීම යටතේ පවරා තිබූ නඩු දෙකටම හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා ඇතුළු විත්තිකරුවන්ට මෙලෙස ඇප නියම කළ විනිසුරු මඬුලු නඩු විභාගය අවසන් වනතුරු විත්තිකරුවන්ට විදේශගත වීම තහනම් කළේය. >>P2

## නිවාඩුවේ කොළඹ සිට ගමට යන අයගෙන් ගමට කෝවිඩ් අවදානමක්

### ආර්ථික කලාප ඉලක්ක කරගෙන PCR පරීක්ෂණ සිදුකරනවා

- වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර >>P3

## නව සාමාන්‍යකරණයක් යටතේ අවුරුදු චාරිත්‍ර හා අවුරුදු ක්‍රීඩා පැවැත්වීමට අවස්ථාව >>P3

## සහරාන්ගේ මරාගෙන මැරෙන ප්‍රතිඥා වීඩියෝව මුදාහැරි පුද්ගලයා ඇතුළු 4ක් අත්අඩංගුවට

● ඉන්දික හේවාවිතාරණ/ බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

සහරාන් හෂීම් විසින් පාස්කු ප්‍රහාරයට පෙර තවත් පුද්ගලයන් කිහිපදෙනෙකු සමග සිදු කළ යාඥාවක් සහිත වීඩියෝ පටය හා ඡායාරූපය අන්තර්ජාලයට මුදාහැර ඇති පුද්ගලයා ඇතුළු සහරාන් හෂීම්ගේ අන්තවාදී කටයුතුවලට සහයෝගය දැක්වූ බව කියන පුද්ගලයන් හතර දෙනෙකු ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසය මගින් අත්අඩංගුවට ගෙන තිබේ.

අදාළ පිරිසෙන් සැකකරුවන් දෙදෙනෙකු කොළඹදී අත්අඩංගුවට ගෙන තිබෙන අතර, ඉන් එක් සැකකරුවෙකු වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචි 31 හැවිරිදි පුද්ගලයෙකු වේ. අනෙක් සැකකරු තිහාරිය ප්‍රදේශයේ පදිංචි 32 හැවිරිදි පුද්ගලයෙකි. >>P2

## ඉන්දීය අත්අඩංගුවට පත්වන ශ්‍රී ලාංකික මත් ජාවාරම්කරුවන් ගැන සෙවීමට ඒකාබද්ධ පරීක්ෂණයක්

● ඉන්දික හේවාවිතාරණ


ඉන්දීය වෙරළාරක්ෂක බළකා නිලධාරීන් විසින් මත්ද්‍රව්‍ය හා ගිනිඅවි සමග ශ්‍රී ලාංකිකයන් අත්අඩංගුවට ගැනීම සිදුකරන නිසා එම ජාවාරමට සම්බන්ධ ප්‍රධාන පෙළේ පිරිස් අත්අඩංගුවට ගැනීමට දෙරටේ ආරක්ෂක අංශ ඒකාබද්ධ වී විශේෂ පරීක්ෂණයක් ආරම්භ කර තිබේ. >>P2

## රු. කෝටියක මත්කුඩු මරදානේදී අත්අඩංගුවට

● බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

මරදාන, ලොකට් පටුමග අත්හැර දමන ලද පාළු නිවසක් තුළ තිබී රුපියල් කෝටියකට අධික වටිනාකමින් මත්කුඩු කිලෝග්‍රෑම් එකයි ග්‍රෑම් 78 තොගයක් ඊයේ (01දා) අත්අඩංගුවට ගත් බව මරදාන පොලීසිය පවසයි. >>P2

## 2021 පළමු මාස 3ට ඩෙංගු රෝගීන් 5,231ක්



● ඉන්දික හේවාවිතාරණ

මේ වසරේ පළමු මාස තුන තුළදී ඩෙංගු රෝගීන් පන්දහස් දෙසිය තිස්එකක් හා මීට අණ රෝගීන් එක්දහස් හත්සිය හතළිස් හතරක් වාර්තා වී තිබේ. >>P2



## “ප්‍රේමයෙන්, දයාවෙන් යුතු මානව හිතවාදී සමාජයකට පාස්කු සමය ආශීර්වාදයක් කරගනිමු” - ජනපති >>P5

## ආනයනික තෙල්වලට වෙනත් තෙල් මිශ්‍රකිරීම තහනම් >>P3




හෙළ බොදු ආණ්ඩුවෙ තිබු ඇඳිවතද ඉරා
කියනව ඇමතියෙක් නැතුවම හැංගි හොරා
පරසිඳු ප්‍රදේශෙක ඇති කටුකම්බි සුරා
ඉඩ දෙමු තියා ගන්නට හීනියට පෙරා

~~~~~~~~~~~~~ප්‍රියන්ත කොඩිප්පිලි

## සිංහරාජය ඇතුළු වැසි වනාන්තර රකින රනිල්ගේ ජාතික ප්‍රතිපත්තිය 04දා

● නවෝද්‍යා පවනි

ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරය ඇතුළු වැසි වනාන්තර සහ රැම්සාර් තෙත් භූමි ඇතුළත් වනාන්තර සහ පරිසරය ආරක්ෂා කර ගැනීමේ ජාතික ප්‍රතිපත්තියක් හිටපු අග්‍රාමාත්‍ය සහ එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ලබන ඉරිදා (04දා) ඉදිරිපත් කිරීමට නියමිතය. >>P2

## දෙවැනි රැල්ලේ කෝවිඩ් පොකුර තුළින් රෝගීන් 88,035ක්

සමස්ත ආසාදිත සංඛ්‍යාව 92,903ක් දක්වා ඉහළට, සුව වූ පිරිස 89,407ක්, මරණ සංඛ්‍යාව 571ක්

>>P2


Cargills food city

මේ අලුත් අවුරුද්දේ රට පුරා අඩුම මිල



රු.99
සුදු සීනි
1kg

මෙම දීමනාව ලබාගැනීම සඳහා අනෙකුත් භාණ්ඩ වල අවම බිල් පත් වටිනාකම රු. 300/- විය යුතුයි.
උපරිම 5kg දක්වා පමණයි.
2021 අප්‍රේල් 08 දක්වා වලංගු වේ. කොන්දේසි සහිතයි.

Cargills SINCE 1844
Cargills food city ගෙදර යන ගමන්



රිදී TV
(චැනල් අංක 18)

අමරණීය මතක




ජැක්සන් ඇන්තනි ප්‍රත්‍යාවලෝකන සිනමා දැක්ම

මාර්තු 30 සිට අප්‍රේල් 5 දක්වා සවස 3:00 ට

ඕනෑම තැනක සිට MOVIES + LIVE TV ඔස්සේද නැරඹිය හැක

මසකට රු. 49/- | දිනකට රු. 4/- (බදු සහ කොන්දේසි අදාළ වේ.)

Activate කිරීමට ON<හිස්තැනක්>Dialog Television ගිණුම් අංකය<හිස්තැනක්>18 Type කර 0770 679 679ට SMS කරන්න

ශ්‍රී ලංකාවේ අංක 1 ටෙලිවිෂන් රසාස්වාදය

Dialog TELEVISION
~~~~~~~~~~~~~

## කාලගුණය

**උපරිම උෂ්ණත්වය**
36°C
අනුරාධපුරය/ ත්‍රිකුණාමලය

**අවම උෂ්ණත්වය**
11°C
නුවරඑළිය

**වැසි තත්ත්වය**
බස්නාහිර පළාතෙත් ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල හැරුණු විට දිවයින වටා වැසි රහිත කාලගුණ තත්ත්වයක් පවතී.

**මීදුම් තත්ත්වය**
බස්නාහිර/ මධ්‍යම/ සබරගමුව පළාත්වල උදෑසන කාලයේදී මීදුම් තත්ත්වයක් ඇති විය හැකිය.

**සුළං තත්ත්වය**
උතුරු/ උතුරුමැද පළාත් හා පුත්තලම දිස්ත්‍රික්කයේත් පැ.කි.මී.40 දක්වා තරමක් තද සුළං ඇතිවිය හැකිය.

**මුහුදේ සුළං තත්ත්වය**
ගාල්ල සිට හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල වැසි ඇතිවිය හැක.

අද

## කර්තෘ මණ්ඩලය

ලිපිනය:
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

දුරකථන:
2479670, 2479671

ෆැක්ස්:
2479668

විද්‍යුත් තැපෑල:
ada@wijeya.lk / adanewspaper@gmail.com

වෙළෙඳ දැන්වීම් අංශය:
011 2479 830

බෙදාහැරීමේ අංශය:
011 2479 625

දායකත්ව අංශය:
011-2479 626

අද

## පාඨක අයිතීන් සුරැකීම

**අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.**

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති.
පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්,
**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම** වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.




**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම**
Press Complaints of Sri Lanka

**96, කිරුළ පාර, කොළඹ 05.**

| | |
|---|---|
| දුරකතනය | 5353635 |
| ෆැක්ස් | 5335500 |
| ඉමේල් | pccsl@pccsl.lk |
| වෙබ් | www.pccsl.lk |

FOLLOW US
facebook.com/ada.daily/
twitter.com/adha_news
instagram.com/adanewspaper/

## අද CARTOON




# දෙවැනි රැල්ලේ කෝවිඩ් පොකුර තුළින් රෝගීන් 88,107ක්

## සමස්ත ආසාදිත සංඛ්‍යාව 92,903ක් දක්වා ඉහළට, සුව වූ පිරිස 89,407ක්, මරණ සංඛ්‍යාව 571ක්

● ඉන්දික හේවාවිතාරණ

බන්ධනාගාර, පෑලියගොඩ හා දිවුලපිටිය 'කෝවිඩ්-19' පොකුර තුළින් ඊයේ (01දා) දිනයේදී රෝගීන් 197ක් වාර්තා වීමත් සමග එම පොකුරු තුළින් වාර්තා වන සමස්ත රෝගීන්ගේ සංඛ්‍යාව 88,107ක් දක්වා ඉහළ ගොස් ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත කෝවිඩ්-19 රෝගීන්ගේ සංඛ්‍යාවද 92,903ක් දක්වා ඉහළ ගොස් තිබෙන අතර, සුවය ලැබූ පිරිස 89,407කි. මේ දක්වා කෝවිඩ්-19 හේතුවෙන් සිදුව ඇති මරණ සංඛ්‍යාව 571කි.

## පළමු පිටුවෙන්...

## රු. කෝටියක මත්කුඩු මරදානේදී...

කොළඹ මධ්‍යම කොට්ඨාස දූෂණ මර්දන ඒකකයට ලද තොරතුරක් අනුව, උපපොලිස් පරීක්ෂක අසේල මහතා ඇතුළු කණ්ඩායමක් විසින් මෙම මත්කුඩු තොගය සොයාගෙන තිබේ.

ඩොල්ෆින් මාළුවෙකුගේ සලකුණක් සහිතව මෙම මත්කුඩු තොගය පාර්සල් පහක් තුළ අත්අඩංගුව තිබේ.

මෙම මකුළු සලකුණු සහිතව බෙදාහරින ජාවාරම්කරුවකු හඳුනාගැනීම සඳහා කොළඹ මධ්‍යම කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ සහ මරදාන පොලීසිය ඒකාබද්ධව පරීක්ෂණ පවත්වයි.

සිද්ධිය සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිලන්ත චන්ද්‍රසේකර, සමරකෝන් බණ්ඩා මහත්වරුන්ගේ උපදෙස් මත කොළඹ මධ්‍යම කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ධම්මික පෙරේරා, උපපොලිස් පරීක්ෂක අසේල, මරදාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නලින් ජයසුන්දර, අපරාධ අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩී.එම්.සී. රත්නකුමාර මහත්වරුන් ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

## රවි ඇතුළු පිරිසට නඩු දෙකෙන්ම ඇප...

හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතාට අමතරව මෙලෙස ඇප නියම වූයේ පර්පචුවල් ට්‍රෙෂරීස් සමාගමේ සභාපති ජෙෆ්රි ඇලෝසියස් එහි අධ්‍යක්ෂ අර්ජුන් ජෝශප් ඇලෝසියස්, එහි ප්‍රධාන විධායක නිලධාරී කසුන් ඕෂධී පළිසේන, එම සමාගමේ සේවකයන් වන චිත්‍රා රංජන් හුලුගල්ල, මුත්තුරාජා සුරේන්ද්‍රන්, මහ බැංකු නිලධාරීන් වන එස්. පදුමනාභන් සහ ඉන්දික සමන් කුමාර නමැත්තන්ටය.

2016 මාර්තු 31 වැනිදා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේදී රජයට රුපියල් කෝටි 1500ක පමණ පාඩුවක් සිදුකළ බවට විත්තිකරුවන්ට එරෙහි නඩුව ඊයේ පෙරවරුවේ අමල් රණරාජා (සභාපති), නාමල් බලල්ලේ සහ ආදිත්‍ය පටබැඳි යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණයේ විනිසුරු මඬුල්ල හමුවේ කැඳවනු ලැබූ අවස්ථාවේදී මුලින්ම විත්තිකරුවන්ට ඇප නියම කෙරිණි.

2016 මාර්තු 29වැනිදා සිදු කළ බැඳුම්කර වෙන්දේසියේදී රුපියල් බිලියන 36.89ක් බැඳුම්කර සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම මඟින් රජයට පාඩු සිදු කිරීම යටතේ පවරා තිබූ නඩුව ඊයේ පස්වරුවේ දමිත් තොටවත්ත (සභාපති), මංජුල තිලකරත්න සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණයේ විනිසුරු මඬුල්ල හමුවේ කැඳවනු ලැබූ අවස්ථාවේදී දෙවැනි වතාවට විත්තිකරුවන්ට ඇප නියම කෙරිණි.

2016 මාර්තු මස 12 වැනිදාත් මාර්තු මස 03 වැනිදාත් අතර කාලයේ කොළඹදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකළ භාණ්ඩාගාර බැදුම්කර නිකුතුවේදී භාණ්ඩාගාර බැඳුම්කර වංචා කිරීම සඳහා පොදු අරමුණක් සහිතව කටයුතු කිරීම ඒ අනුව 2016 මාර්තු 31 වැනිදා ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කළ බැදුම්කර වෙන්දේසියේදී රුපියල් බිලියන 15ක් බැඳුම්කර සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම, එමඟින් රජයට පාඩු සිදු කිරීම, ඒ සඳහා ආධාර අනුබලදීම ඇතුළු චෝදනා යටතේ විත්තිකරුවන්ට එරෙහිව නීතිපතිවරයා විසින් විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුලු දෙකක වෙන වෙනම නඩු පවරා ඇත.

එම නඩුවලදී විත්තිකරුවන්ට ඇප නියම කරන ලෙස ඔවුන්ගේ නීතිඥවරුන් වෙන වෙනම දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කළ අතර, පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක හා නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරු කරුණු ඉදිරිපත් කරමින් විත්තිකරුවන්ට ඇප නොදෙන ලෙස ඉල්ලීම් කළහ.





2016 මාර්තු 31 වැනිදා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේදී රජයට රුපියල් කෝටි 1500ක පමණ පාඩුවක් සිදුකළ බවට විත්තිකරුවන්ට එරෙහි නඩුවේ දෙපාර්ශ්වය විසින් දීර්ඝ වශයෙන් ඉදිරිපත් කළ කරුණු සලකා බැලූ අමල් රණරාජා (සභාපති), නාමල් බලල්ලේ සහ ආදිත්‍ය පටබැඳි යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණ විනිසුරු මඬුල්ල විත්තිකරුවන් ඇප මත මුදාහැරීමට ඒකමතිකව තීරණය කළේය.

ඒ අනුව රුපියල් ලක්ෂ 10 බැගින් වන මුදල් හා රුපියල් ලක්ෂ 100 බැගින් වන ඇපකරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත ඇප මත විත්තිකරුවන් මුදාහැරීමට නියම කළ විනිසුරු මඬුල්ල නඩු විභාගය අවසන් වනතුරු විත්තිකරුවන්ට විදේශගත වීම තහනම් කරමින් ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍ර අධිකරණයට භාරදීමටද නියම කළේය.

මෙම සංකීර්ණ නඩු කටයුත්ත සඳහා සූදානම් වීමට මෙන්ම සාධාරණ නඩු විභාගයක් ලබාගැනීමට විත්තිකරුවන්ට ඇති අයිතිය සුවිශේෂී කරුණු වශයෙන් සැලකිල්ලට ගත් විනිසුරු මඬුල්ල ඔවුන්ට ඇප නියම කළේය.

2016 මාර්තු 29වැනිදා සිදු කළ බැඳුම්කර වෙන්දේසියේදී රුපියල් බිලියන 36.89ක බැඳුම්කර සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම මඟින් රජයට පාඩු සිදු කිරීම යටතේ පවරා තිබූ නඩුව ඊයේ පස්වරුවේ දමිත් තොටවත්ත (සභාපති), මංජුල තිලකරත්න සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණයේ විනිසුරු මඬුල්ල විත්තිකරුවන් ඇප මත මුදාහැරීමට බහුතර තීන්දුවෙන් තීරණය කළේය.

ඒ අනුව රුපියල් ලක්ෂ 10 බැගින් වන මුදල් හා රුපියල් ලක්ෂ 50 බැගින් වන ඇපකරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත ඇප මත විත්තිකරුවන් මුදාහැරීමට නියම කළ විනිසුරු මඬුල්ල නඩු විභාගය අවසන් වනතුරු විත්තිකරුවන්ට විදේශගත වීම තහනම් කරමින් ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍ර අධිකරණයට භාරදීමටද නියම කළේය.

ඇප කොන්දේසි කඩ කළ බවට හෝ පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ට බලපෑම් කළ බවට පැමිණිලි ලැබුණහොත් විත්තිකරුවන්ගේ ඇප අවලංගු කොට රිමාන්ඩ් භාරයේ රඳවා තැබීමටද විනිසුරු මඬුලු දෙකෙන්ම නියම කෙරිණි.

දමිත් තොටවත්ත, මංජුල තිලකරත්න සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන විනිසුරුවරුන් තිදෙනා වෙන වෙනම තීන්දු තුනක් ප්‍රකාශයට පත් කළ අතර මහාධිකරණ විනිසුරු මංජුල තිලකරත්න මහතා සිය තීන්දුව ප්‍රකාශයට පත් කරමින් අපරාධ නඩු විධාන සංග්‍රයේ 450 (6) වගන්තිය යටතේ විත්තිකරුවන්ට ඇප නියම කිරීමට මෙම අධිකරණයට බලයක් නොමැති හෙයින් ඔවුන් රිමාන්ඩ් භාරයට පත් කළ යුතුයැයි සඳහන් කළේය.

දමිත් තොටවත්ත සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන විනිසුරුවරුන් දෙදෙනා වෙන වෙනම සිය තීන්දු ප්‍රකාශයට පත් කරමින් විත්තිකරුවන්ගේ ඇප ඉල්ලීම් සලකා බැලීමට මෙම අධිකරණයට බලය ඇතැයි සඳහන් කළහ.

මහාධිකරණ විනිසුරු දමිත් තොටවත්ත මහතා විත්තිකරුවන් අධිකරණයේ පෙනී සිටීම සුවිශේෂී කරුණක් වශයෙන් සිය තීන්දුවේ සඳහන් කළ අතර, මහාධිකරණ විනිසුරු මොහොමඩ් ඉර්ෂඩීන් මහතා මෙතෙක් නඩු විභාගය ආරම්භ නොවීම හා මෙම නඩුවේ ඇති විශාල ලේඛන තොගය සුවිශේෂී කරුණක් වශයෙන් සිය තීන්දුවේ සඳහන් කරමින් විත්තිකරුවන්ට ඇප නියම කිරීමට තීරණය කළේය.

ඒ අනුව විත්තිකරුවන්ට නඩු දෙකෙන්ම ඇප නියම වූ අතර, මෙම නඩු අප්‍රේල් 29 හා මැයි 11 වැනි දිනවල කැඳවීමට නියම කෙරිණි.

විත්තිකරුවන් වෙනුවෙන් ජනාධිපති නීතිඥ ෆායිස් මුස්තාපා, ජනාධිපති නීතිඥ ශ්‍රවේන්ද්‍ර ප්‍රනාන්දු, ජනාධිපති නීතිඥ ගාමිණී මාරපන, ජනාධිපති නීතිඥ නවීන් මාරපන, ජනාධිපති නීතිඥ අනිල් සිල්වා, ජනාධිපති නීතිඥ සම්පත් මෙන්ඩිස් යන මහත්වරු පෙනී සිටියහ.

පැමිණිල්ල වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ ලක්මිණී ගිරිහාගම මහත්මිය, රජයේ නීතිඥ උදාර කරුණාතිලක මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් හරිප්‍රියා ජයසුන්දර මහත්මිය සමග අතිරේක සොලිසිටර් ජනරාල් ප්‍රියන්ත නාවාන මහතා පෙනී සිටියේය.

## සිංහරාජය ඇතුළු වැසි වනාන්තර...

සිංහරාජය රකින හරිත වසරක් යන ප්‍රකාශයද මෙහිදී ඉදිරිපත් කිරීමට නියමිතය. එක්සත් ජාතික පක්ෂයේද වර්ණය වන කොළ පැහැය යොදා ගනිමින් ඉදිරියේදී රට පුරා වනාන්තර ඇතුළු පරිසර ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද සැලසුම් කර ඇති අතර, අනාගත එ.ජා.ප. රජයක් යටතේ කිසිවෙකුටත් බලපෑම් කළ නොහැකි පරිසර ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම පිළිබඳවත් රනිල් වික්‍රමසිංහ මහතා මෙහිදී සඳහන් කිරීමට අපේක්ෂිතය.

## සහරාන්ගේ මරාගෙන මැරෙන...

සහරාන් හෂීම්ගේ අන්තවාදී මතවාද වට්ස්ඇප් හරහා ප්‍රචාරය කිරීමේ චෝදනාව මත මෙම සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබේ .

මෙම පුද්ගලයන් දෙදෙනා කටාර් රාජ්‍යයේ රැකියා කරමින් සිටියදී අදාළ අන්තවාදී අදහස් ප්‍රචාරය කර ඇති අතර, මෙරටින් සිදු කළ ඉල්ලීමකට අනුව මෙම පුද්ගලයන් දෙදෙනා කටාර් රාජ්‍යයෙන් මෙරටට පිටුවහල් කර ඇති බවට තහවුරු වී තිබෙන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා සඳහන් කළේය.

ඒ මහතා සඳහන් කළේය.

මීට අමතරව මුතූර් ප්‍රදේශයේදී තවත් පුද්ගලයන් දෙදෙනෙකු ත්‍රස්තක්‍රියා විමර්ශන කොට්ඨාසය මගින් අත්අඩංගුවට ගෙන තිබෙන අතර, මෙම පුද්ගලයන් දෙදෙනා 2018 වසර අවසාන කාලයේදී සහරාන් හෂීම්ගේ මූලධර්මවාදී පන්ති පැවැත්වීමට පහසුකම් සැපයීමේ චෝදනාව මත අත්අඩංගුවට ගෙන තිබේ.

37හැවිරිදි හා 38හැවිරිදි වියේ පසුවන මෙම සැකකරුවන් දෙදෙනා මුතූර් ප්‍රදේශයේ තරුණයන්ට අන්තවාදය හා මූලධර්මවාදය පිළිබඳ යම් යම් පන්ති පවත්වා තිබෙන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේය.

මෙලෙස අත්අඩංගුවට ගත් සැකකරුවන් හතර දෙනාම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබාගෙන ඉදිරි පරීක්ෂණ සිදුකරන බවද ඒ මහතා පවසා සිටියේය.

## 2021 පළමු මාස 3ට...

ජනවාරි මාසයේදී ඩෙංගු රෝගීන් එක්දහස් හාරසිය අනූහයක් හා මීඋණ රෝගීන් හාරසිය හැත්තෑ නවයක් වාර්තා වී ඇත.

පෙබරවාරි මාසයේදී ඩෙංගු රෝගීන් එක්දහස් හත්සිය අනූහතරක් හා මීඋණ රෝගීන් හාරසිය තිහක් වාර්තා වී තිබෙන අතර, මාර්තු මාසයේදී ඩෙංගු රෝගීන් එක්දහස් අසූහතරක් හා මීඋණ රෝගීන් දෙසිය අසූනවයක් වාර්තා වී තිබේ.

මෙම මාස තුනක කාලය තුළදී වැඩිම ඩෙංගු රෝගීන් වාර්තා වී තිබෙන්නේ, මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වන අතර, එම දිස්ත්‍රික්කය තුළින් ඩෙංගු රෝගීන් දෙදහස් පන්සිය හතළිස් එකක් වාර්තා වී ඇත.

මීට අමතරව කොළඹ දිස්ත්‍රික්කයෙන් රෝගීන් හයසිය තිස්නවයක් හා ගම්පහ දිස්ත්‍රික්කයෙන් රෝගීන් තුන්සිය හතළිස් පහක් හා කළුතර දිස්ත්‍රික්කයෙන් රෝගීන් දෙසිය හතළිස් පහක් වශයෙන් සෑම දිස්ත්‍රික්කයකින්ම රෝගීන් වාර්තා වී තිබේ.

වැඩිම මීඋණ රෝගීන් ප්‍රමාණයක් වාර්තා වී තිබෙන්නේ, රත්නපුර දිස්ත්‍රික්කයෙන් වන අතර, එම දිස්ත්‍රික්කය තුළින් රෝගීන් දෙසිය අනූවක් මෙම මාස තුනක කාලය තුළ වාර්තා වී ඇත.

ගාල්ල දිස්ත්‍රික්කයෙන් රෝගීන් දෙසිය දාහතක් හා අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් රෝගීන් එකසිය තිස්නවයක් වශයෙන් ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකින්ම මීඋණ රෝගීන් වාර්තා වී තිබේ.

## ඉන්දීය අත්අඩංගුවට පත්වන...

මෙම කටයුතු සඳහා ඉන්ටර්පෝල් ශ්‍රී ලංකා ශාඛාවේ සහයෝගයක් ලබාගෙන තිබෙන අතර, අත්අඩංගුවට ගත් පිරිස් පිළිබඳ ඉන්දීය බුද්ධි අංශ හා ශ්‍රී ලංකාවේ බුද්ධි අංශ අතරත් තොරතුරු හුවමාරු කර ගැනීම සිදුකර ගැනීමට නියමිත බවද වාර්තා වේ. එසේම මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පසුගිය මාර්තු මාසයේදී ඉන්දීය වෙරළාරක්ෂක බළකා නිලධාරීන් විසින් මෙරටට අයත් යාත්‍රා හතරක් හා මෙරට පුද්ගලයන් විසිපස්දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබේ.

මෙම යාත්‍රාවල තිබී සොයාගත් හෙරොයින් මත්ද්‍රව්‍ය මෙරටට රැගෙන එමින් තිබූ බවට සැකයක් ඇතිවී තිබෙන අතර, මේ අනුව අදාළ හෙරොයින් තොග මෙරටට රැගෙන ඒමට කටයුතු කරනු ලැබුවේ නම්, එය ලබාගැනීම සිටි පිරිස් හඳුනා ගැනීම සඳහා පොලීසිය විශේෂය විමර්ශනයක් ආරම්භ කර තිබෙන බව පොලිස් මූලස්ථානය සඳහන් කරයි.

මීට අමතරව අදාළ මත්ද්‍රව්‍ය තොග මෙරටට එවීමට කටයුතු කළ පුද්ගලයන් හඳුනාගැනීමටත් විමර්ශනයකරන බවත්, මෙම කටයුතු ඉන්දීය වෙරළාරක්ෂක බළකාය හා එරටේ මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය සමග ශ්‍රී ලංකා පොලිස් මත්ද්‍රව්‍යනාශක කාර්යාංශය හා රාජ්‍ය බුද්ධි සේවයහා ශ්‍රී ලංකාවේ ඉන්ටර්පෝල් ශාඛාව කටයුතු කරමින් සිටින බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා සඳහන් කළේය. පසුගිය මාර්තු 05වැනිදා ඉන්දියාවේ වෙරළාරක්ෂක බළකාය විසින් මිනිකොයි දූපත ආසන්න ප්‍රදේශයේදී මෙරටට අයත් ධීවර යාත්‍රාවක් අත්අඩංගුවට ගෙන තිබෙන බවත්, එම යාත්‍රාව හලාවත ප්‍රදේශයේ මුහුදු ගොස් තිබෙන බවත් පවසා සිටි හෙතෙම, යාත්‍රාව තුළ පුද්ගලයන් හයදෙනෙකු සිට තිබෙන බවද සඳහන් කළේය.

එම යාත්‍රාවේ හෙරොයින් කිලෝ දෙසියයක් තිබූ බවට වාර්තා වන බවත්, ඉන්දීය වෙරළාරක්ෂක බළකා නිලධාරීන් අදාළ සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට යන අවස්ථාවේදී හෙරොයින් තොගය මුහුදට දමා තිබෙන බවට වාර්තාවන බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

ඉන්දීය වෙරළාරක්ෂක බළකා නිලධාරීන් විසින් මාර්තු 15වැනිදා මිනිකොයි දූපත ආසන්න ප්‍රදේශයේදී ශ්‍රී ලංකාවෙන් ධීවරයන් ලෙස මුහුදු ගිය යාත්‍රා තුනක් අත්අඩංගුවට ගෙන තිබෙනබවත්, එම යාත්‍රා තුන තුළ පුද්ගලයන් දහනවදෙනෙකු සිට තිබෙන බවත් ඒ මහතා සඳහන් කළේය.

මෙම යාත්‍රා තුනෙන් එකක තිබී හෙරොයින් කිලෝ තුන්සියක් සොයාගෙන තිබෙන බවත්, මීට අමතරව AK47 වර්ගයේ ගිනිඅවි පහක් සොයා ගෙන තිබෙන බවත් අජිත් රෝහණ මහතා ප්‍රකාශ කළේය.

රවිහංසි නමැති යාත්‍රාවේ තිබී හෙරොයින් හා ගිනිඅවි සොයා ගෙන තිබෙන බවත්,මෙම යාත්‍රා තුන තංගල්ල ප්‍රදේශයෙන් මුහුදු ගොස් තිබෙන බවත් හෙතෙම පැවසීය.

මෙලෙස අත්අඩංගුවට ගත් පිරිස් කවුරුන්ද යන්න සොයා බලන බවත්, ලංකාවේ දකුණු ප්‍රදේශයෙන් පසුගිය කාලයේ මත්ද්‍රව්‍ය තොග අත්අඩංගුවට ගත් බවත් ප්‍රකාශ කළ අජිත් රෝහණ මහතා, මෙම මත්ද්‍රව්‍ය තොග මුහුදු මාර්ගයෙන් මෙරටට ලැබෙන බවට තහවුරු වී තිබෙන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක සඳහන් කළේය.

මේ ආකාරයට මුහුදු මඟින් මත්ද්‍රව්‍ය රැගෙන එනජාලයේ ප්‍රධාන පුද්ගලයන් කිහිපදෙනෙකු මේ වනවිට හඳුනාගෙන තිබෙන බවත්, මෙම පිරිස් අත්අඩංගුවට ගැනීමට විමර්ශන පවත්වන බවත් හෙතෙම වැඩිදුරටත් පවසා සිටියේය.

**කළුගල් කැඩීමේ බලපත්‍රයක් නිකුත් කිරීමට රු. ලක්ෂ 06ක අල්ලසක් ඉල්ලා ලබාගත් බව කියන සිද්ධිය:**

# පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් සහ දොම්පේ ප්‍රා. සභා මන්ත්‍රීට එරෙහිව පවරා ඇති නඩුවෙන් ඔවුන් නිදහස්

## විත්තිකරුවන්ට එරෙහිව යළි නඩු පැවරීමට යටත්ව අල්ලස් කොමිසම නඩුවේ චෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගනී

● බුද්ධිමාල් රුබේරු

කළුගල් කැඩීමේ බලපත්‍රයක් නිකුත් කිරීමට රුපියල් ලක්ෂ 06ක අල්ලසක් ඉල්ලා ලබා ගත් බවට පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් ජයතිලක සහ දොම්පේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකුට එරෙහිව පවරා ඇති නඩුවෙන් ඔවුන් දෙදෙනා නිදහස් කිරීමට කොළඹ මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැඳි ඊයේ (01දා) නියම කළේය.

විත්තිකරුවන්ට එරෙහිව යළි නඩු පැවරීමට යටත්ව මෙම නඩුවේ චෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීමට පැමිණිල්ල වෙනුවෙන් පෙනීසිටි අල්ලස් කොමිසමේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ ගංගා හෙයියන්තුඩුව මහත්මිය කළ ඉල්ලීමක් පිළිගනිමින් විත්තිකරුවන් දෙදෙනා නිදහස් කිරීමට විනිසුරුවරයා නියෝග කළේය.

2012 නොවැම්බර් මස 12වැනිදාත් දෙසැම්බර් මස 05වැනිදාත් අතර කාලයේ දොම්පේදී අංක 567 දරන පිඹුර අනුමත කර කළුගල් කැඩීමේ බලපත්‍රයක් හා වෙළෙඳ බලපත්‍රයක් නිකුත් කිරීමට රුපියල් ලක්ෂ 07ක අල්ලසක් ඉල්ලා ඉන් රුපියල් ලක්ෂ 06ක අල්ලසක් ලබාගන්නා ලදැයිද ඒ සඳහා ආධාර හා අනුබල දෙන ලදැයිද අල්ලස් කොමිසම විත්තිකරුවන්ට එරෙහිව නඩු පවරා තිබිණි.

මෙලෙස චෝදනා ලැබ සිටින්නේ, දොම්පේ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති මෙන්ම ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් සජිත් ජයතිලක සහ දොම්පේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු වන අජිත් සිසිර කුමාර නමැත්තන්ය.

විත්තිකරුවන්ට එරෙහිව නඩු පවරා ඇත්තේ, අල්ලස් කොමිසමේ කොමසාරිස්වරුන් තිදෙනාගේම අත්සන් සහිතව නොවන හෙයින් මෙම විත්තිකරුවන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා පත්‍ර දෝෂ සහිත බවට පෙන්වාදෙමින් විත්තිකරුවන් අභියාචනාධිකරණයෙන් කරන ලද ඉල්ලීමකට අනුව මෙම නඩුව විභාගයට ගැනීම වළකාලමින් තාවකාලිකව වාරණ නියෝගයක් නිකුත් කොට තිබූ අතර, නැවත නඩු පැවරීමට යටත්ව විත්තිකරුවන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති තාක්ෂණික දෝෂ සහිත චෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීමට පැමිණිල්ල අභියාචනාධිකරණයේදී එකඟතාව පළ කර තිබිණි.

ඒ අනුව මෙම නඩුව කොළඹ මහාධිකරණයේ කැඳවනු ලැබූ අවස්ථාවේදී පැමිණිල්ල වෙනුවෙන් පෙනීසිටි අල්ලස් කොමිසමේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ ගංගා හෙයියන්තුඩුව මහත්මිය කරුණු ඉදිරිපත් කරමින් අභියාචනාධිකරණයේදී එකඟතාවය අනුව නැවත නඩු පැවරීමට යටත්ව විත්තිකරුවන්ට එරෙහි චෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීමට අවසර ඉල්ලා සිටියාය.

පැමිණිල්ල වෙනුවෙන් කළ ඉල්ලීමට අවසර දෙමින් විත්තිකරුවන් දෙදෙනා නිදහස් කිරීමට විනිසුරුවරයා නියම කළේය.

පැමිණිල්ල වෙනුවෙන් අල්ලස් කොමිසමේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ ගංගා හෙයියන්තුඩුව මහත්මිය පෙනීසිටියාය.

විත්තිකරුවන් වෙනුවෙන් පෙනීසිටි නීතිඥ ශාලික ගුණවර්ධන මහතා සමග ජනාධිපති නීතිඥ නලීන් ලද්දුවහෙට්ටි මහතා පෙනීසිටියේය.




# සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 4,658ක්

● නවෝද්‍යා පවනි

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මේ වනවිට පුරප්පාඩු 4,658ක් පවතින බවට වාර්තා වන අතර, ප්‍රාථමික, අර්ධ ශිල්පීය සේවා ගණය බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත වී නොමැති බැවින් මෙම පුරප්පාඩු පිරවීම සිදු කළ නොහැකි වී තිබේ.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩල සංඛ්‍යාවෙන් දහයෙන් එකක ප්‍රමාණයක් මේ වනවිට පුරප්පාඩුව පවතින අතර, එය එම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට මෙන්ම අපේක්ෂිත ඉල්ලක සපුරා ගැනීමේදීද බාධාකාරී තත්ත්වයක් වී ඇති බවද වාර්තා වේ.

මේ වනවිට විවිධ ආරක්ෂක රාජකාරීන් සඳහා යොදවා ඇති ශ්‍රී ලංකා පොලිස් සේවයට අයත් නිලධාරීන් එම ආරක්ෂක රාජකාරීවලින් ඉවත් කර ඒ සඳහා සිවිල් ආරක්ෂක නිලධාරීන් යෙදවීමට සැලසුම් කර ඇත.

එමෙන්ම පුරාවිද්‍යා ස්ථානවල ආරක්ෂාව සඳහාද පොලිස් ස්ථානවල විශේෂ රාජකාරී සඳහාද, ඊට අමතරව අලිවැට ඉදිකිරීම හා නඩත්තු කිරීම සඳහාද සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යෙදවීමට රජය සැලසුම් කර ඇති බව වාර්තා වේ.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික, අර්ධ ශිල්පීය සේවා ගණයට අදාළ නව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරනු ලබන තෙක් දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු නව බඳවා ගැනීම් මගින් සම්පූර්ණ කිරීමට මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කර ඇති බවද වාර්තා වේ.

# මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ අඩුපාඩුකම් හඳුනා ගැනීම ගැන අගමැතිගේ යෝජනාව 05දා පාර්ලිමේන්තුවට

● දිනේෂ් සමරකෝන්

දැනට පවතින මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ නීතිරීතිවල අඩුපාඩුකම් හඳුනා ගැනීම සඳහා පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාවක් පත් කිරීමට අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් කර ඇති යෝජනාව ලබන 05වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙනු ඇත.

එම යෝජනාව එදින පස්වරුවේ සභාව කල් තැබෙන අවස්ථාවේදී සභානායක සහ විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත බව පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා පැවසීය. අදාළ පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව සාමාජිකයන් 15දෙනෙක්ගෙන් සමන්විත වන අතර, කථානායකවරයා විසින් තේරීම් කාරක සභාව පත් කිරීමෙන් පසු මාස 06ක් ඇතුළත තම නිර්දේශ ඉදිරිපත් කළ යුතු බව යෝජනාවේ සඳහන් වන බවද මහ ලේකම්වරයා සඳහන් කළේය. දැනට පවතින මැතිවරණ හා ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීතිරීතිවල පවතින අඩුපාඩු හඳුනාගැනීම සහ ඒ සම්බන්ධයෙන් වන සංශෝධන නිර්දේශ කිරීම මෙම කාරක සභාවේ වගකීම වේ.

# නිවාඩුවේ කොළඹ සිට ගමට යන අයගෙන් ගමට කෝවිඩ් අවදානමක්

## ආර්ථික කලාප ඉලක්ක කරගෙන PCR පරීක්ෂණ සිදුකරනවා

**- වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර**

● නදීශානි පතිරණ

අලුත් අවුරුදු නිවාඩුවේ කොළඹ සිට ගම්පළාත් බලා විශාල පිරිසක් පිටත්ව යන බැවින් නගරයේ සිට ගමට කෝවිඩ්-19 රෝගය ව්‍යාප්ත වීමේ අවදානමක් ඇති බව වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවසුවේය.

මේ හේතුවෙන් ආර්ථික කලාප ඉලක්ක කරගෙන අහඹු පී.සී.ආර්. පරීක්ෂණ සිදු කිරීම මේ දිනවල සිදුකරන බවද ඒ මහතා පැවසුවේය. කෝවිඩ් හා උත්සව සමය යන මැයෙන් ඊයේ (01දා) සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවැත්වූ මාධ්‍ය හමුවට එක්වෙමින් ඒ මහතා මේ බව කියා සිටියේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා,

"තව සති දෙකකින් අලුත් අවුරුදු උදාවෙනවා. අලුත් අවුරුදු නිවාඩුවේ කොළඹ සිට විශාල පිරිසක් ගම්වලට යනවා. විශේෂයෙන් ආර්ථික කලාපවල සේවය කරන අය. මේ පිරිස තුළ අහම්බෙන් හරි ආසාදිතයෙක් සිටියොත් ගම්වලට රෝගය යන්න පුළුවන්. ඒ නිසා අපි ඔවුන් ඉලක්ක කරගෙන අහඹු පරීක්ෂණ දිගින් දිගටම මේ දිනවල සිදුකරනවා. ඒ අනුව අපි අවසාන කෝවිඩ් රෝගියා හඳුනාගැනීම දක්වා අවශ්‍ය ප්‍රමාණයට ඉලක්කගතව හා විද්‍යානුකූලව හා තත්ත්වානුකූලව අවශ්‍ය පරීක්ෂණ සිදුකරනවා. ඒ වගේම අලුත් අවුරුද්දේදී අනවශ්‍ය ඒකරාශිවීම්වලින් තොරව අවුරුද්ද සමරනවා නම් අලුත් රැල්ලක් ඇතිවීම වළක්වාගන්න හැකියාවක් ලැබෙනවා. එයට සියලු දෙනාගේ උපකාර අපට ලැබෙයි කියලත් බලාපොරොත්තු වෙනවා." යැයි කියා සිටියේය.

මෙරට දෛනික කෝවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව අඩු අගයක් ගැනීමට හේතු වී ඇත්තේ පී.සී.ආර්. පරීක්ෂණ අඩු කිරීම නිසා බවට වන අදහස් පිළිබඳ ඔහු කියා සිටියේ පීසීආර් පරීක්ෂණ හිතාමතා අඩුකර නොමැති බවත්, රෝගීන් අඩු වීම හේතුවෙන් පරීක්ෂණවලට ලක් කළ යුතු ආශ්‍රිතයන් ගණන අඩු වී ඇති බවත්ය. එසේම දිගින් දිගටම අහඹු පී.සී.ආර්. පරීක්ෂණ සිදු කෙරෙන බවද ඒ මහතා පැවසීය.

"කෝවිඩ්-19 ආසාදිතයන් හඳුනාගැනීම සඳහා සිදුකරන පී.සී.ආර් පරීක්ෂණ අඩු කර නැහැ. අපට රෝගීන් වාර්තා වීම අඩු වනවිට එම ආසාදිතයන්ගේ ආශ්‍රිතයන් වාර්තා වෙන්නෙත් අඩු අගයකයි. අපි බැලුවොත් රෝගීන් 1000ක් ඉඳලා ඒ එක් රෝගියෙකුට ආශ්‍රිතයන් පස්දෙනා බැගින් හිටියොත් අපට ආශ්‍රිතයන් වාර්තා වෙන්නේ 5000ක් පමණ. එවිට අපි මේ 5000ට පී.සී.ආර් පරීක්ෂණ සිදු කරනවා. නමුත් අපට රෝගීන් වාර්තා වෙන්නේ 500ක් නම් ඒ අනුව ආශ්‍රිතයන් සංඛ්‍යාවත් අඩු වෙනවා වගේම කරන්නට අවශ්‍ය වන පී.සී.ආර්. පරීක්ෂණ ගණනත් අඩු වෙනවා.

පී.සී.ආර් පරීක්ෂණ සිදුකිරීමේ අවශ්‍යතාව අඩුවෙලා නිසයි දෛනික පී.සී.ආර් පරීක්ෂණ ප්‍රමාණය අඩු වෙලා තිබෙන්නෙ. නමුත් අපි අහඹු ලෙස සිදුකරන පී.සී.ආර් පරීක්ෂණ අඩු කරලා නෑ. දිගින් දිගටම අවදානම් ස්ථානවල සිදු කරනවා. අපි යාපනයේ වෙළෙඳ පොළ දෙකක රෝගී පොකුරක් හඳුනාගත්තේ එලෙස සිදුකළ අහඹු පී.සී.ආර් පරීක්ෂණවලින්. ඒ අනුව පී.සී.ආර් පරීක්ෂණ අඩු නිසයි මේ රෝගීන් වාර්තා වීම අඩු වෙලා තිබෙන්නේ කියලා සැකයක් ඇති කරගන්න කිසිම අවශ්‍යතාවක් නැහැ.

මෙයින් කියන්නෙ නැහැ අපේ රට ඉතාම හොඳ තැනක ඉන්නවා කියලා. මොකද ඕනෑම අවස්ථාවක හඳුනානොගත් රෝගියෙක් හරහා ඕනෑම තැනක කොරෝනා පොකුරක් ඇතිවීමේ අවස්ථාව තිබෙනවා. ඒ නිසා අපේ රට සම්පූර්ණයෙන් මේ වසංගතයෙන් නිදහස් වෙනකන් අපි වගකීම් සහිතව හැසිරිය යුතුයි. සෞඛ්‍යාරක්ෂිත ක්‍රම දිගින් දිගටම අනුගමනය කිරීම අවශ්‍යයි" යනුවෙන්ද හෙතෙම කියා සිටියේය.

# පරිසරය හා වනජීවීන් ආරක්ෂා කරන ලෙස ඉල්ලා හෙට කොළඹදී විරෝධතාවක්

● ඉන්දික හේවාවිතාරණ

පරිසර සංහාරය නවතා දමා පරිසරයට වනජීවීන්ට ආරක්ෂාව ලබාදෙන ලෙස ඉල්ලා හෙට (03දා) පරිසර සංවිධාන සිවිල් සංවිධාන හා පරිසරයට ආදරය කරන පිරිස් විසින් කොළඹදී දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් පවත්වන බව පරිසර යුක්ති කේන්ද්‍රය සඳහන් කරයි.

රජයේ වැරදි ප්‍රතිපත්ති නිසා වනාන්තර හා වනජීවීන් තෙත්බිම් විනාශයන් සිදුවෙමින් තිබෙන බවත්, මීට අමතරව අනවසර වැලි කැණීම් නිසාත් විශාල පරිසර හානියක් සිදුවන බවත් එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ හේමන්ත විතානගේ මහතා පැවසීය.

පරිසරය වනය, වනජීවීන් ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන රාජ්‍ය නිලධාරීන්ට පවා මේ වනවිට විවිධ බලපෑම් සිදුවෙමින් තිබෙන බවත්, මේ නිසා මෙම ක්‍රියාවන් නවතා දමන ලෙසටත් බලධාරීන්ගෙන් ඉල්ලා සිටින බවත් ඒ මහතා පවසා සිටියේය.

මීට අමතරව දිගින් දිගටම අලි-ඇතුන් මරණයට පත් වෙමින් තිබෙන බවත්, මෙම තත්ත්වය නැති කිරීම සඳහා කඩිනමින් වැඩපිළිවෙළක් අවශ්‍ය බවත් විධායක අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

එසේම කොළඹ විහාර මහා දේවි උද්‍යානය අසලදී හෙට (03දා) සවස 3.00 පරිසර සංහාරයට එරෙහි විරෝධතාව පවත්වන බවත්, පරිසරයට වනයට වනසතුන්ට ආදරය කරන ඕනෑම අයෙකුට මෙම විරෝධතාවට සහභාගි විය හැකි බවත් හෙතෙම ප්‍රකාශ කළේය.

# 'දිනන රට පුබුදන කර්මාන්ත' වැඩසටහන යටතේ ආයෝජකයන් 22දෙනෙකුට ඉඩම් ප්‍රදානය කරයි



● නවෝද්‍යා පවනි

'දිනන රට පුබුදන කර්මාන්ත' වැඩසටහන යටතේ නව ආයෝජකයන් සඳහා කර්මාන්තපුරවල ඉඩම් ප්‍රදානය කිරීම සංකේතවත් කරමින් නව ආයෝජකයන් විසි දෙනෙකු සඳහා ඉඩම් කොටස් වෙන් කිරීමේ ලිපි ප්‍රදානය කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණි.

කර්මාන්තපුරවල ඉඩම් ප්‍රදානය කිරීම පසුගියදා කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පරිශ්‍රයේ ඕකිඩ් ශාලාවේදී සිදු විය.

නාගරික ප්‍රදේශවලට පමණක් සීමා වූ කර්මාන්ත සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමට ව්‍යාප්ත කිරීමත්, ප්‍රදේශයේ සම්පත්වලින් අගය එකතු කළ නිෂ්පාදන සහිත කර්මාන්ත ප්‍රාදේශීය මට්ටම වෙත ව්‍යාප්ත කිරීමත්, ග්‍රාමීය සේවා නියුක්තිය ඉහළ වැටුප් සහිතව සංවර්ධනය කිරීමත් දේශීය ආර්ථිකය ගෝලීය වශයෙන් ඉහළ තරගකාරී මට්ටමකට ගෙන ඒමත් සහ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ.

# ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂඥ කමිටුවේ නිර්දේශ ඇතුළත් වාර්තාව ජනපතිට

● නිදර්ශනී වික්‍රමසිංහ

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පත්කරන ලද විශේෂඥ කමිටුවේ නිර්දේශ ඇතුළත් වාර්තාව, එම කමිටුවේ සභාපති ඉන්ජිනේරු රොහාන් සෙනෙවිරත්න මහතා විසින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට භාර දී තිබේ.

ඒ අනුව එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කර ඇත.

මීට අමතරව මෙම විශේෂඥ වාර්තාවේ ඇති නිර්දේශ පිළිබඳ පූර්ණ පසු විපරමක නිරතවීමේ වැදගත්කම සම්බන්ධයෙන් අදාළ කමිටු සාමාජිකයන් හා විෂයභාර අමාත්‍යවරුන් සමග සාකච්ඡා කිරීමට ජනාධිපතිවරයා කටයුතු කර තිබේ. හෙතෙම එහිදී වැඩිදුරටත් පෙන්වා දී ඇත්තේ කසළ කළමනාකරණයේදී බාහිර පරිසර සාධක පිළිබඳ සැලකිලිමත් නොවීම හේතුවෙන් ජනතා විරෝධතා ඇතිවූ බවයි.

විධිමත් ලෙස කළමනාකරණය නොකරන ලද ඝණ අපද්‍රව්‍ය හේතුවෙන් පරිසරය සහ ජලය දූෂණය වීම, විවිධ රසායනික ද්‍රව්‍ය පසට එකතුවීම වැනි අහිතකර ප්‍රතිවිපාක රැසක් ඇති වේ. ඒ අනුව කසළ කළමනාකරණය පිළිබඳ ගැටලු හඳුනාගනිමින් ඊට විසඳුම් යෝජනා කිරීම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත සාමාජිකයන් 14දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් පසුගිය ජූලි මසදී පත් කරනු ලැබීය.

# නව සාමාන්‍යකරණයක් යටතේ අවුරුදු චාරිත්‍ර හා අවුරුදු ක්‍රීඩා පැවැත්වීමට අවස්ථාව

● නදීශානි පතිරණ

පසුගිය වර්ෂයේ මෙන් මේ වර්ෂයේද අවුරුදු සැමරීම නොකර සිටින ලෙස ජනතාවට උපදෙස් ලබාදිය නොහැකි බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය) විශේෂඥ වෛද්‍ය සුසී පෙරේරා මහත්මිය පැවසුවාය.

ඒ අනුව නව සාමාන්‍යකරණයක් යටතේ අවුරුදු චාරිත්‍ර හා අවුරුදු ක්‍රීඩා පැවැත්වීමට අවස්ථාව සලස්වාදෙමින් මාර්ගඋපදේශ සංග්‍රහයක් සකස් කර ඇති බවද ඒ මහත්මිය සඳහන් කළාය. අවුරුදු උත්සව හා අවුරුදු ක්‍රීඩා සංවිධානය කිරීම වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සකස් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහය කෝවිඩ් කාර්යය සාධක බළකාය රැස්වීමෙන් අනතුරුව ඊයේ (01දා) රාත්‍රියේ නිකුත් කිරීමට සූදානම් කර තිබෙන බවද වෛද්‍යවරිය පැවසුවාය. නව සාමාන්‍යකරණයකට යටත්ව පුද්ගල දුරස්ථභාවය රකිමින්, ශ්වසන ආචාර විධි අනුගමනය කරමින්, අත් සේදීම් සිදුකර, මුව ආවරණ පලඳමින් පැවැත්විය හැකි ක්‍රීඩා පිළිබඳ මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් කර ඇති බවද ඒ මහත්මිය සඳහන් කළේ, ඊයේ (01දා) සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවැත්වූ මාධ්‍ය හමුවට එක්වෙමිනි.

"ගිය අවුරුද්දේ මේ කාලේ අපට රෝගය ගැන අවබෝධයක් තිබුණේ නැහැ. බයක් තිබුණා. නමුත් දැන් රෝගය ගැන අපි දන්නවා. දැන් මිනිසුන් තුළ හැසිරීම් රටාවක් ඇති වී තිබෙනවා. අනුගමනය කළ යුතු ක්‍රමවේද දන්නවා. ඒ දැනුම් සම්භාරය හා පළපුරුද්ද මතයි අපි මේ මාර්ගෝපදේශ ලබාදෙන්නේ. ඒ වගේම වෙළෙඳුම් ගැන මිනිසුන්ට බලාපොරොත්තු තියෙනවා. සමාජයීය වශයෙන් බලාපොරොත්තු තියෙනවා. ඒවත් සලකා බලා තමයි අපි මාර්ගෝපදේශ හැදුවේ. පසුගිය අප්‍රේල්වල විදිහට නොවෙයි අපි මේ අවුරුද්දේ අවුරුදු සමරන්න බලාපොරොත්තු වන්නේ. නමුත් මේ රෝගය අපේ රටෙන් තුරන් වෙලා නැහැ. අඩු වෙලා තිබ්බට අවදානම අපි අතරයි. කොයි වෙලාවේ පොකුරක් බිහිවෙයිද දන්නේ නැහැ. පොකුරක් නිර්මාණය වෙලා පාලනය කරගන්න බැරිව අත්විඳපු තත්ත්වවලට අපි මුහුණ දුන්නා. නමුත් අපට මේ අවුරුදු සමය ගත කරද්දී අපට හැමදේම නතර කරන්න කියන්න බෑ. ඒ අනුව අපට කරන්න පුළුවන් මොනවද බැරි මොනවද කියන එක අපි සොයා බලන්න ඕන. නිවසේ සිට පවුලක් විදිහට අවුරුදු චාරිත්‍ර අපට කරන්න පුළුවන්. නමුත් ඒවා ගැන මිනිස්සු අහන්නෙත් නෑ. අපෙන් අහන්නේ සැනකෙළි, සංගීත සංදර්ශන පවත්වන්න, අවුරුදු කුමාරි තෝරන්න පුළුවන්ද කියලයි. අපි බුද්ධිමත්ව බැලුවොත් නව සාමාන්‍යකරණයකට මේ වෙලාවේ අපට යන්න වෙනවා. ඒ අනුව අපට පුරුදු අවුරුදු චාරිත්‍රවලට වඩා අවුරුදු ක්‍රීඩාවලදී නව සාමාන්‍යකරණයකට යන්න වෙනවා. ඒ අනුව දුරස්ථභාවය, ශ්වසන ආචාර විධි, අත් සේදීම, මුව ආවරණ පැලඳීම යන සෞඛ්‍ය නිර්දේශ ගැන බැලුවම මේවා අනුගමනය කරමින් පවත්වන්න පුළුවන් ක්‍රීඩා තිබෙන බව පේනවා.

ඒ වගේම අපි ගත්තොත් අපට කරන්නම බැරි ක්‍රීඩා කිහිපයක් අපි මාර්ගෝපදේශවල සඳහන් කර තිබෙනවා. කඹ ඇදීම, කොට්ටාපොර ගැසීම, සංගීත සංදර්ශන පැවැත්වීම, සැනකෙළි පැවැත්වීම, ඇස් බැඳීම සඳහා එකම රෙදිකඩක් භාවිත කරන ක්‍රීඩාවලට අවස්ථාව ලබාදිය නොහැකියි. නමුත් විශාල ජනකායක් රැස් නොවෙන ලෙස කුඩා අවුරුදු උත්සව පවත්වන්නට අදාළ නිර්දේශ අපි මෙහි සඳහන් කර තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය විදිහට අපි කියන්නේ මේ සියලු දේවල් නවත්වන්න කියලා නොවෙයි. අදාළ ක්‍රමවේද අනුගමනය කර තම තමන්ගේ යුතුකම් හා වගකීම් ඉටුකරමින් මේ උත්සව පවත්වන ලෙසයි. නමුත් තමන්ගේ යුතුකම් පැහැර හැරියොත් සිදුවන්නේ ලොකු විනාශයක් නිසයි අපි අවුරුදු ක්‍රීඩා සංවිධානය කරනවා නම් ඒවා කොහොමද කරන්නේ ක්‍රීඩාවලට සහභාගි වෙනවා නම්, ඒවා සිදුකරන ආකාරය හා ඒවා නරඹනවා නම් ඒවා සිදුකළ යුතු ආකාරය පිළිබඳ මාර්ගඋපදේශ නිකුත් කළේ" යනුවෙන් වෛද්‍යවරිය සඳහන් කර සිටියාය.

කුඩා පිරිසක් එක් කරගෙන සෞඛ්‍ය නිර්දේශවලට අනුගතව සංවිධානය කරන අවුරුදු උත්සව සඳහා අවසර ලබාදීම් මෙන්ම එම උත්සව අධීක්ෂණය කිරීමේ බලය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට හා පොලිස් නිලධාරීන්ට ලබාදී ඇති බවද මෙහිදී ඇය සඳහන් කළ අතර, තමන්ගේ ගම තමන් රැකගනිමින් මේ සියලු කටයුතු සංවිධානය කිරීම සිදුවිය යුතු බවද අවධාරණය කළාය.

# ආනයනික තෙල්වලට වෙනත් තෙල් මිශ්‍ර කිරීම තහනම්

● නිදර්ශනී වික්‍රමසිංහ

ආනයනය කෙරෙන පොල්තෙල් ඇතුළු අනෙකුත් තෙල් වර්ගවලට තවත් තෙල් වර්ග මිශ්‍ර කිරීම තහනම් කරමින් නව ගැසට් නිවේදනයක් නිකුත් කරන ලෙස වෙළෙඳ අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා විසින් පාරිභෝගික කටයුතු පිළිබද අධිකාරියට ඊයේ (01දා) උපදෙස් දී තිබේ.

ඒ අනුව ආනයනික තෙල්වලට තවත් තෙල් වර්ග මිශ්‍ර කිරීමට අවසර දෙමින් 2016 වර්ෂයේදී නිකුත් කර ඇති ගැසට් නිවේදනය අවලංගු කිරීමට කටයුතු කෙරෙනු ඇත. 2016 වසරේදී නිකුත් කරන ලද මෙම ගැසට් නිවේදනයට අනුව ආනයනික තෙල්වලට තවත් තෙල් මිශ්‍ර කරන්නේ නම් ඒ බව නිෂ්පාදිතයට අදාළ ලේබලයේ සඳහන් කළ යුතුය.

# ඉදිරි මාස 03 තුළ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත සියලු පනත් අධිකරණ අමාත්‍යාංශයට අදාළ ඒවායි

## - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සභාපති, අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී.එල්.පීරිස්

● නිදර්ශනී වික්‍රමසිංහ

ඉදිරි මාස 03 තුළදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත සියලු පනත් අධිකරණ අමාත්‍යාංශයට අදාළ ඒවා බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සභාපති, අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා ප්‍රකාශ කළේය.

අමාත්‍යවරයා මේ බව ප්‍රකාශ කර සිටියේ බත්තරමුල්ල වෝටර්ස්එජ් පරිශ්‍රයේදී පැවැති ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු කොළඹ දිස්ත්‍රික් නීතිඥ සංගමයේ සමුළුව අමතමිනි.

ඒ අනුව රටේ නීති පද්ධතියේ අවශ්‍ය වෙනස්කම් සඳහා මඟපෙන්වීමට නීතිඥයන්ට හැකියාව ඇති බව පෙන්වා දුන් සභාපතිවරයා එහිදී වැඩිදුරටත් සිය අදහස් දක්වමින්,



"ජිනීවා යෝජනාව සම්මතවෙලා පැය 12ක් යන්නටත් පෙර ශ්‍රී ලංකාව පිළිබඳ සොයන්නට අවශ්‍ය යාන්ත්‍රණය සඳහා නව තනතුරු 13කට අයදුම්පත් කැඳවා තිබුණා. මේ අතරේ මානව හිමිකම් කොමිසමේ ලේකම්තුමා ප්‍රසිද්ධියේම පැවසුවේ ඒ දේවලට සල්ලි ඔවුන් සතුව නැහැ කියලා. ඇන්ටන් ගෑෂ් වාර්තාව හදන්නට ලන්ඩනයේ හෝ වෙනත් රටවල සිට ලංකාවටවත් නොපැමිණ කටයුතු කරලා තිබෙන්නේ. ඒවා සම්මත කරලා රටට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නවා.

ඒ වගේම ඒ වාර්තාවේ කියනවා මීට ඉදිරිපත් කරපු සාක්ෂි අවුරුදු 20ක් වනතුරු බලන්නට නොදෙන බව. ඒ සියල්ල හංගනවා. මුහුණක් නැති හඬක් නැති අයගේ කටින් පිටවන දේට අනුව කටයුතු කරන්න උත්සාහ කරනවා. මේවා සාධාරණත්වයට අනුකූල නැහැ. ඇඩෙලා බාලසිංහම් කිසිදු ගැටලුවකින් තොරව සැප විඳිනවා. ඒ අතර ගෑෂ් ඇ.ඩො. මිලියන 2.8ක් විදයම් කරනවා සත්‍ය සොයන්න කියලා. ඒ නිසා රටට විරුද්ධව තිබෙන මේ කුමන්ත්‍රණ පරාජය කරන්නට අපි රටක් ලෙස එකතු විය යුතුයි.

ජිනීවා මානව හිමිකම් යෝජනා සම්බන්ධයෙන් මාධ්‍ය ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් සමගි ජන බලවේගයේ මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා පවා මේ සම්බන්ධයෙන් අදහස් දක්වලා පැවසුවා මේ වාර්තාවල තිබෙන සියල්ල අපට හෙළි කළ යුතු යි කියලා. එහි විනිවිදභාවයක් තිබිය යුතු යි කියලා. එය නිවැරදියි, රට වෙනුවෙන් විපක්ෂය පවා ඉදිරිපත් විය යුතු යි. අපි සියලු දෙනා එකතු වී මේ ගැටලුවට මුහුණදිය යුතු යි.

ඉදිරි මාස 03 තුළ පාර්ලිමේන්තුවට පැමිණීමට නියමිත පනත් සියල්ල අධිකරණ අමාත්‍යාංශයටයි එන්නේ. නීතිඥයන්ට හැකියාව තිබෙනවා අපේ රටේ නීති පද්ධතියේ අවශ්‍ය වෙනස්කම් සඳහා මඟපෙන්වීම් කරන්නට"යැයිද පවසා සිටියේය.

# කපා ඔපදැමූ මැණික් අපනයන වෙනුවට නිම කරනලද ස්වර්ණාභරණ නිෂ්පාදනය වැඩිකිරීමට කටයුතු කරනවා

## - සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග





● නවෝද්‍යා පවනි

කපා ඔප දමන ලද මැණික් අපනයනය වෙනුවට නිම කරන ලද ස්වර්ණාභරණ නිෂ්පාදනය වැඩි කිරීමට අපේක්ෂා කරන බව සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

විදේශිකයන් සඳහා ශ්‍රී ලංකාවේ උසස් වර්ගයේ මැණික් හා ස්වර්ණාභරණ මිලදී ගැනීමට අවශ්‍ය වෙළෙඳ පොළ දේශීය වශයෙන් ව්‍යාප්ත කිරීම තුළින් මෙරට මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳ පොළ මෙන්ම සංචාරක කර්මාන්තයද ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරන බවද රණතුංග මහතා සඳහන් කළේය.

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සාමාජික හමුව අමතමින් ඊයේ (31) අමාත්‍යවරයා සඳහන් කළේ ජාත්‍යන්තර වෙළෙඳ පොළෙහි ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ ඉල්ලුම ඉහළ ගොස් ඇති බවයි.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රණතුංග මහතා,

"මැණික් හා ස්වර්ණාභරණ කියන්නේ අපේ රටේ පැරණිතම අපනයන භාණ්ඩයයි. ඒ නිසා ලෝකය පුරා දේශීය මැණික් හා ස්වර්ණාභරණවලට හොඳ වෙළෙඳ පොළක් තිබෙනවා. ඒ හොඳ වෙළෙඳ නාමය රැකගැනීම අපේ වගකීමක්.

වාර්ෂිකව මෙරටට පැමිණෙන සංචාරකයන්ගෙන් වියදම් කිරීමේ හැකියාව සහිත සංචාරකයන් පැමිණෙන්නේ ලක්ෂ 15ක පමණ පිරිසක්. ආසියාතික රටවලින් පැමිණෙන සහ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් හැරුණු කොට වියදම් කිරීමේ හැකියාවක් සහිත මෙම සංචාරකයන් පිරිස ඉලක්ක කරගනිමින් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම මගින් ඩොලර් මිලියන 500ක පමණ විදේශ ආදායමක් ලැබිය හැකි බවයි ක්ෂේත්‍රයේ අය පවසන්නේ. මැණික් හා ස්වර්ණාභරණ සම්බන්ධයෙන් සංචාරක ආකර්ෂණය ඇති වන ආකාරයේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු බව මම විශ්වාස කරනවා. ඒ සඳහා ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න කියල ඉල්ලා සිටිනවා.

ඉදිරි වසර තුන ඇතුළත මෙරටට පැමිණෙන සංචාරකයන්ට අවශ්‍ය මැණික් හා ස්වර්ණාභරණ සැපයීම තුළින් ඩොලර් බිලියන 01ක මුදලක් මෙරට ආර්ථිකයට එකතු කිරීම පෙරදැරිව කටයුතු කරන ඔබේ සේවය හා කැපවීම, අධිෂ්ඨානය මම අගය කරනවා. අපේ රට කියන්නේ ඛනිජ සම්පත්වලින් සපිරුණු භූමියක්. මිල කළ හැකි මැණික් ගල් වර්ග 72ක් අපේ රටේ තිබෙනවා. ඩොලර් 100 සිට ඩොලර් ලක්ෂ තුන දක්වා වූ මුදලකට මේවා අලෙවි කිරීමේ හැකියාව අපට තිබෙනවා.

කපා ඔප දමන මැණික් අපනයනය වෙනුවට නිමකරන ලද ස්වර්ණාභරණ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අවශ්‍ය නූතන අධිතාක්ෂණික උපකරණ ආනයන බදුවලින් නිදහස් කිරීමටත් සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළ මගින් යෝජනා කරලා තියෙනවා" යැයිද සඳහන් කළේය.

# තෝරාගත් ව්‍යවසායකයන්ට Made in Sri Lanka ලාංඡනය ලබාදෙයි



● රොමේෂ් ධනුෂ්ක සිල්වා

ශ්‍රී ලංකාවේ ජාතික නිෂ්පාදන ක්‍රියාවලිය තුළ දේශීය නිෂ්පාදකයා සවිබල ගැන්වීමේ අරමුණින් කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් තෝරාගත් දේශීය ව්‍යවසායකයන් වෙත 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' (Made in Sri Lanka) ලාංඡනය ලබාදීම කොළඹදී සිදු කෙරිණි.

නිෂ්පාදනයේ දේශීයත්වය නිරූපණය කිරීම සඳහා මෙම නිෂ්පාදන කාණ්ඩ තුනක් යටතේ වර්ගීකරණය කරන අතර, ඉන් 100% ප්‍රමාණයක්, ශ්‍රමය, තාක්ෂණය, අමුද්‍රව්‍ය සහ මානව සම්පත් දේශීයව භාවිත කරන්නේ නම්, එය 100%ක් දේශීය නිෂ්පාදනයක් ලෙස සලකා මම නිෂ්පාදන සඳහා මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය පිරිනැමීම මෙහිදී සිදු කෙරේ.

එසේ තෝරාගත් ව්‍යවසායකයන් පනස්දෙනෙකුට නොමිලේ මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය පිරිනැමීම කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති අනුෂ්ක ගුණසිංහ මහතා ඇතුළු එම අධිකාරියේ නිලධාරීන් පිරිසක්ද මෙම අවස්ථාවට එක් වූහ.

# කුරුඳු තේ සහ ඉරමුසු පානය ජනතාවට හඳුන්වා දෙයි





● නිදර්ශනී වික්‍රමසිංහ

කොළඹ මහ නගර සභාවේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරන ලද කුරුඳු තේ සහ ඉරමුසු පානය ජනතාවට ඊයේ (01දා) හඳුන්වා දෙන ලදි.

ඒ අනුව මහ නගර සභාව සතු දේශීය ආයුර්වේද මධ්‍යස්ථාන 21 තුළදී රුපියල් 290ක් වැනි මුදලකට මෙම නිෂ්පාදන මිලට ගැනීමේ හැකියාව පවතියි. මීට අමතරව කොළඹ මහ නගර සභාවේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව මගින් කිරුළපන නිහාල් සිල්වා මාවතේදී අලුතින් ඉදිකරන ලද ආයුර්වේද මධ්‍යස්ථානයද ඊයේ විවෘත කරන ලදි.

මහල් 02කින් සමන්විත වන මෙම ගොඩනැගිල්ල සඳහා රුපියල් මිලියන 12ක මුදලක් වැය කර ඇති බවද මහ නගර සභාව සඳහන් කළේය.

# වැල්ලවත්තේ සිට බත්තරමුල්ල බෝට්ටු මගී සේවාව කෝවිඩ් හමුවේ ආරක්ෂිත මාර්ගයක්

## - ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති





● මොරටුව - රේබා තරංගනී ෆොන්සේකා

වැල්ලවත්තේ සිට බත්තරමුල්ල පරිපාලන කේන්ද්‍රස්ථානයට විනාඩි විස්සෙන් ළඟා වීමට හැකියාව ඇති මගී බෝට්ටු සේවාව කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේද එදිනෙදා ගමන් පහසුකම් සපයා ගැනීමට සුදුසු ආරක්ෂිත මාර්ගයක් යැයි ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති ජෙනරාල් (විශ්‍රාමික) එම්.ආර්.ඩබ්. සොයිසා මහතා පැවසීය.

මේ දිනවල එම බෝට්ටු සේවාව ඔස්සේ මගින් හයදෙනා බැගින් දුරස්තභාවය රැක ගනිමින් ප්‍රවාහනය කිරීමට පියවර ගෙන ඇති බවද ඒ මහතා සඳහන් කළේය.

එල්.ආර්.ඩී.සී. බෝට්ටු සේවය ලෙස නම් කර ඇති මෙම මගී බෝට්ටු සේවයෙන් දෛනිකව පාසල් දරුවන් සහ විවිධ සේවා ස්ථානයන් වෙත යන මගීන් ගමන් කරන අතර, ඔවුන් වෙනුවෙන් උදෑසන 6.30 සිට සවස 7.00 දක්වා ගමන් වාර දහයකින් යුතු බෝට්ටු සේවාවක් යොදවා ඇත.

සාමාන්‍යයෙන් වැල්ලවත්ත කලාපයේ සිට බත්තරමුල්ල දෙසට පෞද්ගලික රථයකින් ගමන් කළද අධික වාහන තදබදය හේතුවෙන් එම ගමන් මාර්ගය සඳහා විනාඩි 45ක් කාලය වැය වන අතර, මෙම බෝට්ටු සේවාව මගින් ඕනෑම අයෙකුට විනාඩි පහළොවක්, විස්සක් අතර කාලයකින් බත්තරමුල්ලට ළඟා වීමේ හැකියාව ඇති බව ඒ මහතා පැවසීය.

කොළඹ ප්‍රදේශය පුරා දිනපතා උදෑසන පවතින අධික මාර්ග තදබදයට විසඳුමක් ලෙස ආරම්භ කරනු ලැබූ මෙම බහු මගී බෝට්ටු සේවාව මේ වනවිට කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේද ගමන් පහසුකම් සපයා ගැනීමට විශේෂිත වූ ආරක්ෂිත ප්‍රවාහන සේවයක් බවද ඒ මහතා පැවසීය. එක් මගියෙකුට රුපියල් සියයක් වැනි මුදලක් වැය කරමින් නවමු අත්දැකීමකට මුහුණ දෙමින් ගමන් කළ හැකි මෙම සේවාව කෝවිඩ්-19 නීතිරීතිවලට අනුව වඩා කාර්යක්ෂමව සිදුකිරීමට මේ වනවිට පියවර ගෙන ඇති බවද එම්.ආර්.ඩබ්. සොයිසා මහතා වැඩිදුරටත් පැවසීය.

මෙම මගී බෝට්ටු සේවාව පෞද්ගලිකව වෙන් කර ගැනීමටද හැකියාව ඇති බවද සඳහන් කළ හෙතෙම, මෙම සේවාව පළපුරුදු නාවික හමුදා විශ්‍රාමික නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන හෙයින් ආරක්ෂාව පිළිබඳ බිය විය නොමැති බවද සඳහන් කළේය.

වැල්ලවත්තෙන් ගමන් ආරම්භ කොට බත්තරමුල්ල දක්වා යන ගමනේදී මගියෙකුට අවශ්‍ය නම්, නාවල ප්‍රදේශයෙන් ඇතුළුවිය හැකි වන ආකාරයට ඇති තොටුපොළෙන්ද ගොඩබිමට සේන්දු විය හැකි බවද ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

# රටේ වගකිව යුත්තන් සම්පූර්ණයෙන්ම අසමත් වී ඇති බව ජිනීවා යෝජනාවලින් හෙළිවෙනවා

## - සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරයේ සභාපති කරූ ජයසූරිය

● දිනේෂ් සමරකෝන්



ජිනීවා යෝජනාව මගින් රටට ඇති කළ හැකි ප්‍රතිඵල පිළිබඳ අප ගැඹුරු විමර්ශනයක් සිදුකළ බවත්, ඒ අනුව එහිදී රටේ වගකිව යුත්තන් සම්පූර්ණයෙන්ම අසමත් වී ඇති බවත් සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරයේ සභාපති කරූ ජයසූරිය මහතා පැවසීය.

ඒ අනුව වත්මන් රජය මෙරට තුළ මෙන්ම ජාත්‍යන්තරවද අසාර්ථකත්වය පෙන්නුම් කර ඇති බව කොළඹ ඊයේ (01දා) පැවති මාධ්‍ය හමුවකට එක්වෙමින් හෙතෙම සඳහන් කළේය.

මේ අතර ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද අප රට මෙතරම් දුර්වල කිරීමට 20වැනි සංශෝධනයද ප්‍රමුඛ හේතුවක් වූ බවත්, ඒ අනුව 20වැනි සංශෝධනය අහෝසි කළ යුතු වන බවත් සඳහන් කළ කරූ ජයසූරිය මහතා,

"අද අප සිර වී සිටින්නේ රට තුළ පමණක්ම නොවෙයි. ජාත්‍යන්තර වශයෙන්ද අද අප බරපතළ ලෙස කොටු වී තිබෙනවා. ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාව පිළිබඳ සම්මත වූ යෝජනාව ඒ බව හොඳින්ම කියාපානවා. ඒ ගැන අද ආණ්ඩුවේ පාර්ශ්වයන්ගෙන් නොයෙකුත් මත පළවනවා. මේ රට බිහි කරන ලද කෘතහස්ත රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ට ඒ පිළිබඳ වෙනස්ම වූ මතයක් තිබෙනවා. ඒ බව ඔවුන් ප්‍රසිද්ධියේම කියා තිබෙනවා. ඒ වගේම විපක්ෂයේ දේශපාලන කණ්ඩායම්ද ඒ පිළිබඳ වන ඔවුන්ගේ විග්‍රහයන් සිදුකරමින් සිටිනවා. නමුත් රටක් ලෙස අද අප මුහුණදී තිබෙන මේ ප්‍රශ්නයේ ඇති බැරෑරුම් බව මේ රටේ පාලකයන් නිවැරදිව තේරුම් ගෙන තිබෙනවා ද? අප රටේ ප්‍රතිරූපය, ගෞරවය හා අභිමානය ආරක්ෂා කර ගෙන තිබෙනවා ද?

අප මේ ගැන කතා කරන්නේ පාට කණ්ණාඩි දමාගෙන නොවෙයි. ලංකාවට අදාළව සම්මත වූ ජිනීවා යෝජනාව මගින් රටට ඇති කළ හැකි ප්‍රතිඵල පිළිබඳ අප ගැඹුරු විමර්ශනයක් කළා. ඒ වගේම විදේශ සේවයට සම්බන්ධ අප රට බිහි කළ කීර්තිමත් රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ද ඇතුළුව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ විශේෂඥවරුන්ගෙන්ද උපදෙස් ලබාගත්තා. ඒ සියල්ල දෙස ගැඹුරින් හා මැදිහත්ව බලන විට අපට ඉතාමත්ම පැහැදිලි ලෙසම කිව හැක්කේ අපේ රටේ වගකිව යුත්තන් එහිදීද සම්පූර්ණයෙන්ම අසමත් වී ඇති බවයි.

රට තුළ පමණක් නොව අද ජාත්‍යන්තර වශයෙන්ද ඔවුන්ගේ අසමාර්ථතාව ප්‍රදර්ශනය කර තිබෙනවා. ජිනීවාහිදී අපට මෙවැනි ඉරණමකට මුහුණදීමට සිදු වුයේ ඇයි? හේතුව ඉතාමත්ම පැහැදිලියි. අප රට සමග ඉතාමත්ම මිත්‍රශීලීව අතීතයේදී එක පෙළට සිට ගත් මිත්‍ර රාජ්‍යයන් බොහෝමයක් මෑත කාලයේදී අප විසින්ම අහිමි කරගෙන තිබීම ඊට හේතුවයි.

ඒ වගේම සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය ලෙස අප නැවත නැවතත් අවධාරණය කරන කරුණක් තිබෙනවා. එනම් ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද අප රට මේ තරම් දුර්වල කිරීමට 20වැනි සංශෝධනයද ප්‍රමුඛ හේතුවක් වූ බවයි. එමෙන්ම සිදුකර ඇති සමාජ සමීක්ෂණවලට අනුව මේ රටේ ජනතාවගෙන් 81%ක් පමණ 20වැනි සංශෝධනය අනුමත කරන්නේ නැහැ. මේ රටේ සියලු ආගම් නියෝජනය කරන ආගමික නායකයන්ගෙන් අතිබහුතරයක් 20වැනි සංශෝධනය පිළිගන්නේ නැහැ. ඒ නිසා ශ්‍රී ලංකාව නැවත ශක්තිමත් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය වෙත යොමුකරවන්නට නම් 20වැනි සංශෝධනය අහෝසි කළ යුතුමයි. අප එය ස්ථිරසාර ලෙස කියා සිටිනවා. ඒ වගේම රජයේ අවධානයද ඒ කෙරෙහි යොමු වේවායි ප්‍රාර්ථනා කරනවා" යනුවෙන්ද සඳහන් කළේය.

# පාසල්, දහම් පාසල් විවෘත කළත් විශ්වවිද්‍යාල විවෘත කිරීමක් ගැන කතා නෑ

## - අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය

● ඉන්දික හේවාවිතාරණ

කෝවිඩ්-19 තත්ත්වය තුළ පාසල්, පෙරපාසල්, දහම්පාසල් ඇතුළු අධ්‍යාපන ආයතන විවෘත කර පවත්වාගෙන යාමට කටයුතු කළත් විශ්වවිද්‍යාල තවදුරටත් වසා තැබීමට පාලකයන් කටයුතු කරමින් සිටින බව අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය සඳහන් කරයි.

කෝවිඩ්-19 තත්ත්වය තුළ පසුගිය වසරේ මාර්තු මාසයේදී විශ්වවිද්‍යාල වසා දැමීමට කටයුතු කළ බවත්, මේ නිසා පසුගිය වසරේදී විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ බොහෝ ශිෂ්‍යයන්ට අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව හිමිවූයේ මාසයක් දෙකක් වැනි කාලයක් පමණක් බවත් එම සංගමයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ මහතා සඳහන් කළේය.

පසුගිය වසරේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ සමහර ශිෂ්‍යයන්ට එක් දිනක් හෝ අධ්‍යාපනය ලැබීමට අවස්ථාව හිමිනොවූ බවත්, මෙම වසරට අදාළව මාර්ගගත ක්‍රමය යටතේ ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීමට කටයුතු කළත් කිසිදු ශිෂ්‍යයෙකුට එක් දිනක් හෝ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට අවස්ථාවක් හිමිනොවූ බවත් ඒ මහතා පවසා සිටියේය.

කෝවිඩ්-19 තත්ත්වය තුළ ආරක්ෂිත ක්‍රමවේද භාවිත කරමින් විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට බලධාරීන් මෙතෙක් කටයුතු කර නොමැතිවීමෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට දැඩි අසාධාරණයක් සිදුව තිබෙන බවද හෙතෙම සඳහන් කළේය.

# අඛණ්ඩව තරග නොකරන හා සක්‍රීය නොවන පක්ෂවල ලියාපදිංචිය අහෝසි කිරීමට ක්‍රමවේද ඕනෑ

## - පැෆරල් සංවිධානය මැතිවරණ කොමිසමෙන් ඉල්ලයි

● එච්.අයි. තුෂාර

පක්ෂ ලියාපදිංචි කිරීමේ නිර්ණායක නැවත සලකා බලන ආකාරයටම මැතිවරණවලට අඛණ්ඩව තරග නොකරන හා සක්‍රීයව කටයුතු නොකරන පක්ෂවල ලියාපදිංචිය අහෝසි කිරීමට ක්‍රමවේදයක් සකස් කරන ලෙස මැතිවරණ කොමිසමෙන් ඊයේ (01දා) ඉල්ලා සිටි බව පැෆරල් සංවිධානය සඳහන් කරයි.

පක්ෂයක් ලියාපදිංචි කිරීමේදී පක්ෂයේ ප්‍රධාන තනතුරකට කාන්තාවක් පත් කළ යුතු බවට මැතිවරණ නීතියේ පවතින බවත්, මේ නිසා ප්‍රධාන තනතුරුවල කාන්තාවන් නොමැති පක්ෂ හඳුනාගෙන කාන්තාවන් ඇතුළත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කරන ලෙසත් ඉල්ලා සිටි බවත් එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවසීය.

පක්ෂ ලියාපදිංචි කිරීමේ පනතට අනුව ප්‍රධාන තනතුරුවලින් එකක් හෝ කාන්තාවකට ලබාදිය යුතු වුවත්, සමහර පක්ෂවල කාන්තාවකට ප්‍රධාන තනතුරක් ලබාදී නොමැති බවට තම සංවිධානයටත් නිරීක්ෂණය වී තිබෙන බවද ඒ මහතා පවසා සිටියේය.

වාර්ෂික හෝ ආගමික පදමින් ලියාපදිංචි වී ඇති පක්ෂවලට එම තත්ත්වය සංශෝධනය කිරීමට මැතිවරණ කොමිසමට අවස්ථාවක් ලබාදී තිබෙන බවත්, එය සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපේක්ෂා දල්වන්නක් බවත් රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

මැතිවරණවලට අඛණ්ඩව තරග නොකරන පක්ෂ හා සක්‍රීය දේශපාලනයේ නොයෙදෙන පක්ෂ තිබෙන නිසා මෙවැනි පක්ෂ පිළිබඳ වාර්ෂිකව හෝ වසර කිහිපයකට වරක් සමාලෝචනය කර පක්ෂ ලියාපදිංචිය අහෝසි කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන ලෙසත් මැතිවරණ කොමිසමෙන් ඉල්ලා සිටි බවද ඒ මහතා ප්‍රකාශ කළේය.

# අත්අඩංගුවට පත් පොල්තෙල් බවුසර් දෙක ආන්දෝලනාත්මක තෙල් තොගයේ කොටසක් නම් අභියාචනා නොසලකා ප්‍රතිඅපනයනය කරනවා

## - පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න

● නිදර්ශනී වික්‍රමසිංහ

දංකොටුව ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් පොල්තෙල් බවුසර 02හි අඩංගුව ඇත්තේ, ආන්දෝලනයට ලක් වූ ඇෆ්ලටොක්සින් අඩංගු පොල්තෙල් තොගයේම කොටසක් බවට අනාවරණය වුවහොත් එම තොගය සඳහා ඉදිරිපත් වන කිසිදු අභියාචනයක් සලකා නොබලා ප්‍රතිඅපනයනය කිරීමට කටයුතු කරන බව පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතා ප්‍රකාශ කළේය.

එසේම එම බවුසරවලින් ලබාගත් පොල්තෙල් සාම්පල ආන්දෝලනයට ලක් වූ තොගයේ කොටසක් නොවී එහෙත් ඒවායේහි ඇෆ්ලටොක්සින් පිළිකා කාරකය අඩංගු බවට තහවුරු වුවහොත් එම තොග මෙරටදී විනාශ කිරීමට කටයුතු කරන බවද හෙතෙම සඳහන් කළේය.

මීට අමතරව මේ වනවිට ප්‍රතිඅපනය කිරීමට නියෝග කර ඇති පොල්තෙල් තොග අනිවාර්යයෙන් ප්‍රතිඅපනයනය කිරීමට කටයුතු කරන බවත්, ඒ අනුව ඒ පිළිබඳ කිසිදු සැකයක් තබාගැනීමේ අවශ්‍යතාවක් නොමැති බවත් රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය.

මේ සම්බන්ධයෙන් 'අද' කළ විමසීමේදී රාජ්‍ය අමාත්‍යවරයා සඳහන් කර සිටියේ, බවුසර 02හි අත්අඩංගුවට ගෙන ඇත්තේ, ආන්දෝලනයට ලක් වූ ඇෆ්ලටොක්සින් අඩංගු පොල්තෙල් තොගයේම කොටසක්ද යන්න පිළිබඳ ශ්‍රී ලංකා රේගුව විසින් මෙතෙක් අනාවරණය කර ගෙන නොමැති බවයි. ඒ අනුව ආන්දෝලනයට ලක් වූ තොගය, ආනයනයේදී රේගුව විසින් ගණන් බලා ඇති ප්‍රමාණයෙන්ම තවදුරටත් පවතින්නේදැයි රේගු නිලධාරීන් විසින් මේ වනවිට පරීක්ෂා කරන බව හෙතෙම වැඩිදුරටත් පැවසීය.



අත්අඩංගුවට ගෙන ඇති පොල්තෙල් බවුසර් 02, ඇෆ්ලටොක්සින් පිළිකා කාරකය අඩංගු පොල්තෙල් ගෙන්වූ සමාගමක් වන එදිරිසිංහ එඩිබල් ඔයිල් සමාගමට අයත් ඒවා වන බවද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා පෙරේදා (31දා) ප්‍රකාශ කළේය.

# මාලිගාවත්තේ ශ්‍රී ධර්මරාජ දහම් පාසලේ දරුවන්ගේ පොත් 10ක් එළිදැක්වීම 04දා

මාලිගාවත්තේ ශ්‍රී ධර්මරාජ දහම් පාසලේ දරුවන් විසින් රචිත පොත් දහයක් එළිදැක්වීම අප්‍රේල් 04 ඉරිදා ප.ව. 3.00ට මාලිගාවත්ත ශ්‍රී සුධර්මාරාමයේදී පැවැත්වේ.

එස්. ගොඩගේ සමාගම විසින් මෙම පොත් මුද්‍රණය කර ඇත. මෙම පොත් එළිදැක්වීමේ උත්සවය විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම, පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ, ගොඩගේ සමාගමේ සභාපති එස්. ගොඩගේ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීමට නියමිතය.

සිංහල හා ඉංග්‍රීසි ළමා කතා පහක්, පර්යේෂණාත්මක පොත් තුනක්, ගීත පොතක්, 'බුද්ධ ප්‍රතිමා වහන්සේ' නමින් බෞද්ධ ඉතිහාසය විස්තර කෙරෙන ග්‍රන්ථයක් එළිදැක්වීමට නියමිතය.



# ප්‍රේමයෙන්, දයාවෙන් යුතු මානව හිතවාදී සමාජයකට පාස්කු සමය ආශීර්වාදයක් කරගනිමු

## - ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ

ප්‍රේමයෙන් දයාවෙන් යුතු මානව හිතවාදී සමාජයක් තුළ ජීවත්වීමට පාස්කු සමය ආශීර්වාදයක් කරගත යුතු බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පවසයි.

සිය පාස්කු දින පණිවුඩය නිකුත් කරමින් මේ බව පවසන ජනාධිපතිවරයා සිය නිවේදනයෙහි මෙසේද සඳහන් කරයි.

'පාස්කුව ලෝකවාසී කිතුනු ජනතාවගේ උතුම්ම මංගල්‍යයයි. පාස්කු මංගල්‍යයේ අර්ථය පාපයෙන් ගැලවීමයි. ජන්ම පාපයෙන් නිදහස්ව, කළ වැරදි ගැන පසුතැවිලි වෙමින් නව දිවියක් ආරම්භ කිරීම ඉන් තවදුරටත් අරුත් ගැන්වෙයි.

ලොව පුරා විසිර පැතිර සිටින කිතුනුවෝ අළු බදාදා ආරම්භ වන, දින 40ක කාලපරිච්ඡේදයක් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය සහ මරණය සිහිකරමින් ආධ්‍යාත්මික වතාවත්හි නිරත වෙති. පාස්කු ඉරුදින ඔවුහු උන්වහන්සේ උත්ථාන වීමේ විජයග්‍රාහී මොහොත මහත් ප්‍රීතියෙන් සමරති.

කිතුනු ජනතාව මේ කාලය තුළ ක්‍රිස්තුන් වහන්සේ මානව සංහතිය පාපයෙන් මුදාගැනීමේ චේතනාවෙන් කුරුසියේ දුක්විඳ ඉතා වේදනාකාරී මරණය පරාජය කර නැවත නැගිට විමුක්තිය අත් කරදීම මෙනෙහි කරති.

ශ්‍රී ලාංකේය කිතුනු ජනතාව අසීමිත ගෞරවයෙන් හා භක්තිවන්තව සමරන පාස්කු සමය අන්තවාදී ම්ලේච්ඡ ප්‍රහාරයකට වරෙක ගොදුරු විය. ඉන් බිඳුණු හදවත්වල වේදනාව අදටත් මැකී ගොස් නැත. ඒ පාපී ක්‍රියාවට වැරදිකරුවන් වන පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට නීතියෙන් ගැලවීමට අප කිසිදු ඉඩක් තබන්නේ නැත. එසේම නැවත එවන් ඛේදාන්තයන්ට කවර හෝ අවසරයක් නොලැබෙන පරිදි ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට රජය වග වී සිටී.

ජේසුස් වහන්සේ එදා දේශනා කළ මානව විමුක්තිය සමාජයට ශක්තියකි. අද ලෝකය හමුවේ මුහුණපෑමට සිදුවන බහුවිධ තාඩන පීඩන පරාජය කර නැගී සිටීමටත්, ප්‍රේමයෙන් දයාවෙන් යුතු මානව හිතවාදී සමාජයක් තුළ ජීවත්වීමටත් මේ පාස්කු සමය ආශීර්වාදයක් කරගනිමු.

සැමට සාමකාමී පාස්කු මංගල්‍යයක් වේවා !

# එජාපයේ අනුබද්ධ සංවිධාන යළි පණ ගැන්වීම අවුරුද්දෙන් පසු

● නවෝද්‍යා පවනි

එක්සත් ජාතික පක්ෂයේ අනුබද්ධිත සංවිධාන සියල්ලක්ම යළි පණ ගැන්වීම සිංහල හින්දු අලුත් අවුරුද්දෙන් පසුව අරඹන ලෙස එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ඊයේ (01) උපදෙස් ලබාදී තිබේ.

නීතිඥ සංගම්, වෘත්තීයවේදීන්ගේ සංවිධාන, වෘත්තීය සමිති, පරිසර සංවිධාන, විද්වතුන්ගේ සමිති ඇතුළු සියලුම සංවිධාන යළි බලගැන්වීමේ කටයුතු රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් අනුව මෙලෙස ආරම්භ කිරීමට නියමිතය.

ඉදිරි මාස හයක කාලයේදී පක්ෂයට සම්බන්ධ තරුණ හා කාන්තා සංවිධාන ද සම්පූර්ණයෙන්ම නවීකරණය කර වත්මන් යුගයට ගැළපෙන ලෙස ප්‍රතිසංවිධාන කිරීම ද රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් අනුව ක්‍රියාත්මක කෙරේ. එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන, සභාපති වජිර අබේවර්ධන, මහලේකම් පාලිත රංගේ බණ්ඩාර, උපනායක අකිල විරාජ් කාරියවසම් යන මහත්වරුන්ගේ අධීක්ෂණය යටතේ ඉහත ප්‍රතිසංවිධාන කටයුතු සිදුවේ.

# කවිපොතක් ලියූ ජසීම් තරුණයා මුහුණ දෙන තත්ත්වය ගැන මානව හිමිකම් කොමිෂන් සභාව වාර්තාවක් ඉල්ලයි

● චාමර සම්පත්

කවි පොතක් ලිවීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන සිටින අහනෆ් ජසීම් (AhnafJazeem) නම් තරුණයා මුහුණ දෙමින් සිටින තත්ත්වයන් සම්බන්ධයෙන් පරීක්ෂා කර අප්‍රේල් 08ට පෙර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයට ලිඛිතව දැනුම්දී තිබේ.

ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් 2021.03.29 දින අහනෆ් ජසීම් තරුණයා මුහුණදෙන තත්ත්වයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද සවිස්තරාත්මක ලිපියක් පදනම් කරගෙන මානව හිමිකම් කොමිසම එලෙස දැනුම්දී ඇත.

අහනෆ් ජසීම් නමැති පුද්ගලයා රැඳවුම් නියෝග මත ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ රඳවා සිටින අතරතුරේදී ඔහු මුණ ගැසීමට නීතිඥවරුන්ට අවස්ථාවක් ලබා නොදීම, අත්අඩංගුවට ගෙන රැඳවුම් නියෝග මත රඳවා සිටියදී මීයෙකු සපා කෑම, මෙන්ම ඔහු මුල්වරට අත්අඩංගුවට ගෙන ඇත්තේ, නවරසම් පොතේ අන්තවාදී සිදුවීම් ඇති බව පැවසුවද මේ වනවිට ඔහුට එරෙහිව වෙනත් විමර්ශනයක් කරගෙන යාම යන කරුණු තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් කරන ලද පැමිණිල්ල මගින් දැනුම්දී තිබේ.

මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් 2020.12.09 දිනද එම සංගමය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මුලින්ම පැමිණිල්ලක් යොමු කර තිබිණි. දෙවැනි පැමිණිල්ලෙන් පසු මානව හිමිකම් කොමිසමේ විශේෂ කණ්ඩායමක් ඊයේ (01දා) අහනෆ්ගේ තත්ත්වය බැලීමට ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයටද ගොස් ඇත.

# විෂ පොල්තෙල් ගෙන ඒම ගැන ආණ්ඩුව පරීක්ෂණ නොකරන්නේ නම් අනාගත රජයක් යටතේ කොමිසමක්

## - සජබ පා.ම.රාජිත සේනාරත්න

● දිනේෂ් සමරකෝන්

විෂ සහිත පොල්තෙල් ගෙන ඒම සම්බන්ධයෙන් වත්මන් ආණ්ඩුව පරීක්ෂණයක් නොකරන්නේ නම් අනාගත රජයක් යටතේ මෙවැනි කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීමට කොමිෂන් සභාවක් පත් කළ යුතු බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න මහතා පැවසීය.

කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ ඊයේ (01දා) පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් පළ කළ පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න මහතා,

"දැන් පොල්තෙල් ගැටලුව ඇවිල්ලා තිබෙනවා. ඒ පොල්තෙල්වල තනිකරම පිළිකාකාරක අඩංගුවෙලා තිබෙනවා. මේ වගේ එක එක වංචා ආවා. සීනි වංචාව ආවා. පොල්තෙල් වංචාව ආවා. ටයිල්වල වංචාව ආවා. දැන් මේ සැරේ පොල්තෙල් ගෙනාපු මුස්ලිම් ව්‍යාපාරිකයා කවුද කියලා බලන්න. තනිකරම පොහොට්ටුව කර උඩ තියාගෙන වැඩ කරපු කෙනා. ඒකනේ පොල්තෙල්වල පිළිකාකාරක කියද්දිත් සහන හම්බවෙන්නේ.

අද සෞඛ්‍ය අමාත්‍යාංශය ඉතා ශක්තිමත් තමන්ගේ වාර්තා ගැන. මම එනකොට සෞඛ්‍ය අමාත්‍යාංශයට ජාත්‍යන්තර පිළිගත් රසායනාගාරයක් තිබුණේ නෑ. ඒ නිසා අපේ වාර්තා එච්චර වැදගත් වුණේ නෑ. ඒ නිසා හැමදාම ප්‍රමිති කාර්යාංශයේ වාර්තා අනුව තමයි කටයුතු කළේ. මගේ කාලයේදී ගෙනාවා ලංකාවට සැමන්. ඒ සැමන්වල පණුවෝ හිටියා. කන්ටේනර් 32ක්. ඒකෙදි ඒ ව්‍යාපාරිකයෝ නොයෙකුත් බලපෑම් මට ඇති කරා නොයෙකුත් දෙනා හරහා. ඒ අනුව ප්‍රමිති කාර්යාංශය දුන්නා සහතිකයක් ඒවා මුදා හරින්න කියලා. මම ඇහුවම ඔවුන් කිව්වේ පණුවෝ දෙන්නෙක් හිටියට කමක් නෑ කියලා. මම එතනදි කිව්වා පණුවෝ දෙන්නෙක් නෙවෙයි 25ක් හිටියත් කමක් නෑ චීනෙට කියලා. මම ඒවා තහනම් කරලා ඒ කන්ටේනර් 32ම චීනයට නැවත ගෙනිච්චා. ඔවුන්ට එහිදී පාඩුවක් වුණත් අපි මිනිස්සුන්ව බේර ගත්තා. ඒවා කරන්නට පුළුවන් වුණේ මම මගේ කාලයේදී ජාත්‍යන්තරව පිළිගන්නා ප්‍රමිතිය තිබෙන රසායනාගාරයක් කළුතර සෞඛ්‍ය විද්‍යාතනයේ ආරම්භ කරාට පස්සේ.

එදා ඉඳලා ආහාර සුරක්ෂිත ඒකකයේ ඉන්න විශේෂඥවරු මට නිවැරදි ජාත්‍යන්තරව පිළිගන්න වාර්තා නිකුත් කළා. දැන් පොල්තෙල්වලටත් ඒක තමයි වුණේ. අපේ ආහාර සුරක්ෂිත ඒකකය කියනවා මේකේ පිළිකාකාරක තියෙනවා කියලා. තවමත් මේ පොල්තෙල් කැරකෙනවා ලංකාවේ. කඩ හිමියන් මට කියනවා පොල්තෙල් මිනිස්සු ගන්නේ නෑ කියලා. මේ ආණ්ඩුව කරන්නේ නැති නම් අනාගතයේ එන ආණ්ඩුවකින් හරි මේ සම්බන්ධයෙන් කොමිෂන් සභා පත් කරන්න ඕන. මේවා මිනිස්සු මරණ ඒවා" යනුවෙන් සඳහන් කළේය.



# ඇසුරුම් කළ ගුණාත්මක පොල්තෙල් හඳුනාගැනීමට තරු 05 ලාංඡනය හඳුන්වා දීලා

● නිදර්ශනී වික්‍රමසිංහ

ඇසුරුම් කළ ගුණාත්මක පොල්තෙල් හඳුනාගැනීම සඳහා තරු 05 ලාංඡනය මේ වනවිට හඳුන්වා දී ඇති බවත්, ඒ අනුව දේශීය පොල්තෙල් නිෂ්පාදන ආයතන 08ක් සඳහා එම ලාංඡනය ලබාදී ඇති බවත් පොල් සංවර්ධන අධිකාරිය ප්‍රකාශ කළේය.

මේ සම්බන්ධයෙන් 'අද' කළ විමසීමේදී එම අධිකාරිය සඳහන් කර සිටියේ ඇසුරුම් නොකරන ලද පොල්තෙල් වෙළෙඳ පොළට නිකුත් කිරීම හරහා ඇතිවන දූෂණ සහ සෞඛ්‍ය ගැටලු අවම කිරීම මෙමගින් ප්‍රධාන වශයෙන් අරමුණු කෙරෙන බවයි.

ඒ අනුව අදාළ තරු 05න් තරු 03ක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහතික ලැබීම වෙනුවෙන් වෙන් කර තිබේ. ඊට අමතරව පොල්තෙල් නිෂ්පාදනය කරනු ලබන පරිශ්‍රය එම නිෂ්පාදන කටයුතු සඳහා සුදුසු වීම සහ පොල්තෙල් වෙනත් තෙල් වර්ගයක් හෝ ද්‍රව්‍යයක් සමග මිශ්‍ර නොකර සුපිරිසුදු තත්ත්වයේ පැවතීම යන කරුණු සඳහා අනෙකුත් තරු ලකුණු 02 වෙන් කර ඇති බව පොල් සංවර්ධන අධිකාරිය පැවසීය.

ඒ අනුව මෙම ලාංඡනය ලබාගැනීම සඳහා දිවයිනේ පවතින අනෙකුත් පොල්තෙල් නිෂ්පාදන සමාගම්ද උනන්දු කරවන බව පැවසූ එම අධිකාරිය, ඒ හරහා පාරිභෝගිකයාට ගුණාත්මක පොල්තෙල් මිලට ගැනීමේ අවස්ථාව සැලසීම රජයේ අරමුණ වන බවද ප්‍රකාශ කළේය.

මේ සම්බන්ධයෙන් වැඩිදුර පහැදිලි කිරීමක් සිදුකළ පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) පියසේන එදිරිමාන්න මහතා,

"මේ වනවිට රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම පොල්තෙල් නිෂ්පාදනය කරනු ලබන ආයතන 08ක නිෂ්පාදන සඳහා අපි තරු 05 ලාංඡනය ලබාදී තිබෙනවා.මේ තරු 05 ලකුණුවලින් පෙන්වා දී තිබෙන්නේ ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුව නිෂ්පාදනය වෙනවා, නිෂ්පාදනය කරන පරිශ්‍රය පොල්තෙල් නිෂ්පාදනය සඳහා සුදුසුයි, වෙනත් තෙල් සමග මිශ්‍ර කර නෑ කියන එක. තරු ලකුණ සහිත පොල්තෙල් අපිට වෙළෙඳ පොළෙන් තෝරාබේරාගෙන හඳුනා ගැනීමට හැකියාව තිබෙනවා නම් ගුණාත්මක පොල්තෙල් පරිභෝජනය කිරීමට හැකියාව ලැබී තිබෙනවා.

මේ වැඩපිළිවෙළ අපි දැන් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව දිවයින පුරා එය ක්‍රියාත්මක කර සියලු කර්මාන්තකරුවන් ඊට ඇතුළත් කරගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ හරහා පොල්තෙල් මිලට ගැනීමේදී රාජ්‍ය ආරක්ෂණයක් පාරිභෝගිකයාට ලබාදීම අපගේ අපේක්ෂාවයි" යැයි පවසා සිටියේය.

# තැපැල් සේවාවේ පුරප්පාඩු 2700ක් බඳවා ගැනීම කල් යයි

● එච්.අයි. තුෂාර

තැපැල් ස්ථානාධිපති තනතුරට හා උප තැපැල් ස්ථානාධිපති තනතුරට බඳවාගැනීම සඳහා පවතින ක්‍රමවේදය වෙනස් කිරීමට යෑම නිසා තැපැල් සේවාවේ පුරප්පාඩු 2700ක් සඳහා නිලධාරීන් බඳවාගැනීම දිගින් දිගටම කල්යමින් තිබෙන බව ශ්‍රී ලංකා තැපැල් හා විදුලි සංදේශ සේවා සංගමය සඳහන් කරයි.

පවතින ක්‍රමවේදයට අනුව තරග විභාගයක් පවත්වා ඉහළම ලකුණු ලබාගන්නා පිරිස් සම්මුඛ පරීක්ෂණයකට ලක්කර බඳවාගැනීම් කළයුතු බවද එම සංගමයේ සභාපති චින්තක බණ්ඩාර මහතා සඳහන් කළේය.

එහෙත් දේශපාලනඥයන්ට හිතවත් පිරිස් අදාළ පුරප්පාඩු සඳහා යොමු කිරීමට තරග විභාගය නාමිකව පවත්වා එයට පෙනී සිටින පිරිස් සම්මුඛ පරීක්ෂණයකට ලක්කර සම්මුඛ පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගන්නා පිරිස් බඳවාගැනීමට සැලසුම් කර තිබෙන බවද ඔහු පවසා සිටියේය.

සුදුසුකම් සහිත පිරිස් තැපැල් සේවාවට බඳවාගැනීම සඳහා දැනට ක්‍රියාත්මක කරන බඳවාගැනීමේ ක්‍රමවේදයට අනුව සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා නොදෙන බවත්, එහිදී විභාගයෙන් වැඩිම ලකුණු ලබාගැනීම පමණක් සුදුසුකමක් සේ සලකන බවද ඒ මහතා සඳහන් කළේය.

නව ක්‍රමවේදයකට අනුව පිරිස් බඳවාගැනීමට සැලසුම් කිරීමත් සමග තැපැල් දෙපාර්තමේන්තු සේවකයන් එයට දැඩි විරෝධයක් එල්ල කරමින් සිටින බවත්, මේ නිසා තැපැල් ස්ථානාධිපති සේවාවේ පවතින පුරප්පාඩු 1700ක ප්‍රමාණයට නිලධාරීන් බඳවාගැනීම හා උප තැපැල් ස්ථානාධිපති සේවයේ පවතින පුරප්පාඩු දහසකට අධික ප්‍රමාණයට නිලධාරීන් බඳවාගැනීම දිගින් දිගටම කල් දැමීමට පාලන අධිකාරිය කටයුතු කරමින් සිටින බවද හෙතෙම කියා සිටියේය.

පවතින පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම නිසා තැපැල් සේවාව පවත්වාගෙන යෑමේදී විශාල ගැටලු ප්‍රමාණයක් ඇති වී තිබෙන බවද චින්තක බණ්ඩාර මහතා පවසා සිටියේය.

# වරාය නගරයට රටේ නීති ක්‍රියාත්මක නොවන ආකාරයට නීති සකස් කිරීමට ආණ්ඩුවේ සැලසුම්?

## - නිදහස් වෙළෙඳ කලාප හා පොදු සේවා සේවක සංගමය

● එච්.අයි. තුෂාර

කොළඹ වරාය නගරයේ (Fort City) පදිංචිකරුවන්ට හා එහි ඉදිකරන සමාගම්වලට රටේ පවතින නීති රෙගුලාසි ක්‍රියාත්මක නොවන ආකාරයට නීති සකස් කිරීමට ආණ්ඩුව සැලසුම් කරමින් තිබෙන බව නිදහස් වෙළෙඳ කලාප හා පොදු සේවා සේවක සංගමය සඳහන් කරයි.

මීට අදාළව කැබිනට් මණ්ඩල පත්‍රිකාවක් සම්මත කර ගැනීමටත් සැලසුම් කර තිබෙන බවත්, කොළඹ වරාය නගරයට රටේ නීති බලාත්මක නොකළහොත් වැඩිම බලපෑම සිදුවන්නේ, අදාළ නගරය තුළ සේවය කිරීමට කටයුතු කරන සේවකයන්ට බවත් එම සංගමයේ සමලේකම් ඇන්ටන් මාකස් මහතා පැවසීය. කම්කරු නීතිවලට අනුව සේවය අවසන් කිරීමේ පනතක් පවතින බවත්, මෙම පනතට අනුව හාම්පුතුන්ට සේවකයන් සිතූ සිතූ ආකාරයට ඉවත් කළ නොහැකි බවත් ඒ මහතා පවසා සිටියේය. එහෙත් මෙම නීති වරාය නගරය තුළ ක්‍රියාත්මක නොකළහොත් හාම්පුතුන්ට සිතූ සිතූ ආකාරයට සේවකයන්ගේ සේවය අවසන් කිරීමට හැකිවන බවද සමලේකම්වරයා ප්‍රකාශ කළේය.

ආණ්ඩුව සිදුකරන මෙම සැලසුම පිළිබඳ සාකච්ඡා කර එවැනි තීරණයක් ගතහොත් ගන්නා ක්‍රියාමාර්ග තීරණය ගතහොත් ගන්නා ක්‍රියාමාර්ග තීරණය කිරීම සඳහා මේ මස 05වැනිදා ජාතික කම්කරු උපදේශක සභාව නියෝජනය කරන වෘත්තීය සමිති දාහතර කොළඹදී රැස්වන බවද හෙතෙම පවසා සිටියේය.


# මීගමුව කලපුවෙන් රොන්මඩ සහිත පස් තොගයෙන් වැලි සෝදා ඉවත් කිරීමට අවධානය

● නිදර්ශනී වික්‍රමසිංහ

කතාබහට ලක්ව තිබෙන මීගමුව කලපුවෙන් බැහැර කර ඇති රොන් මඩ සහිත පස් තොගයෙන් වැලි සෝදා ඉවත් කර ගැනීමට පරිසර අමාත්‍යාංශයේ අවධානය යොමුව තිබේ. ඒ අනුව ඒ පිළිබඳ කඩිනමින් සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.

මෙම පස් තොගය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වූ හමුවක් මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය සහ පරිසර අමාත්‍යාංශය එක්ව කැඳවා තිබිණි. ඒ අනුව එහිදී අනාවරණය වී ඇත්තේ අදාළ පස් තොගය 2018 වර්ෂයේදී ධීවර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද කලපු සංවර්ධන ව්‍යාපෘතියේදී ඉවත් කර ඇති බවයි.

# විදුහල්පතිවරයා එල්ල වූ මැර ප්‍රහාරයට එරෙහිව බන්දුල සේනාධීර විද්‍යාලයේ ගුරුවරු විරෝධතාවක



## විදුහල්පතිට පහරදුන් සැකකරුවන් තිදෙනෙක් දැලේ

● කරන්දෙණිය - එම්. සුසිල් ප්‍රියන්ත

සිය විදුහලේ විදුහල්පතිවරයාට එල්ලවූ මැර ප්‍රහාරයට එරෙහිව ඊයේ (01දා) විවේක කාලයේදී විදුහලෙන් ඉවත්වී කරන්දෙණිය බන්දුල සේනාධීර විද්‍යාලයේ ගුරුවරුන් පිරිසක් එම විදුහල ඉදිරිපිට අම්බලන්ගොඩ - ඇල්පිටිය මාර්ගයේ සිට නිහඬ විරෝධතාවක නිරතවූහ.

පාසල් කුඹුර අස්වැද්දීමට ගොස් සිටියදී බන්දුල සේනාධීර විදුහලේ විදුහල්පති සිසිර කේ. ජයතුංග මහතා මේ මැර ප්‍රහාරය එල්ල වූයේ පෙරේදා (31දා) පස්වරුවේදී වන අතර, මැර ප්‍රහාරයට ලක්වූ ඒ මහතා ඇල්පිටිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියි.

සිය විදුහල්පතිවරයාට එල්ලවූ මැර ප්‍රහාරය තමන් දැඩිසේ හෙළා දකින බවත් මැර ප්‍රහාරයන් එල්ල කළ අයට දැඩි දඬුවම් පමුණුවන ලෙසත් විරෝධතාවේ නිරතවී සිටින බන්දුල සේනාධීර විද්‍යාලයේ ගුරුවරු අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

විදුහල්පතිවරයාට එල්ල වූ මේ මැර ප්‍රහාරය නිසා තමන් දැන් මේ පාසලේ රාජකාරියට එනුයේ දැඩි බියකින් බවත් එම භීතිකාව නැති කොට තමන්ට නිදහසේ රාජකාරි කිරීමට අවශ්‍ය පසුබිම සකසා දෙන ලෙසත් ඔවුහු ඉල්ලා සිටිති.

මේ සම්බන්ධයෙන් කරන්දෙණිය පොලීසියෙන් කළ විමසීමකදී එහි ප්‍රකාශකයෙකු පැවසුවේ, විදුහල්පතිවරයාට එල්ල කළ මැර ප්‍රහාරයට සම්බන්ධ සියලුදෙනාම සැකපිට තිදෙනෙකු අත්අඩංගුවට ඇති අතර ඔහුන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත බවය.

# ඇන්සල් ලංකා ආයතනයේ සේවක පිරිසක් විරෝධතාවක




● මල්වාන - ඩබ්ලිව්.ඩී.එම්.විතානගේ

බියගම ආයෝජන කලාපයේ ඇන්සල් ලංකා ආයතනයේ සේවක සේවිකාවන් පිරිසක් පෙරේදා (31දා) පස්වරුවේ එහි ප්‍රධාන දොරටුව ඉදිරිපිට උද්ඝෝෂණයක නිරත වූහ.

එම ආයතනයෙන් සේවයෙන් නෙරපා දැමූ සේවකයන් නැවත සේවයේ පිහිටුවීම හා වන්දි ගෙවීමට ඇන්සල් ලංකා ආයතනයට බල කරමින් මෙය සංවිධානය කර තිබිණි.

අපේ ජන බලවේගය වෘත්තීය සමිති සංවිධානය මගින් සංවිධානය කළ මෙම උද්ඝෝෂණයට රෙදිපිළි, ඇගලුම් හා නිම්ඇඳුම් සේවක සංගමය, ඩාබිඳු සාමූහිකය සහ ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ කලාප හා පොදු සේවා සංගමය යන වෘත්තීය සමිති ඇතුළු වෘත්තීය සමිති කිහිපයකම නියෝජිතයන් ඇතුළු 200කට ආසන්න පිරිසක් එක්ව සිටියහ.

පිරිස විවිධ සටන් පාඨ කියමින් හා විවිධ සටන් පාඨ සහිත පුවරු ප්‍රදර්ශනය කරමින් පස්වරු 4.30 පමණ සිට පැයකට අධික කාලයක් උද්ඝෝෂණයේ නිරත වූහ.

සෞඛ්‍ය වෘත්තීයවේදීන්ගේ එකමුතුවේ රවි කුමුදේශ්, ඩාබිදු සාමූහිකයේ චමිලා තුෂාරි, වැඩ කරන ජන බලවේගය සංවිධානයේ චමින්ද පෙරේරා, නිදහස් වෘත්තීය සමිති සම්මේලනයේ ශ්‍රීනාත් පෙරේරා හා ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ කලාප හා පොදු සේවා සේවක සංගමයේ ඇන්සල් ලංකා ශාඛාවේ හිටපු සභාපති අතුල කමල් යන මහත්ම මහත්මීහු ද මෙහිදී අදහස් දැක්වූහ.

# ගංගොඩවිල සෝම හිමිගේ මෑණියන්ගේ ආදාහන කටයුතු හෙට

● කඩුවෙල - ආසිරි දමින්ද



අපවත් වී වදාළ ගංගොඩවිල සෝම හිමියන්ගේ මෑණියන් වූ චාලට් වීරතුංග ආරච්චි මහත්මියගේ ආදාහන කටයුතු හෙට (03දා) පස්වරුවේ බොරැල්ල සුසාන භූමියේදී සිදුකිරීමට නියමිතය.

දූ දරුවන් පස් දෙනෙකුගේ මවක් වූ ඒ මහත්මිය මියයන විට 95 හැවිරිදි වියෙහි පසුවූවාය. කලක් රෝගාතුරව සිටි ඇය ජයවර්ධනපුර රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී පෙරේදා (31දා) සවස ජීවිතක්ෂයට පත්ව තිබේ.

ගංගොඩවල සෝම හිමියන්ගේ මෑණියන්ගේ දේහය මේ වනවිට කඩුවෙල, කොතලාවල පාර, අංක 283 නිවසේ තැන්පත් කර තිබේ.

# පොළොන්නරුව හා මාතලේ වනජීවි කලාපවලින් වනඅලි 336ක් මරණයට පත්වෙලා

## මිනිස් ජීවිත 111ක් වනඅලින්ට බිලිවෙලා

### වනජීවි දෙපාර්තමේන්තුව

● මාතලේ - එම්.ඩබ්ලිව්. සෝමරත්න

වනජීවි දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව සහ මාතලේ වනජීවි කලාපයේ 2016 වසරේ සිට 2021 මාර්තු මස දක්වා අලි-මිනිස් ගැටුමෙන් වන අලි 336ක් මිය ගොස් තිබෙන අතර, වනඅලි ප්‍රහාරයන්ට ලක්ව මිනිසුන් 111ක් ජීවිතක්ෂයට පත්ව ඇති බව වනජීවි දෙපාර්තමේන්තුව පවසයි.

2016 වසරේ වනඅලි 54ක් හා මිනිස් ජීවිත 28ක්ද, 2017 වසරේ වනඅලි 44ක් හා මිනිස් ජීවිත 28ක්ද, 2018 වසරේ වනඅලි 76ක් හා මිනිස් ජීවිත 44ක්ද, 2019 වසරේ වනඅලි 97ක් හා මිනිස් ජීවිත 27ක්ද, 2020 වසරේ වනඅලි 48ක් හා මිනිස් ජීවිත 17ක්ද, 2021 වසරේ මාර්තු 31කට වනඅලි 17ක් හා මිනිස් ජීවිත 02ක් මරණයට පත්ව ඇති බව එම දෙපාර්තමේන්තුව පෙන්වා දෙයි.

කෝවිඩ් වසංගතය හේතුවෙන් මිනිස් සංචරණය අඩුවීම හේතුවෙන් 2020 සහ 2021 මුල් කාලයේ අලි-මිනිස් ගැටුම අඩුවී තිබෙන බව වනජීවි දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව කලාපයේ නිලධාරියෙක් පැවසීය.

# විද්‍යෝදය උපාධි පර්යේෂණ අප්‍රේල් 06දා ඇරඹේ



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීමේ අරමුණින් පවත්වනු ලබන විද්‍යෝදය උපාධි අපේක්ෂක පර්යේෂණ දිනය අප්‍රේල් මස 06වැනි අඟහරුවාදා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේදී පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත.

2020 වසරේ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි අපේක්ෂකයන් විසින් සිය ස්වාධීන පර්යේෂණ නිබන්ධනය සඳහා පාදක කොටගත් පර්යේෂණ පත්‍රිකා පන්සියයකට අධික ප්‍රමාණයකින්, විද්වත් මණ්ඩලයක් විසින් තෝරාගන්නා ලද පර්යේෂණ පත්‍රිකා 200ක පමණ ප්‍රමාණයක් මෙදින ඒ ඒ විෂය ධාරාවන් මුල් කරගෙන ඉදිරිපත් කිරීමට නියමිතය. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රවල පර්යේෂණ මානව සංවර්ධනය සඳහා ඉවහල් කරගත හැකි ආකාරය පිළිබඳව මෙම පර්යේෂණ පත්‍රිකා මගින් තොරතුරු ඉදිරිපත් කිරීමට නියමිතය.

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද මහතාගේ මගපෙන්වීමෙන් 2020 උපාධි අපේක්ෂක පර්යේෂණ දිනයේ ගරු සභාපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අරුණ ශාන්ත වල්පොල මහතා සහ ගරු ලේකම් ආචාර්ය ආශා නිමාලි ප්‍රනාන්දු මහත්මිය ඇතුළු කමිටු සාමාජික සාමාජිකාවන්ගේ ආරාධනයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතාගේ ප්‍රධානත්වයෙන් අප්‍රේල් 06දා පෙ.ව.8.30ට සමාරම්භක උත්සවය පැවැත්වෙන අතර, මෙදින විශේෂ ආරාධිත අමුත්තන් වශයෙන් සම්මානිත මහාචාර්ය එස්.බී. හෙට්ටිආරච්චි, විශ්‍රාමික මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර, මහාචාර්ය ඩී.පී.එස්. චන්ද්‍රකුමාර, මහාචාර්ය වෙන්කටේෂ් ප්‍රසාද් යන විද්වත්හු සහභාගී වීමට නියමිතය.

# ලක්ෂ ගණනක වී සොරකම් කළ සැකකරුවන් සිවුදෙනා රිමාන්ඩ්

## නිකවැරටිය, ආණමඩුව හා මහව ඇතුළු ප්‍රදේශ ගණනාවකින් වී සොරකම් කරලා

● පුත්තලම - හිරාන් ප්‍රියංකර ජයසිංහ

වී සොරකම් කිරීමේ චෝදනා සම්බන්ධව ආණමඩුව පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ සැකකරුවන් සිවුදෙනෙකු එළඹෙන 08වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස ආණමඩුව මහේස්ත්‍රාත් ශමිරුත් ජෙහානා මහත්මිය පෙරේදා (31දා) නියෝග කළාය.

මෙලෙස බන්ධනාගාරගත කෙරුණේ, ආණමඩුව හා කොටවෙහෙර ප්‍රදේශවල පදිංචි සැකකරුවන් සිවුදෙනෙකි.

මෙම වී සොරකමේ ප්‍රධාන සැකකරු කුඩා වෑන් රථයකින් එළවළු අලෙවි කිරීමේ මුවාවෙන් වී සොරකම් කිරීමේ නිරත වි ඇති බවත් ඒ සමගම වීවලට අමතරව සහල් හා ලක්ෂ 7කට ආසන්න කජු තොගයක්ද සොරකම් කර ඇති බව පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ.

අදාළ සැකකරුවන් වී සොරකම් කිරීමේ පළමු සොරකම පසුගිය 2020 ඔක්තෝබර් මාසයේ ආණමඩුව උප්පලවත්ත ප්‍රදේශයේ වී මෝලකින් කිලෝග්‍රෑම් 50ක් වූ වී ඇසුරූ උර 41ක් සොරකම් කර ඇති බව පොලීසිය අධිකරණයට දන්වා සිටියේය.

ඉන් පසුව ආණමඩුව, කොටවෙහෙර හා මහව ප්‍රදේශවල වී සොරකම් කිරීම්වල නිරත වි ඇති බවත් මෙහිදි වි මෝල් හා නිවාසවලට රහසින් රාත්‍රි කාලයේ ඇතුළුවී ලක්ෂ 20කට ආසන්න වී තොග සොරාගෙන ඇති බවද අනාවරණය වූ බව පොලීසිය අධිකරණයට පවසා සිටියේය.

සිද්ධිය සම්බන්ධයෙන් ආණමඩුව සහකාර පොලිස් අධිකාරී චන්දන හේරත් මහතාගේ උපදෙස් මත ආණමඩුව පොලිස් වැඩබලන ස්ථානාධිපති ජගත් කුමාර මහතාගේ මෙහෙයවීමෙන් අපරාධ විමර්ශන අංශ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ගාමිණී වික්‍රමසිංහ මහතා ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# මාරක රිය අනතුරක් කළ අයට පොලීසිය පක්ෂග්‍රාහීවී ඇතැයි විරෝධතාවක්





● ත්‍රිකුණාමලය - චමෝද්‍යා නේත්‍රාංජලි අමරජීව

අධික වේගයෙන් ධාවනය වූ මොටර් රථයකින් මාර්ගය අයිනේ සිටි අයෙකු යටකර මරණයට පත් කිරීමේ සිද්ධියේදී පොලීසිය පක්ෂග්‍රාහීව කටයුතු කළේ යැයි පවසමින් ඊයේ (01දා) මියගිය අයගේ මළසිරුර ත්‍රිකුණාමලය - නුවර ප්‍රධාන මාර්ගයේ සර්ධාපුර ප්‍රදේශයේ මහා මාර්ගයේ තබා මියගිය අයගේ ඥතීන් හා ප්‍රදේශවාසීහු විරෝධතාවක නිරත වූහ.

මෙලෙස මියගොස් තිබුණේ, ත්‍රිකුණාමලය, නුවර පාරේ කප්පල්තුරෙහි පදිංචිව සිටි ඒ.එම්. අන්තෝනි සාමි (අවු.49) නමැත්තෙකි.

මියගිය අය පසුගිය 30දා මීගමුව සිට ත්‍රිකුණාමලය බලා අධික වේගයෙන් ධාවනය වූ මෝටර් රථයකට මාර්ගයේ අයිනේ සිටියදී ගැටීමෙන් මියගොස් තිබුණි. සැකකරු අත්අඩංගුවට ගත් චීනවරාය පොලීසිය ත්‍රිකුණාමල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඇප මත එදිනම මුදාහැර තිබුණි.



පොලීසිය පක්ෂග්‍රාහීව කටයුතු කිරීම නිසා සැකකරුට ඇප ලැබුණු බව කියමින් චිනවරාය පොලීසියේ ක්‍රියා කලාපය දෝෂදර්ශනයට ලක්කරමින් මෙලෙස විරෝධතාවක නියැළුණහ.

මෙම හේතුව නිසා පිට ප්‍රදේශවලින් නුවර පාර ඔස්සේ ත්‍රිකුණාමලයට පැමිණෙන වාහන මඟී ප්‍රවාහන සේවා හා ත්‍රිකුණාමලය නුවර පාර ඔස්සේ පිටවන වාහන පැය කිහිපයකට ධාවනය නොවීය.

ත්‍රිකුණාමල මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක දුමින්ද රාජපක්ෂ මහතා හා උප්පුවේලි පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ගයාන් ප්‍රසන්න මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මාර්ගයේ ආරක්ෂාවට පොලිස් කණ්ඩායම් කිහිපයක් යොදවා තිබුණි.

# මොරටුව මෙතෝදිස්ත විද්‍යාලයේ පහ ශ්‍රේණිය තාවකාලිකව වසා දමයි

● මොරටුව - රේඛා තරංගනී ෆොන්සේකා

මොරටුව, රාවතාවත්ත මෙතෝදිස්ත විද්‍යාලයේ පහ ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවකට කෝවිඩ්-19 වෛරසය ආසාදනය වීම හේතුවෙන් එම පන්තිය වසා දමා ශිෂ්‍ය ශිෂ්‍යාවන් තිස්දෙනෙකු සහ පන්ති භාර ගුරුවරිය ඊයේ (01දා) නිරෝධානය සඳහා යොමුකළ බව සෞඛ්‍ය අංශ පවසයි.

අදාළ සිසුවියගේ මිත්තණිය දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ සැත්කමකට භාජනය වීමට පෙර සිදුකළ පී.සී.ආර්. පරීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව ඇයට කෝවිඩ්-19 වෛරසය ආසාදනය වී ඇති බවට හඳුනාගෙන ඇති අතර, පසුව ඇය ප්‍රතිකාර සඳහා නෙවිල් ප්‍රනාන්දු රෝහලට යොමු කර තිබිණි.

දැරියගේ මිත්තණියගේ පළමු පෙළ ආශ්‍රිතයන් වන මෙම පාසල් සිසුවිය ඇතුළු ඇයගේ පවුලේ පිරිස සඳහාද මොරටුව සෞඛ්‍ය අංශ විසින් පී.සී.ආර්. පරීක්ෂණ සිදුකර ඇති අතර, එහිදී සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝග තත්ත්වයක් පෙන්නුම් කළ මෙම සිසුවිය කෝවිඩ්-19 ආසාදිතයෙකු ලෙස හඳුනාගෙන ඇත.

පසුව සිසුවියද ප්‍රතිකාර සඳහා යොමු කර ඇති අතර, ඇය ඉගෙනුම ලබන රාවතාවත්ත මෙතෝදිස්ත විද්‍යාලයේ පහ ශ්‍රේණියේ පන්තිය දින දාහතරක් වසා දැමීමට සෞඛ්‍ය අංශ විසින් තීරණය කර තිබේ.

නිරෝධානය සඳහා යොමු කළ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ද පී.සී.ආර්. පරීක්ෂණ සඳහා යොමු කිරීමට බලාපොරොත්තු වන බවද සෞඛ්‍ය අංශ පැවසීය.

# අල්දොර පත්තිනි දේවාලයේ පත්තිනි පූජාව හෙට

● දෙහිඕවිට - සුමිත්ත තෙන්නකෝන්

පුස්සැල්ල රජමහා අල්දොර පත්තිනි දේවාලයේ දෙවියන් උදෙසා පැවැත්වෙන පත්තිනි දේව පූජාව සෞඛ්‍ය විධි විධාන වලට අනුකූලව හෙට (03දා) දේවාල මළුවේදී පැවැත්වීමට නියමිතය.

එදින ප.ව. 6.00 සිට පහතරට දොවොල් නැටුම් සාම්ප්‍රදානුකූලව දක්ෂ නැටුම් ශිල්පීන්ගේ සහභාගිත්වයෙන් දේව ශාන්තිකර්මය පසුදා පහන්වනතුරු පවත්වා පසු දින (04දා) දෙවියන් උදෙසා දේව දානය පැවැත්වීමට කටයුතු යොදා ඇති බව දේවාල භාරකාර මණ්ඩලය පවසයි.

# තංගල්ලේ සුරා අපරාධ 85කින් රජයට ලක්ෂ 02ක දඩ මුදලක්

තංගල්ල සුරාබදු ස්ථානයේ මාර්තු මාසයේ වාර්තාගත සුරා අපරාධ 85ක් අත්අඩංගුවට ගෙන දඩ මුදල් වශයෙන් ලක්ෂ 02 ක පමණ මුදලක් රජයට ලබාදීමට සමත් වී ඇත.

මෙහිදී බලපත්‍රයක් රහිතව රජයේ අනුමත මත්පැන් විකිණීමේ ස්ථාන 24 හා බලපත්‍රයක් රහිතව බියර් විකිණීමේ ස්ථානයක්ද, බලපත්‍රයක් රහිතව මහ රා විකිණීමේ ස්ථාන 53ක්ද, නීතිවිරෝධී ලෙස නිෂ්පාදනය කරන ලද ස්ප්‍රිතු සන්තකයේ තබාගැනීම් 07ක්ද, ගංජා ළඟ තබාගැනීම් නඩුවක් වශයෙන් එම අපරාධ අත්අඩංගුවට ගෙන ඇත.

ඉදිරියේදී චූදිතයන් 70කට අධික ප්‍රමාණයකට අඟුණකොළපැලැස්ස, වලස්මුල්ල, තංගල්ල යන මහේස්ත්‍රාත් අධිකරණවල නඩු පැවරීමට නියමිතය.

මෙම අත්අඩංගුවට ගැනීම් සඳහා සහකාර සුරාබදු කොමසාරිස් චන්න වීරක්කොඩි (දකුණු පළාත්) සහ සුරාබදු අධිකාරී ජයන්ත ද සිල්වා (හම්බන්තොට) මහත්වරුන්ගේ මග පෙන්වීමෙන් හා තංගල්ල සුරාබදු ස්ථානයේ ස්ථානාධිපති, සුරාබදු පරීක්ෂක කේ.පී.එන්.සී. කත්‍රිආරච්චි මහතාගේ මෙහෙයවීමෙන් සුරාබදු සැරයන්වරුන් වන එච්.කේ.දමිත, මාධව පුංචිහේවා, සුරාබදු කෝප්‍රල්වරුන් වන එන්.පී.පී.කේ. සමරනායක, අනුර පොන්නම්පෙරුම, සුරාබදු නියාමකවරුන් වන යූ.එච්.එල්. හර්ෂනාත්, යූ.එස්. මධුරංග සහ සුරාබදු රියැදුරු එම්.එම්. එල්. ලක්මාල් යන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදුවිය.



# රු.කෝටියක පමණ වටිනා කේරළ ගංජා කිලෝග්‍රෑම් 46ක් අත්අඩංගුවට



◀ මන්නාරම ▶

● වවුනියාව - මධුෂංඛ අමරසිංහ

මන්නාරම පේසාලෙයි මුහුදු වෙරළේ සඟවා තිබූ රුපියල් කෝටියකට ආසන්න වටිනාකමින් යුත් කේරළ ගංජා කිලෝග්‍රෑම් 46ක ප්‍රමාණයක් පෙරේදා (31දා) සොයාගත් බව පේසාලෙයි පොලීසිය පවසයි.

පේසාලෙයි පොලීසියට ලැබුණු තොරතුරකට අනුව මන්නාරම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහතාගේ අධීක්ෂණයෙන් පේසාලෙයි පොලිස් ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් පිරිසක් විසින් පෙසාලෙයි සිවුවන පටුමග පිහිටි මුහුදු වෙරළේ සඟවා තිබියදී අදාළ කේරළ ගංජා තොගය අත්අඩංගුවට ගෙන තිබේ.

මෙම කේරළ ගංජා තොගය ඉන්දියාවේ සිට මුහුදු මාර්ගයෙන් රහසිගතව රැගෙනවිත් වෙනත් ප්‍රදේශයකට ප්‍රවාහනය කරවීමේ සූදානමින් යුතුව මෙම ස්ථානයේ ජාවාරම්කරුවන් විසින් සඟවන්නට ඇති බවට පොලීසිය සැක පළ කරයි.

කේරළ ගංජා මුහුදු වෙරළේ සැඟවූ පුද්ගලයන් කවුරුන්දැයි යන්න මෙතෙක් අනාවරණය වී නොමැති අතර සිද්ධිය සම්බන්ධයෙන් පේසාලෙයි පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

◀ බදුල්ල ▶

# වෑන් රථයක ගැටී අවුරුදු 3 ½ක දැරියක් ජීවිතක්ෂයට

● මීගහකිවුල - එන්.කේ. නිශ්ශංක

කන්දකැටිය, මුඩගමුව ප්‍රදේශයේ වයස අවුරුදු 3 ½ ක දැරියක් පෙරේදා (31දා) සවස ගලඋඩ කන්දකැටිය මාර්ගයේ මුඩගමුව ප්‍රදේශයේදී වෑන් රථයක ගැටීමෙන් බරපතළ තුවාල ලබා රෝහල්ගත කිරීමෙන් අනතුරුව ජීවිතක්ෂයට පත්ව ඇති බව කන්දකැටිය පොලීසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්වූයේ, කන්දකැටිය, මුඩගමුව පදිංචිව සිටි නෙත්මි නිහංසා (අවු. 3 ½) නමැති දැරියකි.

ජීවිතක්ෂයට පත් දැරිය මාර්ගය හරහා ගමන් ගැනීමේදී ගලඋඩ දෙස සිට කන්දකැටිය දෙසට පැමිණි වෑන් රථයක ගැටීමෙන් බරපතළ තුවාල ලැබූ දැරිය කන්කැටිය රෝහලටත් අනතුරුව බදුල්ල මහා රෝහලටත් ඇතුළත් කිරීමෙන් පසුව ජීවිතක්ෂයට පත්ව ඇති බව පරීක්ෂණවලදී අනාවරණය විය.

අනතුර සම්බන්ධයෙන් වෑන් රථයේ රියැදුරා කන්දකැටිය පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

සිද්ධිය සම්බන්ධයෙන් කන්දකැටිය පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

◀ පොළොන්නරුව ▶



# ගිරිතලේ අභය භූමියෙහි තිබූ කුඩා අලි පැටවෙකුගේ සිරුරක් සොයා ගැනේ

● හිඟුරක්ගොඩ - ඩබ්.ඒ.පියතිලක

ගිරිතලේ අභය භූමිය තුළ තිබූ කුඩා අලි පැටවෙකුගේ සිරුරක් ඊයේ (31දා) හමු වූ බව බකමූණ වනජීවී කාර්යාලය පවසයි

අවුරුද්දක පමණ වන මෙම වනඅලි පැටියා මිය ගොස් ඇත්තේ ගිරිතලේ අභය භූමියට අයත් බකමූණ සියඹලාව ප්‍රදේශයේ බවත් රෝගී තත්ත්වයක් හේතුවෙන් වනඅලි පැටවා මිය ගොස් ඇති බවට වනජීවී නිලධාරීහු සැක පළ කර සිටිති.

අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයට සහ මින්නේරිය අභය භූමිය අතර අලි සංක්‍රමණය වන වනඅලි රංචුවක සිටි කුඩා වනඅලි පැටියෙකු මෙසේ මිය යන්නට ඇති බව වනජීවී නිලධාරීහු පවසා සිටිති.


වනඅලි පැටියාගේ මරණයට හේතුව සොයා බැලීමට ගිරිතලේ වනජීවී පශු වෛද්‍යවරු වෙත දැනුම් දුන් බව බකමූණ වනජීවී කාර්යාලයේ නිලධාරීහු පවසා සිටිති.

# ලොරි රථයක් ත්‍රිරෝද රථයක් මතට පෙරළී කාන්තාවන් තිදෙනෙක් ජීවිතක්ෂයට

## ත්‍රිරෝද රථයේ රියැදුරුට බරපතළයි

● හැටන් - රංජිත් රාජපක්ෂ / ශාන් හුලංනුගේ / සම්පත් ජයලාල්





නුවරඑළිය වැලිමඩ ප්‍රධාන මාර්ගයේ නුවරඑළිය හග්ගල ලොකු වංගුව ප්‍රදේශයේදී ඊයේ (01දා) දහවල් ධාවනය වෙමින් තිබූ ත්‍රිරෝද රථයක් මතට ලොරි රථයක් පෙරළීමෙන් ත්‍රිරෝද රථයේ ගමන් ගත් කාන්තාවන් තිදෙනෙකු ජීවිතක්ෂයට පත්වී ඇති බවත්, ත්‍රිරෝද රථයේ රියැදුරා අනතුරෙන් බරපතළ තුවාල ලබා නුවරඑළිය මහ රෝහල වෙත ඊයේ (01දා) ඇතුළත් කළ බව නුවරඑළිය පොලීසිය පවසයි.

අනතුරෙන් ජීවිතක්ෂයට පත්වූයේ, ඇල්ල, ඌව කරඳගොල්ල ප්‍රදේශයේ පදිංචිකාරිනියන් තිදෙනෙකි.

නුවරඑළිය සිට ඇල්ල දක්වා ධාවනය වූ ත්‍රිරෝද රථය පසුපස නුවරඑළිය සිට වැලිමඩ දක්වා ධාවනය වූ භාණ්ඩ ප්‍රවාහන ලොරි රථයක් හදිසියේ ඉදිරියෙන් ධාවනය වූ ත්‍රිරෝද රථය මතට පෙරළී මෙම අනතුර සිදු වී ඇති බවත්, අනතුරෙන් පසු ලොරි රථයේ රියැදුරා පලාගොස් ඇති බවත් පරීක්ෂණවලදී අනාවරණය විය.

අනතුර සිදුවූ අවස්ථාවේ කාන්තාවක් එම ස්ථානයේදීම ජීවිතක්ෂයට පත්වූ බවත්, අනෙකුත් තුවාලකාරියන් දෙදෙනා රෝහල්ගත කිරීමෙන් පසු මිය ගිය බවත්, ත්‍රිරෝද රථයේ රියැදුරාගේ තත්ත්වය බරපතළ බවද පොලීසිය පවසයි.

ලොරි රථයේ සහකයා සැකපිට අත්අඩංගුවට ගත් බවත්, ලොරි රථයේ රියැදුරාගේ අනන්‍යතාව තහවුරු කරගෙන ඇති බවත්, සැකකරු අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන බවද පොලීසිය සඳහන් කරයි.

සිද්ධිය සම්බන්ධයෙන් නුවරඑළිය පොලීසියේ රථ වාහන අංශ නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# නුවරඑළිය වසන්ත උදානය ඇරඹේ

## හෝටල්වල සංචාරකයන් පිරිලා



● හැටන් - රංජිත් රාජපක්ෂ

නුවරඑළිය වසන්ත උදානය ඊයේ (01දා) සිට එළැඹෙන 30 වැනිදා දක්වා සෞඛ්‍ය මාර්ග උපදෙස්වලට අනුකූලව පවත්වන බව නුවරඑළිය මහ නගර සභාවේ නගරාධිපති චන්දන ලාල් කරුණාරත්න මහතා පැවසීය.

චන්දන ලාල් කරුණාරත්න මේ බව පැවසුවේ, 2021 වසර සඳහා වසන්ත උදානය සමාරම්භක උත්සවය ඊයේ (01දා) නුවරඑළිය ග්‍රෙගරි වැව ඉස්මත්තේදී ආරම්භ කරමිනි.

නගරාධිපතිවරයාගේ ආරාධනාවක් අනුව මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් වසන්ත උදානය සමාරම්භක උත්සවය පැවැත්විණ.

නුවරඑළියට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ගේ විනෝදාස්වාදය සඳහා තුරඟ තරග ඇතුළු තරග ඉසව් ගණනාවක්, මල් ප්‍රදර්ශන පැවැත්වීමටත්, සංගීත සංදර්ශන නොපැවැත්වීමටත් මෙවර වසන්ත උදානයේ සංවිධායක කමිටුව තීරණය කර ඇත.

නුවරඑළිය වසන්ත උදානය ආරම්භ වීමට ප්‍රථම තුරඟ තරග කිහිපයක් පසුගිය මාසය තුළ පවත්වා ඇති අතර, වසන්ත උදානයට සහභාගී වීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් විශාල පිරිසක් මේ වනවිට නුවරඑළියේ සංචාරක හෝටල් සහ නවාතැන් පහසුකම් ලබාදෙන ස්ථානවලින් නවාතැන් පහසුකම් වෙන් කරගෙන ඇති බව නුවරඑළිය සංචාරක හෝටල් හිමියන්ගේ සංගමයේ නිලධාරියෙක් පැවසීය.

වසන්ත උදානයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරනවාද යන්න නුවරඑළිය මහ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් අධීක්ෂණය කරන අතර, පැමිණෙන සංචාරකයන්ගේ ආරක්ෂාව උදෙසා නුවරඑළිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා විසින් විශේෂ ආරක්ෂිත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේ.


මෙම අවස්ථාවට නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මරුදපාණ්ඩි රමේෂ්වරන්, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් නන්දන ගලබොඩ, නුවරඑළිය නියෝජ්‍ය පොලිස්පති චන්දන අතුකොරාළ මහත්වරුන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

# නිල්ගල රක්ෂිතයට කැළි කසළ දැමීමෙන් වන සතුන්ගේ ජීවිත අවදානමේ

## ඇත් පැටවෙකුගේ හකු පෙදෙසේ අසාමාන්‍ය ගෙඩියක්

## ඇත් පැටවා නිරීක්ෂණයට 'රේඩියෝ කොලරයක්' නෑ

● නිදර්ශනී වික්‍රමසිංහ/ලුණුගල - ප්‍රසන්න පත්මසිරි



බිබිල, නිල්ගල ඖෂධීය වන රක්ෂිත ප්‍රදේශයේ බැහැර කෙරෙන කැළි කසල ආහාරය සඳහා පැමිණෙන ඇත් පැටවෙකුගේ හකු ප්‍රදේශයේ අසාමාන්‍ය ලෙස ගෙඩියක් හටගෙන තිබේ.

වයස අවුරුදු 08-10ත් අතර වයසක, දළ වැඩුණු මෙම ඇත් පැටවා උසින් අඩි 06ක් පමණ වන අතර හොඳින් වැඩුණු ශක්තිමත් සතෙකි.

ඒ අනුව මෙම ඇත් පැටවාගේ රෝගී තත්ත්වය සම්බන්ධයෙන් 'අද' කළ සොයා බැලීමේදී අනාවරණය වූයේ, වනජීවී දෙපාර්තුමේන්තුවේ ඌව කලාපයේ අඩවි භාර නිලධාරී, පශුවෛද්‍ය ධර්මකීර්ති මහතා විසින් මීට දින 03කට පමණ ඉහතදී ඇත් පැටවා නිරීක්ෂණය කර ප්‍රතිකාර ලබාදී ඇති බවයි.

ඒ අනුව මේ සම්බන්ධයෙන් සිදුකළ වැඩිදුර විමසීමේදී පශුවෛද්‍ය ධර්මකීර්ති මහතා සඳහන් කර සිටියේ, මෙම සත්ත්වයා සම්බන්ධයෙන් තවදුරටත් නිරීක්ෂණය කළ යුතුවන බවයි.

හකු පෙදෙසේ පවතින ගෙඩිය අසාමාන්‍ය ලෙස නිරීක්ෂණය වන බවත් ඒ අනුව ඒ සම්බන්ධයෙන් තවමත් නිශ්චිත ප්‍රකාශයක් කළ නොහැකි බවත් පැවසූ ඒ මහතා කෙසේ වුවද මෙම සත්ත්වයා නිරෝගී සුවයෙන් ශක්තිමත්ව සිටිනු දක්නට ලැබෙන බවද පැවසීය.

ඒ අනුව ඇත් පැටවා පිළිබඳ නිරන්තරයෙන් විමසිලිමත්ව කටයුතු කරන ලෙස තමන් අඩවි වනනිලධාරීන් දැනුම්වත් කර ඇති බවද පශු වෛද්‍යවරයා සඳහන් කර සිටියේය.

කෙසේ වුවද මෙහිදී පෙන්වා දිය යුතු වැදගත් කරුණක් ඇත. එනම්, වනයේ නිදහස් ලෙස වෙසෙන ඇත් පැටවෙකුට ප්‍රතිකාර කිරීම දුෂ්කර කටයුත්තකි. සත්ත්වයාගේ ගමන් මාර්ගය, රැඳීසිටින ස්ථාන නිරන්තරයෙන් නිරීක්ෂණයට ලක්කළ යුතු වන අතර ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති වනජීවී දෙපාර්තුමේන්තුවේ අඩවි භාර සීමිත නිලධාරීන් පිරිසකට එය තවත් දුෂ්කර කටයුත්තක් වනු ඇත.

ඒ අනුව මෙම ඇත් පැටවාට 'රේඩියෝ කොලරයක්' පලඳ ඔහුගේ ගමන් මාර්ග සහ හැසිරීම් නිරීක්ෂණය කිරීමට කටයුතු යෙදීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වගකීමක් නොවන්නේද? එය එසේ සිදු කරන්නේ නම් මෙම සත්ත්වයාට ප්‍රතිකාර කරනු ලබන පශුවෛද්‍යවරුන්ටද අදාළ ප්‍රතිකාර කටයුතු සඳහා වඩාත් පහසුවක් නොවන්නේද? ඒ අනුව තවත් වසර කිහිපයකින් ශක්තිමත්ව වැඩුණු නිරෝගී, දර්ශනීය හස්තියකු මෙරටට ඉතිරි කරගැනීමේ විශේෂ වගකීම විෂය භාර රාජ්‍ය ආයතන සතු වන බව අප අවධාරණය කරන්නෙමු.

මීට අමතරව පෙන්වා දිය යුතු තවත් වැදගත් කරුණක් නම් නිල්ගල ඖෂධීය වන රක්ෂිතයට මායිම්ව පිහිටි 'පුවක් පැළේ' වන ප්‍රදේශයට බිබිල නගරයෙන් හා ආශ්‍රිත ප්‍රදේශවලින් බැහැර කෙරෙන දිරන හා නොදිරන අපද්‍රව්‍ය දිනපතා බැහැර කිරීම මේ වනවිට සාමාන්‍ය තත්ත්වයක් බවට පත්ව ඇති බවයි. ඒ අනුව එම නොදිරන අපද්‍රව්‍ය ඇතුළු කැළි කසළ ආහාරයට ගැනීම සඳහා වනඅලි ඇතුළු වනසතුන් මෙන්ම විවිධ පක්ෂීන්ද පැමිණනු නිරන්තරයෙන් දැකගත හැකිය.

මෙම තත්ත්වය පිළිබඳ ප්‍රදේශවාසීන්ගෙන්ද 'අද' විමසීම් කළ අතර, එහිදී ඔවුහු සඳහන් කර සිටියේ, පොලිතීන් ඇතුළු නොදිරන ද්‍රව්‍ය ආහාරයට ගැනීම හේතුවෙන් වනසතුන් රෝගීව සිටිනු නිරන්තරයෙන් දක්නට ලැබෙන කරුණක් වන බවයි. එසේම දීර්ඝ කාලයක සිට මෙලෙස බැහැර කෙරෙන අපද්‍රව්‍ය ආහාරයට ගැනීම සඳහා වනසතුන් හුරුව ඇති බවද ඔවුහු පෙන්වා දුන්හ.

ඒ අනුව මෙම කැළි කසළ ගැටලුව දෙස ඉතා විධිමත්ව සහ වගකීම්සහගතව අවධානය යොමු කරමින් කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසද අප අදාළ ආයතන වෙතින් ඉල්ලා සිටිමු.

# ආබාධ සහිත පුද්ගලයින් 405 දෙනෙකු මානසික පීඩා නිසා සියදිවි හානිකරගෙන තිබෙනවා

## ජන හා සංඛ්‍යා ලේඛන නිලධාරී කේ.එස්. විජේසුන්දර

● චන්දන සමරවික්‍රම

මෙරට ආබාධ සහිත පුද්ගලයින් 405දෙනෙකු එම ආබාධ සහිත තත්ත්වය සමග ඇතිවූ මානසික පීඩා හේතුවෙන් සියදිවි හානිකරගෙන ඇති බව ජන හා සංඛ්‍යා ලේඛන නිලධාරී කේ.එස්. විජේසුන්දර මහතා අනාවරණය කළේය.

ඒ මහතා මේ බව අනාවරණය කළේ, ඊයේ (31දා) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ පැවැති දැනුවත් කිරීමේ වැඩසටහනකදීය.

එය 2019 වර්ෂයේ සමීක්ෂණ වාර්තාවක් මගින් මෙය උපුටාගත් බව හෙතෙම සඳහන් කළේය.

මෙහිදී ඔහු අනාවරණය කරන ලද්දේ මෙම තත්ත්වයට මුහුණපෑ පුද්ගලයන් 350 දෙනෙකු පුරුෂ පක්ෂයේ අය වන අතර ස්ත්‍රී පක්ෂය 50 දෙනෙකු වන බවත්ය.

2019 පෙබරවාරි මස 15 වැනිදායින් පසුව දෙසැම්බර් 31 කාලසීමාව දක්වා පුද්ගලයන් 3135ක් දෙනෙකු සියදිවි හානිකරගෙන ඇති අතර 736ක ප්‍රමාණයක් පිරිමි පුද්ගලයන් බව හෙතෙම සඳහන් කළේය.

එමෙන්ම මානසික ආබාධ සහ මානසික පීඩාවල් ඉවසා ගත නොහැකි වීමෙන් 2019 වසරේදී පුද්ගලයන් 272ක් සියදිවි හානිකරගෙන ඇති අතර එම සංඛ්‍යාවෙන් 208 දෙනෙකුම පුරුෂ පක්ෂය වන බව විජේසුන්දර මහතා ප්‍රකාශ කළේය.

මත්ද්‍රව්‍ය පානය කර එයට ඇබ්බැහිවූ පුද්ගලයන් 141 දෙනෙකු එම වර්ෂයේදී සියදිවි හානිකරගෙන ඇති අතර මෙම 141දෙනාගෙන් කාන්තාවන් දෙදෙනෙකු වාර්තාවන බවත්, මෙම දත්තවලින් අනාවරණය වන කරුනු අනුව පුද්ගලයන් 1917දෙනෙකු මියගොස් ඇත්තේ ගෙල සිරකර ගැනීම තුළින් බවද ඒ මහතා අනාවරණය කළේය.

එමෙන්ම කෘමිනාශක පලිබෝධනාශක සහ වස පානය කිරීම තුළින් පුද්ගලයන් එම වර්ෂයේදී 706 දෙනෙකු සියදිවි හානිකරගෙන ඇති බවත්, මුහුදට, ගංගා සහ ඇළදොළවලට පැන ස පුද්ගලයන් 105 දෙනෙකු සියදිවි හානිකරගෙන ඇති අතර ධාවනය වන දුම්රියවලට පැන සියදිවි හානිකරගත් සංඛ්‍යාව 123 දෙනෙකු වන බවත් ජන සංඛ්‍යා ලේඛන නිලධාරී කේ.ඇස්. විජේසුන්දර මහතා පවසයි.

# සොයා ගැනීමට මහජන සහාය පතයි



මොරටුව මෝල්පේ ද සොයිසා පාර අංක 379 A හි පදිංචිව සිටි ප්‍රියංක බුද්ධික යන අය පෙබරවාරි 25වැනි දින සිට ආගිය අතක් නොමැති බවට මොරටුමුල්ල පොලීසියට පැමිණිලි කර තිබේ.

අවසන් වරට දකින විට කළු ඉරි සහිත ලා අළු පැහැති කමිසයකින් සහ කළු පැහැති කොට කලිසමකින් සැරසී සිට ඇති බවත්, ඔහු පිළිබඳව යම් තොරතුරක් දන්නා අයෙක් වෙතොත් ළඟම ඇති පොලිස් ස්ථානයට හෝ 0761503280, 0701709198, 0777609262, 0754428916 ලීලානන්ද අල්විස් මහතාට ලබාදෙන ලෙස ඥතීහු ඉල්ලා සිටිති.

මොහු පිළිබඳව සත්‍ය තොරතුරක් ලබාදෙන අයෙකුට විශේෂ ත්‍යාගයක් පිරිනමන බවද ඥතීහු දන්වා සිටියි.

# හංගමු ගඟ මැණික් පතල් කැණීමට වෙන්දේසි කිරීමේ තීරණයක්

● රත්නපුර -ලසන්ත නිරෝෂණ පෙරේරා

හංගමු ගඟ මැණික් පතල් කැණීමට වෙන්දේසි කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය තීරණය කර ඇතැයි එහි සභාපති තිලක් වීරසිංහ මහතා පැවසීය.

ඊයේ 02දා මාධ්‍යයට ප්‍රකාශයක් සිදු කරමින් ඒ මහතා එසේ පැවසීය.

මේ පිළිබඳ වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා,

"නිවිතිගල දැල පාලම අසල සිට එරබද්ද දක්වා මීටර් 50 සහ 100 බැගින් වන කොටස් 53 ක් මෙලෙස මැණික් පතල් සඳහා වෙන්දේසි කිරීමට නියමිතය.

සිංහල අවුරුදු සමයෙන් පසු එම වෙන්දේසි කිරීම සිදු කිරීමට කටයුතු යොදා ඇති අතර විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් අනුව හංගමු ගඟ මැණික් පතල් කැණීමට වෙන්දේසි කිරීමට නියමිත බව පැවසේ. රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට සහ නිවිතිගල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට මේ ගැන දැනුම් දී තිබේ.

මෙරට ප්‍රධාන ගංගාවක් වන කළු ගඟේ හැරණියාවක කොටසද මැණික් පතල් කැණීමට බලපත්‍ර ලබාදී ඇති අතර එය ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන ඒකාබද්ධව අඩු ආදායම් ලාභීන්ද දායක කරගෙන සාර්ථකව සිදු කරමින් ඇති අතර කුඩා මැණික් ගල් කිලෝ පහක්, නිල් මැණිකක් ද එහිදී ලැබී තිබෙනවා." යැයිද පවසා සිටියේය.

රත්නපුර වාරිමාර්ග කාර්යාලයේ නිලධාරිනියක් සඳහන් කළේ ගංගාවල මැණික් පතල් කැණීමට අවසර ලබා දීමේදී වාරිමාර්ග කාර්යාලයේ නිර්දේශ ලබාගත යුතු බවට රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට දැනුම් දී ඇති බවයි. ගංගා ඉවුරු බාදනය වන ලෙස මැණික් පතල් සිදු කරන නිසා වාරිමාර්ග කාර්යාලයේ නිර්දේශය ලබා ගන්නා ලෙස දන්වා ඇතැයිද එම නිලධාරිනිය පැවසුවාය.

මේ අතර හංගමු ගඟේ සහ වේ ගඟේ මේ දිනවල සිදු කරන අනවසර මැණික් පතල් නිසා පාරිසරික හානියක් සිදු වෙමින් ඇතැයි ද ප්‍රදේශයේ මැණික් පතල් කිරීමට සම්බන්ධ නොවෙන අය පවසති. ඇතැම් පුද්ගලික ඉඩම්වලට ද හානි සිදු කරමින් අනවසර මැණික් පතල් සිදු වෙන බවට ගම්වාසීන් බලධාරීන්ටද දැනුම් දී තිබේ.

# බදුල්ලේ පවුල් 11,000කට වැසිකිළි පහසුකම් නොමැති බව හෙළිවෙයි


● හාලිඇළ - විජේරත්න රත්නායක

බදුල්ල දිස්ත්‍රික්කයේ පවුල් 11,000කට සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් නොමැති බව කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා පැවසීය.

බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී අදහස් දක්වමින් හෙතෙම මෙසේ පවසා සිටියේය. බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පැරණි ශ්‍රවණාගාරයේදී පෙරේදා (31දා) මෙම රැස්වීම පැවැත්විණි.

දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත පානීය ජලය හා සනීපාරක්ෂාව සම්බන්ධ වැඩසටහනක් පිළිබඳ එහිදී සිදු කෙරුණු ඉදිරිපත් කිරීමකට අදාළව කරුණු දක්වමින් අමාත්‍යවරයා පැවසුවේ අදාළ වැඩසටහන යටතේ පළමුව ගම්බද ප්‍රදේශවල දුප්පත් ජනතාවට සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබාදී අනතුරුව නගරවලට යෝජිත අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙසයි.

ගම්බදව හා වතු ආශ්‍රිතව නිසි වැසිකිළි පහසුකම් නොවීමෙන් ඇතැම් ප්‍රදේශවල එම ප්‍රජාව අවිධිමත් ලෙස මළ අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම නිසා ලෙඩරෝග පැතිරීම මෙන්ම ජල මූලාශ්‍ර අපවිත්‍ර වීමද සිදුවන බැවින් එවන් පවුල්වලට සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබා දීමට මෙවන් වැඩසටහන්වලදී ප්‍රමුඛත්වයක් ලබාදිය යුතු බවද අමාත්‍යවරයා පැවසීය.




# වැලිගම සමුපකාර තිබී හමුවූ පරිභෝජනයට නුසුදුසු පරිප්පු කිලෝ 3150ක් විනාශ කරයි

● මහේෂ් මලවර ආරච්චි

මාතර, වැලිගම, සමුපකාර සමිති වෙළෙඳ සැලේ පරිභෝජනයට නුසුදුසු පිළිකාකාරක සහිත පරිප්පු තොගයක් සොයාගෙන ඊයේ (01දා) එය විනාශ කිරීමට කටයුතු කළ බව වැලිගම පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්.එල්.එච් නිහාල් මහතා පැවසීය.

2020 ජූලි 15 වෙනිදා වැලිගම මහජන සෞඛ්‍ය නිලධාරි කාර්යාලයට ලැබුණු නිර්නාමික දුරකථන පණිවුඩයක් මත සිදුකළ වැටලීමකදී අදාළ පරිප්පු තොගය සමුපකාර සමිති වෙළෙඳ සැලේ පසුපස ගබඩාවේ තිබී 2020 ජූලි 15 වැනිදා පරිභෝජනයට නුසුදුසු සජීවි අජීවි ගුල්ලන් හා පුස් සහිත පරිප්පු ගෝනි 126ක් (පරිප්පු කිලෝ 3150) සොයාගෙන තිබෙන අතර පසුව මාතර අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව එම තොගය සාම්පල කොටසක් රස පරීක්ෂකවරයාට ඉදිරිපත් කර වාර්තාවක් ලබාගන්නා ලෙස මාතර අධිකරණය නියෝග කර තිබේ.

එහි වාර්තාව පෙරේදා (31දා) අධිකරණය වෙත ලැබීමෙන් අනතුරුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට එම පාරිභෝජනයට නුසුදුසු පරිප්පු තොගය තොගය විනාශ කරන ලෙස දුන් නියෝග මත ඊයේ (01දා) විනාශ කර තිබේ.




මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් වැලිගම පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා මෙසේ පැවසීය.

"2020 ජූලි 15වැනිදා අපේ ආයතනයට පැමිණෙනවා පුද්ගලයෙකු ඔහු වැලිගම සමුපකාර සමිති වෙළෙඳ සැලෙන් මිලදී ගත් යෝගට් 10ක් කල් ඉකුත් වෙලා තියෙනවා කියලා. ඒ අනුව අපි වැලිගම සමුපකාර සමිති වෙළෙඳ සැලට ගිහින් පරීක්ෂා කර බැලුවා. එහිදී තවත් කල් ඉකුත් වුන යෝගට් තිබී අත්අඩංගුවට ගෙන අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් සිටියදී අපට නාඳුනන දුරකථන ඇමතුමක් ලැබෙනවා එම ආයතනයේ යම් තැනක පරිභෝජනය නුසුදුසු පරිප්පු තොගයක් තියෙනවා කියලා.

එම ආයතනය නැවත පරීක්ෂාවට කිරීමේදී පසුපස ගබඩාවේ පරිප්පු ගෝනි 126ක කිලෝග්‍රෑම 3150ක් පරිභෝජනයට නුසුදුසු බවට සොයාගත්තා. මොවුන් නැවත සකස් කරලා වෙළෙඳ සැලට දාන්න හිතාගෙන ඉදලා තියෙන්නේ. ඒ අනුව අපි එම භාණ්ඩ තොගය අත්අඩංගුවට ගෙන එම ස්ථානයේම රඳවලා අහඹු ලෙස ගෝනි 126න් සාම්පල් අරගෙන අධිකරණය වෙත ඉදිරිපත් කළා. අධිකරණය හරහා රජයේ රස පරීක්ෂක වෙත එම සාම්පල යොමු කළා රස පරීක්ෂණ වාර්තාව. අධිකරණයට ලැබුණායින් පසුව ඊයේ දිනයේ මාතර අධිකරණයෙන් නියෝගයක් ලබාදුන්නා අදාළ පරිප්පු තොගය අපගේ අධීක්ෂණය යටතේ විනාශ කරලා අධිකරණයට වාර්තා කරන්න කියලා."

# යාපන ගොවීන්ගේ එළවළු දඹුල්ලට ලැබීමෙන් එළවළු මිල අඩුවීමක්



● එස්. කරුණාරත්න

උත්සව සමය ආරම්භයත් සමග යාපනය අර්ධද්වීපයේ ගොවීන් තම එළවළු අස්වැන්න දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට විශාල වශයෙන් රැගෙන ඒමත් සමග බොහෝදුරට ඉහළ ගොස් තිබූ එළවළු මිල ඊයේ (01දා) විශාල වශයෙන් පහත වැටී පාරිභෝගික ජනතාවට විශාල සහනයක් බවට පත්ව තිබේ.


දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට අප්‍රේල් පළමු වැනිදා වනවිට යාපනයේ ගොවීන් වගා කරන ලද අර්තාපල් අල, බීට්රූට්, මාළු මිරිස්, රතු ලූනු, වට්ටක්කා, අමුමිරිස් ආදී එළවළු රැගෙන විත් ආර්ථික මධ්‍යස්ථානය පුරවා ඇතැයි වෙළෙන්දෝ පෙන්වා දෙති.

යාපනය ප්‍රදේශ කිහිපයෙන් පැමිණි ගොවීන් පැවසුවේ, විශාල වශයෙන් යාපනයේ මෙවර එළවළු අස්වැන්න සාර්ථක නොවුණද දඹුල්ලේ දී ගොවීන්ට සාධාරණ මිලක් ලැබෙන නිසා තම අස්වනු දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට රැගෙන විත් අලෙවි කිරීම් සිදු කරන බවයි.

ඒ අනුව පසුගිය දින කිහිපයෙහි විශාල වශයෙන් ඉහළ ගොස් තිබූ අර්තාපල් අල කිලෝවක් රුපියල් 70 සිට 75 දක්වා මිලකටත්, බිට්රූට් කිලෝවක් රුපියල් 45 සිට රුපියල් 55 දක්වා මිලකට, අමුමිරිස් කිලෝවක් රුපියල් 110 සිට 130 දක්වා මිලකට, වට්ටක්කා කිලෝවක් රුපියල් 35 සිට 40 දක්වා මිලකට අලෙවි කෙරෙන අතර රුපියල් 500 ඉක්මවා තිබූ දේශීය රතු ලූනු කිලෝවක් මෙදින රුපියල් 100ත් 120ත් අතර අඩු මුදලකට අලෙවි වූ බව වෙළෙන්දෝ කියති.

යාපනේ සිට සිය අස්වනු රැගෙන ආ ගොවීන් සහ ව්‍යාපාරිකයන් කියා සිටියේ යාපනයේ එළවළු සඳහා විශාල ඉල්ලුමක් රටේ අනෙකුත් සෑම ප්‍රදේශයකින්ම පවතින බවය. එම නිසා සතුටින් එළවළු අලෙවි කිරීමට හැකිවන බවත් සිංහල දමිළ අලුත් අවුරුද්ද සඳහා ජනතාවට හැකි ආකාරයෙන් එළවළු සැපයීමට ඔවුන්ට හැකියාව පවතින බවය. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයෙකු වූ මුදිත බණ්ඩාර මහතා කියා සිටියේ, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට අප්‍රේල් පළමු වැනිදින යාපනෙන් එළවළු ලොරි පහළොවක් විස්සක් අතර ප්‍රමාණයක් ලැබී ඇති බවය.

අනෙකුත් ප්‍රදේශවලින් ලැබෙන එළවළුවලට වඩා ඉහළ ප්‍රමිතියකින් යුතුව යාපනයේ ගොවීන් තම නිෂ්පාදන වෙළෙඳ පොළට ගෙන එන බවත් මේ නිසාම ආර්ථික මධ්‍යස්ථානයේ සෑම තැනකම යාපනයේ ගොවීන්ගේ එළවළුවලින් පිරී ඉතිරී යන බවද සඳහන් කළේය.



# මන්දකට හසුවී ප්‍රතිකාර ලබා දෙමින් සිටි කඳුකර කොටියා ජීවිතක්ෂයට

● හැටන් - රංජිත් රාජපක්ෂ / ශාන් හුලංනුගේ

බෝපත්තලාව රජයේ සත්ත්ව ගොවිපොළේ පසුගිය 24වැනිදා මන්දකට හසු ව සිටියදී මුදාගත් කඳුකර කොටියා රන්දෙණිගල පශු වෛද්‍ය රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී පෙරේදා (31දා) මිය ගිය බව වනජීවී දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය අධ්‍යක්ෂ තාරක ප්‍රසාද් මහතා පැවසීය.

එම සත්ත්වයාගේ උදරය ප්‍රදේශයට දැඩි ලෙස තුවාල සිදු ව තිබීම නිසා කඳුකර කොටියා මිය ගිය බව වනජීවී පශු වෛද්‍ය අධ්‍යක්ෂවරයා පවසා සිටියේය.

අවු 10ක් පමණ වයසැති අඩි 8 පමණ දිගකින් යුත් හොඳින් වැඩුණු කඳුකර කොටියා පිරිමි සතෙකි.

එම සත්ත්වයා බෝපත්තලාව මැණික්පාලම ප්‍රදේශයේ රක්ෂිතයේ



දඩයම්කරුවන් විසින් අටවා තිබූ මන්දකට හසු වූ අවස්ථාවේදී මන්ද සවිකර තිබූ මුගුරද සමග කඩාගෙනවිත් බෝපත්තලාව රජයේ සත්ත්ව ගොවිපොළ ආසන්නයේ වැටී සිටියදී රන්දෙණිගල පශු වෛද්‍ය රෝහලේ වෛද්‍ය අකලංක පිනිදෙණිය මහතා ඇතුළු වනජීවී නිලධාරීන් විසින් සොයාගෙන තිබිණි.

අනතුරුව පශු වෛද්‍යවරුන් විසින් එම සත්ත්වයා නිර්වින්දනය කර දැඩි පරිශ්‍රමයක් දරා මුදා ගෙන රන්දෙණිගල පශු වෛද්‍ය රෝහලට රැගෙන ගොස් ප්‍රතිකාර ලබා දෙමින් සිටියදී මෙසේ මියගොස් ඇත.

මේ අතර කඳුකර කොටියා මන්දට හසු වූ ප්‍රදේශයේ සහ රක්ෂිතයෙහි දඩයම්කරුවන් විසින් අටවා තිබූ මදු විශාල ප්‍රමාණයක් ගලවා ඉවත් කිරීමට නුවරඑළිය වනජීවී කාර්යාලයේ නිලධාරීන් සහ බෝපත්තලාව රජයේ සත්ත්ව ගොවිපොළේ සේවකයන් පසුගිය දා කටයුතු කර තිබිණි.

# ලොරි රියැදුරු අනතුරකට ලක්කර පලාගිය රියැදුරු සොයා පරීක්ෂණ

## අනතුරින් රියැදුරු ජීවිතක්ෂයට

● මාතලේ - රවින්ද්‍ර විරාජ් අබයසිරි/ මාතලේ - ඇම්.ඩබ්ලිව්. සෝමරත්න

මාතලේ, කෝන්ගහමුල්ල ප්‍රදේශයේදී අනතුරකට ලක්ව ඇති ලොරි රථයක් පරීක්ෂා කරමින් සිටි ලොරි රථයේ රියැදුරු මාරක අනතුරකට ලක්කර ධාවනය කළ ලොරි රථය හා රියැදුරු අත්අඩංගුවට ගැනීම සඳහා පරීක්ෂණ ආරම්භ කර ඇති බව මාතලේ පොලීසිය පවසයි.


මෙලෙස අනතුරින් ජීවිතක්ෂයට පත්වූයේ, ගිරාදුරුකෝට්ටේ, මීගහහේන ප්‍රදේශයේ පදිංචිව සිටි තිදරු පියෙකු වන ජනක නුවන් කුමාර (අවු.38) නමැත්තෙකි.

මහියංගණයේ සිට මාතලේ හරහා මහනුවර දෙසට ඒ-9 මාර්ගයේ වැලි ප්‍රවාහනය කරමින් තිබු ලොරි රථයක් මාතලේ කෝන්ගහමුල ප්‍රදේශයේදී අනතුරකට ලක්ව ඇති අතර, එම ලොරි රථයේ රියැදුරු ලොරියෙන් බැස එම රථයේ ඉදිරිපස රෝදය පරීක්ෂා කරමින් සිටියදී පිටුපසින් පැමිණි වැලි ප්‍රවාහනය කළ ලොරි රථයක් අනතුරට ලක්වීමෙන් රියැදුරු මරණයට පත්ව ඇති බව පරීක්ෂණවලදී අනාවරණය විය.

සිද්ධිය සම්බන්ධයෙන් මාතලේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චානක ද සිල්වා මහතාගේ මෙහෙයවීමෙන් නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# සිංහරාජ වනාන්තරයේ සිටි වනඅලියෙකු රක්වාන -කලවාන මාර්ගයේ සැරිසරයි

● රත්නපුර - ලසන්ත නිරෝෂණ පෙරේරා



සිංහරාජ වනාන්තරයේ ඉතිරිව සිටින වනඅලින් දෙදෙනාගෙන් එක් අලියෙකු පෙරේදා (31දා) පස්වරුවේ සිට රක්වාන - කලවාන මාර්ගයේ හතරේ කණුව ප්‍රදේශයේ සැරිසරා තිබේ.

මේ වසරේදී මාර්ගය ආසන්නයට අලියා පැමිණි පළමු අවස්ථාව මෙය බව ප්‍රදේශය අවට පදිංචිකරුවෝ පවසති.

අලියා මාර්ගය ආසන්නයේ තේ වත්තක සිටිනු මාර්ගයේ ගමන් කළ වාහනවල සිටි අයත් එම ප්‍රදේශයේ තේ වතුවල සේවයට ගිය පුද්ගලයින් විසින්ද දැක තිබෙන බවත්, කෙසෙල් ගස් කිපයක් අලියා විසින් විනාශ කර තිබූ බව ප්‍රදේශවාසීහු පවසති.

රක්වාන රජවක ප්‍රදේශයේ වනජීවී කාර්යාලයේ නිලධාරීන් රාත්‍රියේදීම මෙම ප්‍රදේශයට පැමිණ තිබේ.

සිංහරාජයේ සිදුවෙතැයි කියන පාරිසරික හානි ගැන පසුගිය දිනවලදී ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇතිවීමෙන් පසු මෙම අලි දෙදෙනා ගැනද අවධානය යොමුවිය.

මෙයට වසර හත අටකට පෙරදී සිංහාරාජයේ අලි තිදෙනෙකු සිටි අතර ඉන් එක් අයෙකු ගැන මේ වනවිට තොරතුරක් නොමැත.

දැනට සිටින සද්ධන්ත කුලයේ අලි දෙදෙනා එකට නොසිටින බවත් උන් වෙන වෙනම සිටිනු නිරීක්ෂණය කර ඇතැයි වනජීවී නිලධාරීහු පවසති. මෙම අලි දෙදෙනා වරින් වර සිදුකළ ප්‍රහාර නිසා පුද්ගලයන් 14දෙනෙකු මියගොස් ඇතැයිද ගම්වාසීහු පවසති.

ලංකාවේ තෙත් කලාපීය වනාන්තරයක් තුළ ජීවත්වෙන සද්ධන්ත කුලයේ අලි දෙදෙනා මොවුන් පමණක් බව පාරිසරවේදීහු සඳහන් කරති. ශ්‍රීපාද අඩවියේ ද වනඅලින් සිටිනමුත් උන් කුරු අලින් බව හඳුනාගෙන තිබේ. පසුගිය දිනවල පාරිසරික හානි ගැන අවධානය යොමුවූ ප්‍රදේශයද මෙම අලියා පෙරේදා සැරිසැරූ ප්‍රදේශයට ආසන්නව පිහිටා තිබේ.

# කෝවිඩ් ආසාදිත වීමෙන් මියගිය සිවුදෙනෙකුගේ සිරුරු මහනුවර රෝහලේ

● ෂේන් සෙනෙවිරත්න

කෝවිඩ් වෛරසය ආසාදනය වීම හේතුවෙන් මියගිය පුද්ගලයන් හතරදෙනකුගේ මෘත දේහ මහනුවර ජාතික රෝහලේ විශේෂිත වූ මෘත ශරීරාගාරයේ තැම්පත් කොට ඇති බව රෝහල් ආරංචි මාර්ග සඳහන් කරයි.

වත්තේගම ප්‍රදේශයේ පදිංචි 48 හැවිරිදි කාන්තාවක, පන්විල පදිංචි 67 හැවිරිදි පිරිමි පුද්ගලයෙකු අලවතුගොඩ පදිංචි 44 හැවිරිදි පිරිමි පුද්ගලයෙකු සහ කටුගස්තොට සෙනරත්ගම පදිංචි 80 හැවිරිදි කාන්තාවක මෙසේ මියගොස් ඇති බවයි. රෝහල් බලධාරීන් පවසන්නේ.

මහනුවර ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති මොවුන් සම්බන්ධයෙන් සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණ වාර්තා ඊයේ (01දා) ලැබී තිබූ අතර එම වාර්තාවලට අනුව ඔවුන්ට කෝවිඩ් වෛරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී තිබේ.

# වතුපිටිවල ආයෝජන කලාපයේ කර්මාන්තශාලාවක කෝවිඩ් ආසාදිතයන් 20ක්

● වාරණ - ආනන්ද ඉ ජයකොඩි

වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ කර්මාන්තශාලාවක කෝවිඩ් 19 වෛරස ආසාදිතයන් විස්සක් දක්වා ඉහළ ගොස් ඇති බව අත්තනගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවසයි.

මෙහි කෝවිඩ් 19 වෛරසය ආසාදිතයන් නමදෙනෙකු හමු වීමෙන් අනතුරුව කරන ලද පී.සී.ආර්.පරීක්ෂණවලට අදාළ වාර්තා අනුව තවත් ආසාදිතයන් එකොළොස් දෙනෙකු හමු වීම හේතුවෙන් එසේ ආසාදිතයන් විස්සක් දක්වා ඉහළ ගොස් ඇති බව වතුපිටිවල මහජන සෞඛ්‍ය පරීක්ෂක ඩබ්ලිව් ඇල්. පී.මංජුල මහතා ඊයේ (01දා) උදෑසන පැවසීය.

මේ අනුව ඔවුන්ගේ පළමු ආශ්‍රිතයන් සොයා ගැනීමට තවදුරටත් පරීක්ෂණ පවත්වාගෙන යන බවද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වැඩිදුරටත් පවසා සිටියේය.

# ක්‍රීඩාංගණයකට ඉඩමෙන් කොටසක් දුන්නැයි සහෝදරයෙකු ඝාතනය කළ ඥාති සහෝදරයා දැලේ

● එස්. කරුණාරත්න

වොලිබෝල් ක්‍රීඩා කිරීමට පවුලට හිමි ඉඩමක බිම් කොටසක් ලබාදීමේ සිද්ධියකට උරණව තියුණු ආයුධයකින් පහරදී තම සහෝදරයෙකු ඝාතනය කළ පුද්ගලයෙකු පෙරේදා (31දා) අත්අඩංගුවට ගත් බව දඹුල්ල පොලීසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්වූයේ, මැණික්දෙන ප්‍රදේශයේ පදිංචි පි . ජී .චමින්ද ජයතිස්ස (අවු.42) නමැත්තෙකි.

දඹුල්ල පොලිස් බලප්‍රදේශයේ මැණික්දෙන ප්‍රදේශයේ එකම පවුලේ සහෝදරියන් දෙදෙනෙකුගේ දරුවන් දෙදෙනෙකු අතර ඇතිවූ උණුසුම් තත්වයක් දුරදිග ගොස් දරුවෙකු මගින් තියුණු ආයුධයකින් කළ පහරදීමෙන් අනෙක් සහෝදරයාට බරපතළ තුවාල ලබා රෝහල්ගතව සිටියදී පෙරේදා (31දා) මහනුවර රෝහලේදී ජීවිතක්ෂයට පත්ව තිබේ.

අත්අඩංගුවට ගෙන ඇත්තේ ඔහුගේ පුංචි අම්මාගේ පුතෙකුව වන 42 හැවිරිදි පුද්ගලයෙකි.

මෙම පවුලේ පිරිසට අක්කර පහක් පමණ බෙදා වෙන් කොට නොමැති ඉඩමක් පවතින බවත් ගමේ තරුණ පිරිසට ක්‍රීඩා කිරීම සඳහා ස්ථානයක් නොමැති නිසා මියගිය පුද්ගලයා ඉඩමෙන් කොටසක් ගමේ තරුණ සංවිධානයට වොලිබෝල් ක්‍රීඩාංගණයක් තනා ගැනීම සඳහා ලබාදී ඇති අතර, මෙම ඉඩම ලබා දීම සම්බන්ධයෙන් උරණ වූ මියගිය පුද්ගලයාගේ සැකකාර සහෝදරයා බෙදා වෙන්කොට නැති ඉඩම් වෙනත් පුද්ගලයන්ට ලබා දෙන්නේ කෙසේදැයි දැඩි ලෙස ප්‍රශ්න කරමින් මියගිය පුද්ගලයා සමග ඇති වූ බහින් බස්වීමක් දුරදිග යෑමෙන් ඝාතනය සිදුවී ඇති බවද පරීක්ෂණවලදී අනාවරණය විය.

සැකකරු දඹුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

සිද්ධිය සම්බන්ධයෙන් දඹුල්ල සහකාර පොලිස් අධිකාරී ඒ.එස්. කේ. බණ්ඩාර මහතාගේ උපදෙස් පරිදි දඹුල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක එස්.පී. එදිරිසිංහ මහතා ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.



මහනුවර රජ පරපුරට සෙවන දුන් රජ මාලිගය - අද

# මහනුවර රාජධානියේ රජ මාලිගය සහ අවසාන රජ පෙළපත

● සටහන සහ සේයාරූ-ලාල් ජයසුන්දර

**ශ්‍රී ලංකාවේ අවසාන රජු හෙවත් වඩිග රජා යැයි ජනතාවගේ දැඩි අප්‍රසාදයට ලක්වූ රජෙකු ලෙස ප්‍රචලිත ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සම්බන්ධයෙන් ඇසෙන පුවත් සමග, මේ එකී රසබර අතීතයක මතක සටහන් අවදි කිරීමකි. එදා රජ මාලිග සංකීර්ණය ගොඩනැගිලි 18කින් පමණ සමන්විත වන්නට ඇතැයි පැවසේ. එහෙත් ඉංග්‍රීසීන් විසින් ගිනි තබා විනාශ කළ නිසා එයින් යම් ප්‍රමාණයක් විනාශ වී ඇත. රජමැදුර, මැදවාසල, පල්ලෙවාසල, මඟුල් මඩුව, ජයතිලක මණ්ඩපය, උළුපැන්ගේ සහ දළදා මැදුර පැරණි සහ නව මාලිග සංකීර්ණය දළදා මැදුරු සංකීර්ණය තුළ දැකිය හැකි සුවිශේෂී ස්ථාන අතර වැදගත් තැනක් ගනියි.**

ශ්‍රී වික්‍රම රාජසිංහ රජ මැදුර දිග අඩි 140ක් පමණ වන අතර, පළල අඩි 50ක් පමණ වෙයි. මාලිගය අනෙක්පස දිග අතට දිවෙන ආලින්දයකි. මාලිගයේ විශාල කාමර තුනක් සහ කුඩා කාමර තුනක් තිබෙන්නට ඇතැයි පුරාවිද්වත්හු අනුමාන කරති. ඉදිරිපස දොරටුව ප්‍රමාණයෙන් අඩි 8ක් පමණ විශාලය. මාලිගයට ඉහළ මාලයක් තිබූ බවට අනුමාන කරන සාක්ෂියක් ලෙස විද්වත්හු පෙන්වා දෙන්නේ අදටත් එහි ඉතිරිව ඇති පියගැට දෙකයි.

වහල පෙති උළුවලින් සැකසී ඇත. රජවරුන්ට විදේශීය බලපෑම් එල්ලවන අවස්ථාවන්හිදී මාලිගයටද ප්‍රහාර එල්ලවූ බවට ඉතිහාසඥයෝ පවසති. වරින් වර නවීකරණයට ලක්වීම නිසා මුල් අවස්ථාවන් දැකගත නොහැක. ඒ අතර රජ මාලිගාවේ අද දක්නට ඇති වහල 1765 ඕලන්ද සම්ප්‍රදාය අනුව ප්‍රතිසංස්කරණය කරන්නට ඇතැයි මතයකි.

මාලිගයේ ආරක්ෂාව සඳහා මාලිගය වටා පවුර, දිය අගල සහ මඩ අගලක් විය. එය දළදා මාලිගය ඉදිරිපස සිට ශ්‍රී විෂ්ණු දේවාලය දක්වා පැතිර තිබී ඇත. අදටත් එම අගල දැකිය හැක.

## මඟුල් මඩුව

රජ මාලිගය අසලම පසුපසින් මඟුල් මඩුව පිහිටා ඇත. රජුට රාජකීය අමුත්තන් හමුවීම සඳහා මඟුල් මඩුව සුවිශේෂී ස්ථානයක් විය. එහි තිර හතක් පසුකර ගිය තැන රජුගේ ආසනය තිබී ඇති අතර, අදටත් එම ස්ථානයේ බිම හතරැස් කොටුවක් ලෙස ඉතිරිව තිබේ.

1857 එංගලන්තයේ හත්වන එඩ්වඩ් රජුගේ ලංකාගමනය නිසා මහනුවර නගරයේ වෙනස්කම් රැසක් සිදුකර ඇත. එහිදී මඟුල් මඩුවද වෙනස් කිරීමට පියවර ගෙන ඇත්තේ රාජකීය උත්සවයට සූදානමක් වශයෙනි. එහි පැවති දිග වැඩිකර කණු ප්‍රමාණයද 16න් වැඩිකර තිබේ. මඟුල් මඩුවේ පෙර පැවති කණු ගණන 48කි. සුදු පාලකයන් විසින් එයට එකතු කළ කණු හතර නිසා එය 64 දක්වා වැඩි විය. සුදු පාලකයන් ඉදිකළ කොටසේ බිම, පෙර පැවැති ගොඩනැගිල්ලේ බිමට වඩා පහළින් සිමෙන්තියෙන් සකස් කර තිබේ.

ඒ අතර පරිශ්‍රය තුළ තිබූ වෙනත් රාජකීය ගොඩනැගිලි කඩා විනාශ කරන්නට ඇතැයිද විශ්වාස කෙරේ. මඟුල් මඩුව දෙපස ශාන්ති මණ්ඩපය තිබී ඇත. එය රජුට ශාන්තිකර්ම කිරීමට යොදාගෙන ඇතැයි පැවසේ.

## මහවාසල


රජවාසල තුළ මහමැදුර හෙවත් මහවාසල විය. එහි සැතපෙන කුටි, බිසෝ කුටි, සළු මණ්ඩපය මෙන්ම අමුත්තන්ගේ කුටි ආදියද විය. ඇතැමුන් පවසන්නේ රජතුමා මහවාසලේ නොසිට ආරක්ෂාව වෙනුවෙන් වෙනත් කිසිවෙකු නොදන්නා ස්ථානයන්හි රාත්‍රී කාලය ගත කළ බවකි.

රජ මාලිග ගොඩනැගිල්ල මහනුවර යුගයේ රාජ මාලිගයක ස්වභාවය හඳුනා ගැනීමට අදටත් ඉතිරිව පවතින හොඳම සාක්ෂියක් ලෙස විද්වත්හු දක්වති.

## වායු උත්පාදන කම්පනය

රජුගේ මුළුතැන්ගෙය තුළ පිසින ආහාර අනුභවයේදී රජුට සිසිල් පවන් සැලීම සඳහා සකස් කරගත් වායු උත්පාදන ක්‍රමයක මතකයක් අදටත් මහනුවර රාජසිංහ මාලිගයේ දැකිය හැකිය. එය අඩි 21ක් පමණ දිග පරාලයකට සවි කළ, ඉතා ඝනකම් රෙද්දකින් අඟල් 10ක් පමණ වන සේ පහළින් රැළි පටියක් අල්ලන ලද අඩි 4ක් පමණ උස තිරයක් වැනි නිමාවකි.

එහි දෙපැත්තේ ඉහළ සිට බිම දක්වා ලණු දෙකක් සවිකර ඇත. එය දෙපසට සෙලවිය හැකි ආකාරයෙන් සකස් කර තිබේ. මෙහා පැත්තේ සිටින දෙදෙනා වේගයෙන් එය මේ පැත්තටත්, එහා පැත්තේ සිටින දෙදෙනා එහා පැත්තටත් සෙලවීමෙන් එයින් ඇතිවන සුළඟ රජුගේ දාහය නිවා දමමින් සිසිලස ලබා දී ඇත.



ඩේවි දුටු මහනුවර රජ මාලිගය-එදා

## ශ්‍රී වික්‍රම සහ බිසෝවරු

ඉන්දියානු කුමාරියන් සරණපාවා ගැනීමේ ක්‍රමය මෙරට රජ පෙළපත් තුළ දෙවන රාජසිංහ රජුගෙන් ආරම්භ විය. එය බ්‍රිතාන්‍ය ජාතිකයන් මෙරට යටත් කරගන්නා තුරු ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දක්වා පැවති ක්‍රමයකි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ බිසෝවරුන් අතර වෙන්කත රෙංගමාල් අගබිසව වූවාය.

එනිසා රජු රජ මාලිග පරිශ්‍රයේ නතර වී සිටියේය. බිසෝවරුන්ට වෙනම මාලිගා වෙන් විය. අගබිසව වෙනුවෙන් මැදවාසල වෙන්කර ඇත. එය වඩාත් උස් නොවූ සහ මැදමිදුලකින් යුතු මැදුරකි. එතුළ බිසවට කැසිකිළි කටයුතු සඳහා පැවැති පහසුකම් අදටත් දැකිය හැක.

## රජුටත් නොඇරෙන බිසවගේ මාලිගය

මෙහි මැදවාසලේ දොරටුව පිටතින් අගුල් දැමිය නොහැකිය.එහි ඇතුළතින් පමණක් අගුල් දැමිය හැකි දොරකි. ඇතුළත සිටින ඇයගේ කැමැත්ත ඇතොත් පමණක් පිටත සිටින අයට එම දොර විවෘත වෙයි.

රජතුමාට වුවද දොර විවෘත නොකර සිටීමට බිසවට තිබූ අයිතිය එයින් තහවුරු වෙයි. රජුට අගබිසව හමුවීමට යායුතු නම් එයට පෙර ඔහු විසින් මාලිගාවේ සේවිකාවක අත පලතුරු පිරවූ දැකුම්කළු වට්ටියක් යැවිය යුතුය. බිසව එය භාරගත්තේ නම් රජුට එහි යා හැකිය. එදින බිසවට යම් කායික හෝ වෙනත් අපහසුතාවක් ඇතොත් එය ප්‍රතික්ෂේප කළේ නම් රජුට වුවද බිසව හමුවීමට යා නොහැකිය. තවද එම ප්‍රදේශයට වෙනත් කිසිවෙකු ඇතුල් වීමද දඬුවම් ලැබිය යුතු වරදකි.

## රාජකීය අන්තඃපුරය

දළදා මාලිගය පසුපස පිහිටි පල්ලේවාසල රජුගේ අන්තඃපුර බිසෝවරුන්ට වෙන් විය. එය මැදවාසලට අනෙක් පසින් ආසන්නව පිහිටා ඇත. එහි දැනට ජාතික කෞතුකාගාරය පවත්වාගෙන යයි. ඇතැමුන් පවසන්නේ එදා රජු හමුවීමට පැමිණෙන අමුත්තන්ට මෙම පල්ලේවාසල වෙන්වූ බවකි. එය මැදමිදුල් දෙකකින් යුතු විශාල මැදුරකි. එහි තිබූ දැව කණු වෙනුවට ගඩොල් කණු යොදා ඒවා මඟුල් මඩුවේ ප්‍රතිසංස්කරණයේදී භාවිතයට ගත් බවද පැවසේ.

මෙම ගොඩනැගිලිවල ජනෙල් දැවයෙන් සහ දැව බීරළු යොදා කුඩා ප්‍රමාණයට සකස් කළ ඒවා වීමද විශේෂය.

රජුට අවනත නොවන අන්තඃපුර කාන්තාවන් නුවර වැව මැද ඇති දූපතේ සිරකර තැබී යැයිද පැවසේ. එහෙත් රජු තමන්ට විවේක සුවයෙන් පසුවීමට මෙම දූපත ඉදිකළ බව ඩොයිලි දක්වයි. එය ජයතිලක මණ්ඩපය නමින් හැඳින්වෙයි.

## රන්දෝලි සහ රිදීදෝලි

අගබිසව රන්දෝලියේ ගමන් ගියාය. එනිසා ඇය රන්දෝලිය වූවාය. දෙවන බිසවට ගමන් සඳහා වෙන්කර තිබුණේ රිදී දෝලියයි. ඇය රිදෝලිය වූවාය. තෙවැනි බිසව යකඩ දෝලියේ ගමන් ගියාය. එනිසා ඇය යකඩදෝලිය ලෙස ප්‍රචලිත වූවාය.

## රජ පවුලේ සාමාජිකයෝ

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ බිසෝවරු සමග ඉන්දියාවෙන් පැමිණි මලබාර් කාන්තාවන්ට මලබාර් නිවස නවාතැන විය. ඔවුන් විසූ පෙදෙස රජ දවස කුරුප්පේ වීදිය නම් විය. එහෙත් ඉංග්‍රීසි පාලකයන් සමයේ එම වීදිය මලබාර් වීදිය සහ නිවස මලබාර් නිවස නම් විය. මෑතකාලීනව එය හිටපු මහ ඇමතිවරයාගේ නිල නිවස ලෙසද භාවිත විය.

රජ පවුලේ සාමාජිකයන්ට දිය නෑම වෙනුවෙන් උළුපැන්ගේ ඉදි විය. එයට විදේශීය පාලකයන්ගේ අවශ්‍යතාවන්ට යොදාගත් අතර, පසුකාලීනව එය සංවර්ධනය කර තිබේ. එය රාජකීය පවුලේ අයට දිය නෑම සඳහා පමණක් වෙන් විය.

## රාජකීයයන්ගේ ජලස්නානය

රජවරුන්ගේ ජලස්නානයට අවශ්‍ය පහසුකම් මාලිගය තුළ සම්පාදනය වී තිබුණි. එහෙත් පිටතට ගොස් එළිමහන් ස්ථානයක ජලස්නානය කළයුතු යැයි රාජකීය වෛද්‍යවරයා උපදෙස් දුන් විට රජු රජපිහිල්ලට ගොස් ජලස්නානය කළේය. අදත් රජපිහිල, නුවර, අම්පිටිය මාර්ගයේ කෙටි දුරකදී දැකිය හැකිය.

## රජුගේ වෙනත් මාලිගා

මහනුවර රජවරුන්ට ආරක්ෂාව සඳහා වෙනම මාලිගා පිටස්තර තැන්හි තිබුණි. එකක් කුණ්ඩසාලේය. අනෙක හඟුරන්කෙතය. ඒවා ගමන් මාලිගා ලෙසද ජනතාව දක්වති. ඒ අතර ආරක්ෂාව සඳහා වෙන් වුණු මාලිගාවන් විය. නිල්ලඹ එකකි. හඟුරන්කෙත මාලිගය සෙනරත් රජු විසින් ඉදිකළ එකකි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පසුකලෙක තමන්ට සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කර තිබේ. කුණ්ඩසාලේ රජ මාලිගාව 1804දී ජොන්සන් නමැති ඉංග්‍රීසි සෙන්පතියෙකු විසින් ගිනි තබා විනාශ කළේය. අද එතැනද හිස් භූමියකි. නිල්ලඹ මාලිගය තිබූ තැන නටබුන් ඉතිරිව තිබුණද නිල්ලඹ ජල විදුලිබලාගාරය සමග ජනතාවගෙන් දුරස් විය.

කෙසේ හෝ මෙසේ කිනම් මාලිගයකට ගියද රජතුමාගේ ආරක්ෂාව වෙනුවෙන් මාලිගා තැන තැන ඉදිව තිබුණි. ගමන් මාලිගා යනුවෙන්ද ඇතැම්හු මේවා හඳුන්වති. රජු ගත කරන්නේ කිනම් මාලිගාවේද යන්න කිසිවකු දැනසිටියේ නැත. අඩුම තරමින් දෝලාව ඔසවාගෙන යන අය පවා රජු සිටින්නේ කිනම් දෝලාවකදැයි නොදනී. එනිසාම රජු නතර වන්නේ කිනම් මාලිගයේ දැයි ඔවුන්ට නොදැනෙන සේ ආරක්ෂක කටයුතු සංවිධානය විය.

## මුලාදෑනි මණ්ඩපය

රජතුමා හමුවීමට අමුත්තෝ නිතර පැමිණෙති. පැමිණෙන නිලදරුවන් වෙනුවෙන් මුලාදෑනි මණ්ඩපය ඉදිකර තිබුණි. එහිදී ඔවුන්ට මුහුණ සෝදා පිරිසුදු වීමට දිය පොකුණක් එය ඉදිරිපිට සකස්කර තිබුණි. රජු හමුවීමට පැමිණෙන අමුත්තන්ට දින කිහිපයක් රජුගෙන් කැඳවීමක් ලැබෙනතුරු රැඳී සිටීමට සිදුව තිබේ. එවැනි අවස්ථා සඳහාද මෙම මණ්ඩපය භාවිත කර ඇත.

මෙම ගොඩනැගිල්ල සිමෙන්ති, හුණුවැලි බදාමයෙන් නිමවන ලද බොරදම් වේදිකාවක් මත ඉදිකර ඇත. එහි මඟුල් මඩුවේ මෙන් දැව කණු 24කි.

එදා එතැන තිබූ පොකුණ අද එහි නැත. දහඅට වන සියවසේ මහා බ්‍රිතාන්‍යයේ ආදිපාදවරයා ලංකාවට පැමිණීම සිහිපත් කරමින් ලංකාවේ කෝපි වගාවේ නිරත වැවිලිකරුවන් විසින් එහි වතුර මලක් සහිත ස්මාරකයක් සකස් කළ අතර, අදටත් එය පවතී.

## රාජකීය ගබඩා

උඩ ගබඩාව, අරමුදල් ගබඩාවද ඒ පරිශ්‍රයේ විය. රජුගේ ආයුධ රන් ආයුධ මණ්ඩපයේ තැන්පත් කර තිබුණි. මුද්දර මණ්ඩපය රාජකීය මුද්‍රා ආදිය වෙනුවෙනි. වන්දිභට්ටයන් ගායනා සඳහා යොදාගත් කවිකාර මඩුව අදටත් ඉතිරිව ඇත.

## දුක කියන ගණ්ඨාරය

තම ප්‍රාදේශීය ප්‍රධානීන්ගෙන් සාධාරණය ඉටු නොවූ තැන ජනතාවට රජු වෙත තම දුක්ගැනවිලි කීමට නාථ දේවාලය කෙළවර බිමේ ඝණ්ටාරයක් විය. එළාර රජුගෙන් පසු එවැන්නක් ගැන සඳහන් වන්නේ මහනුවරදී පමණක් යැයි ඉතිහාසඥයෝ පවසති. එය යුක්තිය පසිඳලීම වෙනුවෙන් ජනතාවට නාද කළ හැකි එකකි.

## නිලමේ වලව්

නිලමේවරුන්ගේ වලව් මාලිග පරිශ්‍රයට සමීපව පිහිටා තිබුණි. ඒ අතර යටිනුවර වීදියේ දෙහිගම වලව්ව අද වෙළෙඳ ස්ථානයකි. ඇහැලේපොළ වලව්ව මහනුවර රිමාන්ඩ් බන්ධනාගාරයකි. පිළිමතලාවේ වලව්ව ජනාධිපති මන්දිරයයි. දුනුවිල වලව්වේ මහනුවර මහ නගර සභාව පැවැත්වෙයි.

## රජු අත්අඩංගුවට පත්වීම

දුම්බර මැද මහනුවර බෝමුරේ මැදයාය උඩුපිටිය ආරච්චිලාගේ නිවසේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සැඟව සිටියදී සුදු හමුදාව දැක බියට පත් ළමයෙකුගේ මගපෙන්වීම නිසා රජ පවුල බ්‍රිතාන්‍යයන්ගේ අත්අඩංගුවට පත්විය.

"රජු අත්අඩංගුවට ගත් පසු සිංහල ජනතාව ඔවුන්ට හිරිහැර කර තිබෙනවා. කණෝ තිබුණු අරුංගලය පවා කඩාගෙන එයින් ලේ ගලා තිබෙනවා. රජුගේ රසඥතාව මහනුවර වැව ඉදිකිරීමෙන් දැකිය හැකිය. විවේක සුවය සඳහා ජයතිලක මණ්ඩපය ඉදිවිය.," බ්‍රිතාන්‍ය පාලකයන් වරින් වර එසේ සටහන් යොදා ඇත.


අරුංගලය කඩා ගැනීම නිසා තුවාල වූ කණෙන් ගැලූ ලේ සහිත හැට්ටය අදටත් කොළඹ ජාතික කෞතුකාගාරයේ දැකිය හැකිය.

එසේම 1811 ජනවාරි 25වැනි දින ඩොයිලිගේ දිනපොතේ සටහනකට අනුව මහනුවර රජ මාලිගයේ යම් භූත දෝෂයක් හේතුවෙන් තිහක් පමණ දෙනා මිය ගොස් ඇති බව දක්වයි. මෙම යක්ෂ දෝෂයෙන් බේරීම සඳහා රජු කුණ්ඩසාලේ මාලිගයට ගොස් ඇතැයිද පැවසේ. රජුට කුඩා දියණියක්ද සිටියාය. එම දියණියත්, කිරිඅම්මාත් එම දෝෂයෙන් මිය ගොස් ඇති බවද ඩොයිලි දක්වයි. ඩොයිලිට ඔහුගේ ඔත්තුකරුවන් පවසා ඇත්තේ රජ මාලිගයේ දොරටු නිතර ඇරෙන වැසෙන බවකි.

## රජකම් කළත් කළකම් පල දීම

රජුගේ සිරුරට අත තැබිය හැකි පුද්ගලයන් තිදෙනෙකි. ඒ, අත්පා දෝවනයට ජලය සපයන දියවඩන නිලමේ, රජුට සළුපිළි ඇන්දවීම භාරව සිටි සළුවඩන නිලමේ සහ රාජකීය වෛද්‍යවරයාය. එහෙත් රජු ඉංග්‍රීසින්ට යටත්වූ පසු ඔහු අල්ලා ගැනීමට උදව් කළ මුලෑදෑනින්, "මේ ඌරා වැල්පටකින් ගැට ගසාපියව්" යනුවන් නියෝග දෙන තරමට රජු හෑල්ලුවී ඇතැයි පැවසේ. 'රජකම් කළත් කළකම් පල දෙන්නේ' එසේ යැයි උඩරට ජනතාව අතර කතාවක් ඇත.

ඉංග්‍රීසීන් රජු මත්පැනට පුරුදු කර ඇතැයිද සඳහන් වේ. රජු පවසා ඇත්තේ "පරිස්සම් වෙන්න. ඇහැලේපොළ සහ මොල්ලිගොඩගෙන් පරිස්සම් වෙන්න. ඔවුන් මා රැවටුවා." යනුවෙන් යැයි දොස්තර හෙන්රි මාෂල් දක්වා ඇත.



මලබාර් කාන්තාවන්ගේ කණකර - මහනුවර ජාතික කෞතුකාගාරය



ශ්‍රී වික්‍රම රාජසිංහ ඔටුන්නේ ආකෘතිය - මහනුවර ජාතික කෞතුකාගාරය

## ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අවසාන කාලය

අත්අඩංගුවට පත් රාජසිංහ රජු තම බිරින්දෑවරු හතරදෙනා සහ මවගේ අත්ගෙන ඩොයිලි වෙත දිගුකර ඔවුන්ට කිසිදු කරදරයකින් තොරව රැකගන්නා ලෙස ඉල්ලා සිටි බව 1815 පෙබරවාරි 22 දින ඩොයිලි තම දිනපොතේ සටහන් කර ඇත.

අත්අඩංගුවට පත් රජු කොන්වොලිස් නැවෙන් ඉන්දියාව හරහා ගෝවට ගෙන යාමට කටයුතු සම්පාදනය විය.

1816 ජනවාරි 26වන දින සවස 6.00 ආසන්න වෙත්ම රාජකීය කොන්වොල්ස් නෞකාව නැව කොළඹින් පිටත් විය. රජතුමා මෙන්ම බිසෝවරුද අලංකාර වස්ත්‍රාභරණයන්ගෙන් සැරසී සිටියෝය.

"රජ කරන්නට මට ඉඩක් නැති හන්දා මේ ලැබෙන සැලකිලිවලට ස්තූති කළ යුතුයි." යනුවෙන් තමන් ගොඩනංවාගත් නැවේ විල්ලුද පලසක් සහිත ආසනය මත අසුන්ගත් රජු පවසා ඇත. මෙරට රාජවංශය එසේ අවසන් විය.

## ශ්‍රී වික්‍රම රාජසිංහයන්ගේ අවසාන මොහොත

වෙල්ලෝර් කොටුවේ අවුරුදු 16ක් ජීවත්වූ රජු අවුරුදු 52ක් ආයු විඳ 1832 ජනවාරි 30වන දින උදරාබාධයකින් මිය ගියේය.

"ජනවාරි 30වන දින සවස් වන විට සිහිමුර්ජාව සිටි මහනුවර රජතුමා එදින සවස 3.00ට පමණ මිය ගියේය. පසුව පවුලේ ඥතීන්ගේ කැමැත්ත මත පසු දින ඉර අවරට යාමට පෙර ඔහුගේ අවසන් කටයුතු සිදුකළ බව සැන්ට් ජෝර්ජ් බළකොටුවේ සෙන්පති විසින් ආණ්ඩුවේ මහලේකම් හෙන්රි චැසියර් වෙත ජනවාරි 31 දින යැවූ ලිපියකින් දක්වා ඇත.

රාජසිංහ රජු අත්අඩංගුවට පත් ස්ථානය සිහිවනු පිණිස, 1908දී රොබර්ට් චාර්මස් ආණ්ඩුකාරයා විසින් මහනුවර, මහියංගණය පාරේ පොල්වත්ත මාර්ගයේ ස්මාරකයක් පිහිටුවන ලදී.



මඟුල් මඩුවේ රජුගේ ආසනය තිබූ තැන - මැටි ගල් නොමැති හතරැස් කොටුව



මුලෑදෑනි මණ්ඩපය



# වැළකිල්ල

මේ දවස්වල කවුරුත් උත්සාහ කරන්නේ රෝග බෝවීමෙන් වැළකිල්ලටය. විශේෂයෙන් කොරෝනා රෝගය පැතිරීමෙන් වැළකිල්ලට උත්සාහ කරනවාය. එහෙම වැළකෙන්නට උත්සාහ කරන්නේ කොරෝනා රෝගය මාරාන්තික රෝගයක් නිසාය. කොරෝනා වසංගතය රට තුළ පැතිරීම වැළකිල්ලට උත්සාහ කිරීම රටවැසියන්ගේ යුතුකමක්ය. රෝගයක් හැදුණාට පසු බෙහෙත් ගැනිල්ලට වඩා බෝවීමෙන් වැළකිල්ලට කටයුතු කිරීම හොඳය.

බෝ නොවෙන රෝග ඇති අයට නරක පුරුදුවලින් වැළකිල්ලෙන් රෝගය සුවකර ගන්න ලෙහෙසිය. තෙල් කෑම, සීනි කෑම අඩු කිරිල්ල රෝග ඇතිවීමෙන් වැළකිල්ලට හේතු වෙනවාය. සමහරුන්ට තමන්ගේ පුරුදුවලින් වැළකිල්ලට අමාරුය. මත්පැන් බොන්න පුරුදු වූ තැනැත්තාට එයින් වැළකිල්ල අපහසුය. එසේම මත්කුඩුවලට ඇබ්බැහි වූ අයටද ඒවා පාවිච්චි කිරිල්ලෙන් වැළකිල්ල ලෙහෙසි නැත්තේය. දුම්බොන හා බුලත් විට කන අයටද කොපමණ කිව්වත් එම පුරුදුවලින් වැළකිල්ලට බැරිය.

කොහොම වුණත් හැමදෙනාම නරක පුරුදුවලින් වැළකිල්ලට උත්සාහ කළ යුතුය. නරක පුරුදුවලින් වැළකී හොඳ පුරුදුවලට යාමට කටයුතු කිරීම වැදගත්ය. එහෙත් කාට කාටත් අමාරුවන්නේ තමන්ගේ නරක පුරුදුවලින් වැළකිල්ලටය.

නරක පුරුදුවලින් වැළකෙන ලෙස මේ දිනවල සෞඛ්‍ය අංශ අපට උපදෙස් දෙනවාය. ඒ අනුව එක ළඟ සිටීමෙන් වැළකී මීටරයක දුර පවත්වාගත යුතුය. එසේම මුහුණ කට නිරාවරණය කිරීමෙන් වැළකී මාස්ක් එකක් පාවිච්චි කිරීම අවශ්‍යය. අපිරිසුදුව සිටීමෙන් වැළකී නිතර අත්සේදීමට මෙන්ම දිනපතා ස්නානය කිරීමටද පුරුදු විය යුතුය. අපිරිසුදු ඇඳුම් පැලඳුම් පරිහරණයෙන් වැළකී නිතර පිරිසුදුව සිටීම රෝග ව්‍යාප්තිය අඩුවීමට හේතු වෙනවාය.

අද බොහෝ දරුවන් සමාජ මාධ්‍යවලට ඇබ්බැහි වීම නිසා පොත්පත් කියැවීමෙන් වැළකිල්ලට පටන් අරන්ය. එහෙම පොත්පත් කියවීමෙන් වැළකිල්ල නිසා ඒ අය මත්තට අනුවණයන් බවට පත්වෙනවාය. පාසලේ පොත්පත් ඉගෙනගැනිල්ලෙන් වැළකිල්ල නිසා අධ්‍යාපනය කඩාකප්පල් කරගන්නවාය. පාසලේදී ඉගෙනගැනීමෙන් වැළකී සිටින සිසුන් ටියුෂන් පන්තිවලදී මහන්සි වෙලා ඉගෙනගන්න නිසා විභාග පාස් කරන්න පුළුවන් වෙනවාය. අනිත් අතට ටියුෂන් මාස්ටර්ලා ඉලක්ක ප්‍රශ්නවලට උත්තර උගන්වන නිසා වැඩිය මහන්සි වෙලා ඉගෙනගැනිල්ලෙන් වැළකී සිටින්න පුළුවන් වෙලාය. ඇතැම් දරුවන් විභාග දින ළංවෙන විට නින්දෙන් වැළකී පාඩම් කරන්නට යෑම නිසා රෝගී වෙනවාය. අද කොම්පියුටරයට ඇබ්බැහි වී සිටින දරුවන් ලිවිල්ලෙන් කියවිල්ලෙන් වැළකී සිටිනවාය. එහෙම වැළකී සිටිල්ලෙන් ප්‍රතිඵල කොපමණ දරුණුද කිවහොත් ඉහළ විභාග සමත් කළ අයටද නිවැරදිව වාක්‍යයක් ගළපා ලියන්න බැරිය. අනාගත පරපුර පත්තර කියවිල්ලෙන් වැළකිල්ලට යොමු වී විද්‍යුත් කියැවීමට යොමුව තිබෙන නිසා ඉස්සරහට පත්තර නැත්තටම නැතිවෙන්න පුළුවන්ය.

මේ දිනවල කොරෝනා වසංගත තත්ත්වය නිසා පුළුවන් තරම් සංචාරවලින් වැළකිල්ල හොඳය. විනෝද ගමන්, වන්දනා ගමන්, ආදියෙන් පුළුවන් තරම් වැළකිල්ලට උත්සාහ කළ යුත්තේ ඒ නිසා රෝග බෝවීමේ අවදානම වැඩිවෙන හින්දාය. එහෙම සංචාරවලින් වැළකෙන්නේ නැති නිසා පසුගිය දිනවල සංචාර තහනම් කිරීමට ආණ්ඩුවට සිදුවුණාය. විදේශ සංචාරකයන් අපේ රටට පැමිණීමෙන් වැළකිල්ල නිසා සංචාරක ව්‍යාපාරයට කණකොකා හැඬීමෙන් විශාල ආදායමක් රටට අහිමි වුණාය.

පාසල් වසා දැමීම නිසා දරුවන්ට පාසල් යාමෙන් වැළකී සිටින්නට සිදුවුණාය. පසුගිය කාලයේ වැඩපොළවල් කාර්යාල වසා තැබීම නිසා ජනතාවට රැකියාවලට යාමෙන් වැළකෙන්න සිදු වුණාය. එහෙම අයට රැකියාවලට යෑමෙන් සදහටම වැළකෙන්න සිදුවූයේ වැඩපොළවල් දිගටම විවෘත නොකර තිබීම නිසාය.

භාණ්ඩ අපනයනයෙන් වැළකිල්ලට සිදු වූ නිසා රටට එන රට සල්ලි ලැබීමද වැළකුණාය. ජනතාවට ක්‍රීඩාවලින් වැළකිල්ලට සිදුවීම නිසා ඔවුන් රෝගීන් බවට පත්වීමෙන් වළකාගන්න අමාරු වුණාය. ඇඳිරි නීතිය දැමූ කාලවලදී වැඩිදෙනාට ස්වකීය එදිනෙදා වැඩ කටයුතුවලින් වැළකී සිටින්නට සිදුවුණාය. මහමග වාහන ධාවනය නොවූ නිසා ගමනාගමනයෙන් වැළකිල්ලට සිද්ධ වුණාය. ඇඳිරි නීති අවසර පතක් නොමැතිව තම වාහනය වුවද පැදවීමෙන් වැළකිල්ලට සිදුවූයේ පොලිසියට අසුවුණොත් නඩු වැටෙන බව දන්නා නිසාය. ඒ දිනවල ජනතාවගේ සෑම කටයුත්තක්ම වැළකී ගියේය.

රණ්ඩු සරුවල්වලින් වැළකිල්ල අප කාට කාටත් හොඳය. එකිනෙකා සෑම විටම ගහ බැණ ගැනිල්ලෙන් වැළකීම නිසා සාමකාමී රටක් තැනෙනවාය. කවුරුත් එකිනෙකා පරදවා ඉදිරියට දිවිල්ලේ පුරුද්දෙන් වැළකිල්ල ඉතාම හොඳය. බුදුන් වහන්සේ වදාරා ඇත්තේ තෘෂ්ණාවෙන් වැළකිල්ලෙන් සසර ගමන කෙටි කරගන්න පුළුවන් බවය. පස් පවු කිරීමෙන් වැළකිල්ල බෞද්ධයෙකු කළ යුතුම බව බුද්ධාගමේ උගන්වනවාය. සතුන් මැරීමෙන් වැළකෙන බව පන්සිල්වල පළමු ශික්ෂාපදය වෙනවාය. සොරකම් කිරීමෙන්, වැරදි කාමසේවනයෙන් වැළකිල්ල බෞද්ධයෙකුට ඉතාම වැදගත්ය. එසේම බොරු කීමෙන් සහ සුරාපානයෙන්ද වැළකී සිටිය යුතු බව පන්සිල්වල දැක්වෙනවාය. සමහර ආගම්වලින් නම් පවු කිරීමෙන් වැළකිල්ලට වඩා කළ පවු සමාකරගැනිල්ල උගන්වනවාය. එහෙත් කවුරුත් සිතන්නේ පවු කිරීමෙන් වැළකී සිටිල්ල සීමා කිරිල්ලට වැඩිය වටින බවය.

නඩු කීමෙන් වැළකී සිටිල්ල හොඳ බව කියන්නේ නඩු යන්නන් වැනසෙන හින්දාය. ඒත් අපේ ලොක්කන් නම් හදන්නේ නඩු පැවරීමෙන් වැළකිල්ලට නොව ඕනෑ එකටත් එපා එකටත් නඩු දාලා සියල්ල අවුල් කරන්නටය. ඉස්සර ජේ.වී.පී. කාලයේ ජනතාවට නියම කළේ ඡන්දය දැමිල්ලෙන් වැළකිල්ලටය. ඒ කාලයේ ඡන්දදාසලා කතිරේ ගැහිල්ලෙන් වැළකුණේ ජීවිතයට තියෙන ආශාව හින්දාය. අද වනවිට නම් ඡන්දදාසලා හිතන්නේ එහෙම නියෝගයක් නැතත් ඡන්දය දැමිල්ලෙන් වැළකිල්ල හොඳ බවය. ඡන්දදාසලා එහෙම ඡන්දය දැමීමෙන් වැළකෙන තැනට පත්කළේ අපේ කපටි දේශපාලුවන්ය. අද ඡන්දදාසලාට ඕනෑවෙලා තියෙන්නේ මේ දූෂිතයන් දියවන්නාවට යැවීමේ පාපකර්මයෙන් කොහොමහරි වැළකී සිටින්නටය.

# අපේ අයිතීන් රැකගෙන ඒ තුළින් සියලුම ජාතීන්ගේද අයිතීන් රැක ගැනීමටයි අපි උත්සාහ කරන්නේ

## සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති ජගත් සුමතිපාල





● චාමර සම්පත්

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ඉදිරි වර්ෂ සඳහා නව නිලධාරී මණ්ඩලයක් තෝරාගැනීමේ නිලවරණය හෙට (03දා) පැවැත්වීමට නියමිතය. මෙතෙක් සභාපති ලෙස කටයුතු කළ ජගත් සුමතිපාල මහතාගේ ධුර කාලය ඒ අනුව අවසන් වන අතර, ඔහුගේ කාලය තුළ සම්මේලනය වෙනුවෙන් සිදුකළ කාර්යභාරය සම්බන්ධයෙන් අපි ජගත් සුමතිපාල මහතා සමග සාකච්ඡා කළෙමු.

**බෞද්ධ මහා සම්මේලනයට ඔබ සම්බන්ධ වූයේ කෙසේද?**

බෞද්ධ මහා සම්මේලනය කියන්නේ ලංකාවේ තිබෙන ප්‍රබලම, ප්‍රධානතම බෞද්ධ සංවිධානය. එමගින් විශාල කාර්යභාරයක් ඉටුකරනවා. මගේ මෑණියන් බෞද්ධ මහා සම්මේලනයට සම්බන්ධ වුණ නිසා තමයි මම සම්මේලනයට සම්බන්ධ වුණේ. ඒ කාලයේදී අපිට අභියෝග ගණනාවක් තිබුණා. මොකද බෞද්ධ මහා සම්මේලනයෙන් බෞද්ධයෝ ඈත්වෙලා හිටියෙ. 90 දශකයේ අගභාගය වන විට සම්මේලනයේ තිබුණු අර්බුදකාරී තත්ත්වය තුළ ප්‍රබුද්ධයන්, විද්වතුන් ආදිය සම්මේලනයෙන් ඈත්වෙමින් තිබුණා. ඒ වගේම සම්මේලනයේ ආදායම් මාර්ග සියල්ලත් අහිමිවෙලා ණය බරව තිබුණා. මේ නිසා බෞද්ධ මහා සම්මේලනයෙන් ඈත්වුණ පිරිස ළංකරගන්න අවශ්‍ය කටයුතු කරන්න සිදුවුණා. මුලින්ම ප්‍රචාරක මණ්ඩලයේ සභාපති ලෙස ඒ වෙනුවෙන් මම විවිධ වැඩපිළිවෙළ රැසක් ක්‍රියාත්මක කළා. බෞද්ධාලෝක වෙසක් කලාපය වැඩසටහන ආරම්භ කළෙත් මේ කාලයේදීමයි. අලුත් සංකල්ප හැටියට විවිධ වැඩසටහන් කිහිපයක් කළ නිසා බෞද්ධයෝ නැවතත් සම්මේලනය සමග ඒකරාශී කරන්න අපිට හැකියාව ලැබුණා.

**බෞද්ධ මහා සම්මේලනයේ සභාපතිවරයා ලෙස ඔබ පත්වීමෙන් අනතුරුව සිදුකළ වෙනස්කම් ගැන කතා කළොත්?**

මම බෞද්ධ මහා සම්මේලනයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අවුරුදු 20ක් අඛණ්ඩව කටයුතු කරලා තිබෙනවා. එහිදී වසර 09ක් අඛණ්ඩව සභාපති ධුරය දැරුවා. ඉන් අනතුරුව ප්‍රණීත් අබේසුන්දර මහතා සභාපති බවට පත්වුණා. පසුව නැවතත් මම සභාපති ලෙස පත්වුණා.

ඒ වගේම 2004 අවසන් කාලයේදී බෞද්ධයන්ගේ ජාතික සාමාජීය දර්ශනයක් ලෙස බෞද්ධාලෝක පුනරුද ක්‍රියාවලිය එළිදැක්වුවා. ඒ අනුව අපිට වැඩපිළිවෙළක් තිබුණා. 2006දී මම සභාපති ලෙස පත්වෙනකොට මේ වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යාමේ කාර්යය මට පැවරී තිබුණා.

මහාචාර්ය මලලසේකර මහත්මයා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති ධුරය දරන කාලයේ ආරම්භ කරපු ලෝක බෞද්ධ සම්මේලනයේ 50වැනි සංවත්සරය 2000 වසරේදී ලංකාවේදී පවත්වන්න සැලසුම් කර තිබුණත්, එයට අවස්ථාවක් ලැබුණෙ නැහැ. ලංකාවේ වගේම ලෝක බෞද්ධයොත් අපෙන් ඈත්වෙලා හිටියා. මේ සියලුදෙනා නැවත අප වෙත සමීපකර ගැනීමේ ලොකු වගකීමක් අපිට තිබුණා. ලෝක බෞද්ධ සම්මේලනය ලංකාවේ පවත්වන ලෙස නැවත වරක් 2008 වසරේදී පැවැති ලෝක බෞද්ධ සම්මේලනයේදී අපි ඉල්ලීමක් කළා. ඒ අනුව එහි 60වන සංවත්සරය 2010දී ලංකාවේ පවත්වන්න අපිට අවස්ථාව ලැබුණා. එයත් සමග ජාත්‍යන්තරයේ සංවිධාන ලංකාව සමග සමීප කරන්න අපිට අවස්ථාව ලැබුණා.

ඒ වගේම 2550 බුද්ධ ජයන්තිය, 2600 සම්බුද්ධත්ව ජයන්තිය බෞද්ධ මහා සම්මේලනයේ ශත සංවත්සරය, ලෝක බෞද්ධ සම්මේලනයේ 60වැනි සංවත්සරය සමරන්න මට අවස්ථාව ලැබුණා.

රාජ්‍ය නොවන සංවිධානවලින් බෞද්ධයෝ වෙනත් ආගම්වලට හැරවීමේ උත්සාහයක් තිබුණා. එතැනදී අපේ ස්වාමීන් වහන්සේලා ඒවාට විරුද්ධව ක්‍රියාත්මක වුණා. මේ සිදුවීම් නිසා බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය ආරම්භ කරන්න අපි කටයුතු කළා. එහි ප්‍රතිඵලයක් ලෙස 2007 වසරේදී අන්‍යාගමිකකරණය වැළැක්වීමේ කොමිසමක් පත්කරලා 2009දී එහි වාර්තාව එළිදක්වන්න කටයුතු කළා. එහි නිර්දේශ 126ක් තිබෙනවා. ඒ තුළින් වැළැක්වීම් සහ දැනුම්වත්වීම් කරන්න අපි කටයුතු කළා.

බෞද්ධ මහා සම්මේලනයේ ශත සංවත්සරයට සමගාමීව නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කළා. සභාපතිවරයෙක් ලෙස ජාතික තලයේ වගකීම් රැසක් ඉටුකරන්න අවස්ථාව ලැබුණ නිසා ඒ ගැන මට සතුටුයි.

පුරා විද්‍යා විනාශය සම්බන්ධයෙන් අපි අවධානය යොමු කළා. ඒ අනුව 2007 වර්ෂයේදීම පුරා විද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම ගැන දැනුම්වත් කිරීම් ආරම්භ කළා. අනතුරුව පුරා විද්‍යා ස්ථාන ආරක්ෂා කරන බලමුළුවක් ඇති කළා. එය තවදුරටත් පවත්වාගෙන යනවා. පළාත් අතර පුරාවිද්‍යා ස්ථාන විනාශ වෙන්න 13වැනි ව්‍යවස්ථා සංශෝධනයත් බලපෑවා.

**13වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ඔබ පැවසූ කාරණ පැහැදිලි කළොත්?**

අපි විශ්වාස කරන ආකාරයට 13වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව ජාතීන් අතර විශාල විරසකයක් ඇතිවෙලා තියෙනවා. එතැනදී පළාත් හැටියට, ජාතීන් හැටියට වෙන් කර ගන්නා මානසිකත්වයක් ඇතිවෙලා තිබෙනවා. 13 නිසා ඉඩම් බලතල, පොලිස් බලතල ආදී දේවල් සමග එහි ව්‍යාකූලත්වයක් තිබෙනවා. 13වැනි සංශෝධනය අපිට කොච්චර අකටයුතුද කියන කාරණය සම්බන්ධයෙන් අපි විශාල හඬක් නගලා තිබෙනවා. රටේ අයිතිය තිබෙන්නේ රටට මිස පළාතට නෙවෙයි. රටේ අයිතිය පළාතට ගියාම විනාශයක් වෙන්නේ. පුරාවිද්‍යා විනාශයන්ටත් හේතුව එයයි. 13 නිසා මිනිස්සු පැති වෙන්කර ගන්න ක්‍රියාකරන තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා.

**එසේනම් 13වැනි සංශෝධනය වෙනුවට ඔබලාගේ යෝජනාව වෙන්නේ කුමක්ද?**

බෞද්ධයන්ගේ හිමිකම් සම්බන්ධයෙන් අපිට බොහෝ ප්‍රශ්න තිබුණා. එතැනදී අපේ තිබෙන අයිතීන් රැකගන්න බෞද්ධ හිමිකම් කොමිෂන් සභාව ඇති කළා. එතැනදී අපි බලාපොරොත්තු වෙන්නේ අපේ අයිතීන් පෙන්වලා දීලා ඒවා රැකගන්න. ඒ වගේම ව්‍යවස්ථා විකල්ප යෝජනාවලියක් හදන කමිටුවක් 2019 වර්ෂයේ අප්‍රේල් මාසයේදී අපි පත් කළා. නව රජය නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට සූදානම් වන නිසා අපේ කෝණයෙන් බලන ව්‍යවස්ථා යෝජනාවලියක් පසුගිය දෙසැම්බර් මාසයේදී නිකුත් කළා. අපි ඒ තුළින් බලාපොරොත්තු වෙන්නේ අපේ අයිතීන් රැකගෙන ඒ තුළින් සියලුම ජාතීන්ගේ අයිතීන් රැක ගැනීමටයි.

> **සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය කවදාවත් බෝඩ් අල්ලගෙන උද්ඝෝෂණය කරන්න යන්නෙ නැහැ. ප්‍රශ්නයක් ඇති උනොත් ඒ සම්බන්ධව පරීක්ෂා කරලා, හොයල බලලා, අදාළ අංශවලට දැනුම්වත් කරලා ඒක නවත්වන්නයි අපි උත්සාහ කරන්නේ.**

පළාත් සභා සම්බන්ධයෙන් අපේ අදහස විකල්ප යෝජනා තුළ ඉදිරිපත් කර තිබෙනවා. පළාත් සභා නඩත්තුවට විශාල වියදමක් කරන්න වෙනවා. එතරම් මුදල් වියදම් වුණත් වැඩක් වෙන්නෙ නැහැ. සෞඛ්‍ය, අධ්‍යාපන ඇතුළු සියලු සේවාවන් පළාත් සභා අනුව බෙදිලා තියෙද්දි කොහොමද රටක් ගෙනියන්නේ. පළාත් සභා ක්‍රම තුළ විශාල වියදමක් ඇරෙන්න සාර්ථකත්වයක් දැකලා නැහැ.

පළාත් සභා අවශ්‍ය නම් අපි යෝජනා කරන්නේ ඒ සඳහා මැතිවරණ නොපවත්වා, නගර සභා, ප්‍රාදේශීය සභාවලින් තෝරා පත්කර ගන්න කියලයි.

**ඔබ යළිත් වරක් බෞද්ධ මහා සම්මේලනයේ සභාපති ධුරයට තරග කරනවාද?**

ඇත්තෙන්ම මේ වන විට බෞද්ධ මහා සම්මේලනය හැමෝගෙම කතාබහට ලක්වෙන තැනක් බවට පත්වෙලා තියෙනවා. මෙතැනින් ලොකු සේවාවක් වෙනවා. ඒ නිසාම තමයි නිලවරණයට උනන් ප්‍රබල කණ්ඩායම් ඉදිරිපත් වෙලා තියෙන්නේ. ඒක ලොකු ශක්තියක්. බෞද්ධ මහා සම්මේලනයේ නිලවරණයට පෙර සිටින සභාපති නිල බලයෙන්ම ඊළඟ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෙක් වෙනවා. ඒ නිසා සභාපති ධුරයෙන් ඉවත් උනත්, මීළඟ අවුරුදු කිහිපය තුළත් මම කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ඉන්නවා. මම තනතුරක හිටියත්, නැතත් බෞද්ධ මහා සම්මේලනයේ කටයුතු වෙනුවෙන් මගේ සහයෝගය නිරන්තරුවම ලබාදෙනවා.

මම දැන් නිදහස් වෙන්න ඕන කියලා හිතනවා. බෞද්ධ මහා සම්මේලනයට විශාල කාර්යභාරයක් කරන්න තියෙනවා. දැන් ඒ වෙනුවෙන් වෙලාව වැය කරන්න මට හැකියාවක් නැහැ. ඊට වඩා නිදහසේ වැඩ කරන්න මම කැමතියි. ඒ වගේම දැන් බෞද්ධ මහා සම්මේලනය ආර්ථික වශයෙන් ශක්තිමත්. ඒ නිසා පවත්වාගෙන යන්න පුළුවන්. මේ නිසා එය තව පිරිසකට භාරදිය යුතුයි.

**සම්මේලනයට දෙවන පෙළක් සකස් කරන්න පුළුවන් උනාද?**

බෞද්ධ මහා සම්මේලන ඉතිහාසයේ කිසි දවසක නියෝජ්‍ය සභාපති කෙනෙක් පත්වෙලා හිටියෙ නැහැ. නමුත් කලක් නියෝජ්‍ය සභාපති ලෙස කටයුතු කළ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මයා පසුගිය කාලයේදී සභාපති වුණා. ඒ කියන්නේ බෞද්ධ මහා සම්මේලනයට දෙවැනි පෙළක් තිබෙනවා.

ඒ වගේම වත්මන් නියෝජ්‍ය සභාපති, වත්මන් උප සභාපතිවරයෙක් මෙවර නිලවරණයට ඉදිරිපත් වෙලා තිබෙනවා. අපි ඉවත් වෙද්දි තවත් හොඳ පිරිසක් මෙය භාරගන්න ඉදිරිපත් වීම ගැන මම ඉතාම සතුටට පත්වෙනවා.

**තරුණ පිරිස වෙනුවෙන් සම්මේලනයේ තිබෙන ඉඩකඩ කෙබඳුද?**

තරුණ පිරිස මේ කටයුතුවලට සම්බන්ධ කර ගැනීම පිළිබඳව සැලසුම් කිරීමට අපිට තවත් බොහෝ ඉඩකඩ තිබෙනවා. බෞද්ධ සම්මේලනය වගේම ලෝක බෞද්ධ තරුණ සම්මේලනයෙත් සම්බන්ධකම් වැඩි කරලා, රටේම තරුණයන් වෙනුවෙන් කටයුතු කරන වැඩපිළිවෙළක් ඇති කළ යුතුව තිබෙනවා. ඒ අනුව ආවරණය කළයුතු ක්ෂේත්‍ර බොහෝමයක් තිබෙනවා. අපේ පුරාවිද්‍යා ක්ෂේත්‍ර, සිංහල භාෂාව, බෞද්ධාගම අපි රැකගත යුතුයි.

ඒ වගේම සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය කවදාවත් බෝඩ් අල්ලගෙන උද්ඝෝෂණය කරන්න යන්නෙ නැහැ. ප්‍රශ්නයක් ඇති උනොත් ඒ සම්බන්ධව පරීක්ෂා කරලා, හොයල බලලා, අදාළ අංශවලට දැනුම්වත් කරලා ඒක නවත්වන්නයි අපි උත්සාහ කරන්නේ. ඒ වගේම ප්‍රශ්න විසඳගන්න විකල්ප අපි යෝජනා කරනවා. අපේ රටේ මහා සංඝයා වහන්සේලා වැඩ ඉන්න ප්‍රමාණය අඩුයි. පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය පිරිහිලා තිබෙනවා. මෙවැනි දේවල් සමග ශාසනයේ ප්‍රශ්න රැසක් තිබෙනවා. මේ දේවල් නිරවුල් කරන්න අවුරුදු තිහක්, හතළිහක් තිස්සේ අපි උත්සාහ කළත් එය සාර්ථක වෙලා නැහැ. තවමත් හිදැසක් තිබෙනවා.

**නව සභාපති ඇතුළු කාර්ය මණ්ඩලයේ කාර්යභාරය ගැන ඔබේ අදහස කෙබඳුද?**

බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ කාර්යභාරය ඉදිරියට ගෙන යාම සහ බෞද්ධ මහා සම්මේලනය පවත්වාගෙන ආ කාර්යයන් ඉදිරියට කරගෙන යාමේ වගකීම ඔවුන්ට තිබෙනවා. ඒ වගේම තරුණයන් වෙනුවෙන් දීපව්‍යාප්ත වැඩපිළිවෙළක් කරන්න අවශ්‍යයි.

බෞද්ධ මහා සම්මේලනයේ ව්‍යවස්ථාව වෙනස් විය යුතුයි. මොකද එහි තිබෙන ඡන්ද ක්‍රමය ගැළපෙන්නේ නැහැ. ඡන්දවලදී කණ්ඩායම් වෙන් වෙලා ඡන්ද ඉල්ලනවා. ඒ පිරිස් කණ්ඩායම් හැටියටම වෙන් වෙනවා. අනිත් එක බෞද්ධ මහා සම්මේලනයේ ඡන්ද කරන්න ලක්ෂ 20ක් වැය වෙනවා. ඒක අපරාධයක්. ඒ නිසා මේ ක්‍රමය වෙනස් වෙන්න ඕන. ජාතික ප්‍රශ්න වෙනුවෙන් සම්මේලනය තවදුරටත් ඉදිරිපත් විය යුතුයි.

සභාපති ලෙස කටයුතු කරන්න සහයෝගය ලබාදුන් කෘත්‍යාධිකාරී මණ්ඩලය ඇතුළු සියලුදෙනාටත්, සියලු සංවිධානවලටත්, පුද්ගලයන්ටත් ස්තුති කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

NEWS NEWS NEWS NEWS NEWS NEWS NEWS NEWS NEWS NEWS NEWS NEWS

## මන්නාරම හිටපු රදගුරු රායප්පු ජෝශප් හිමිපාණෝ ස්වර්ගස්ථ වෙති

● වවුනියාව - මධුෂංඛ අමරසිංහ

ශ්‍රී ලාංකික කිතුනු ජනතාවගේ ඉමහත් ජනාදරයකට පාත්‍ර වූ මන්නාරම හිටපු රදගුරු රායප්පු ජෝශප් හිමිපාණන් ඊයේ (01දා) උදෑසන ප්‍රතිකාර ලබමින් සිටියදී ස්වර්ගස්ථ වූ බවට මන්නාරම රදගුරු නිවස විසින් නිවේදනය කර සිටියි.

කලක සිට රෝගී තත්ත්වයෙන් සිටි උන්වහන්සේ මිය යන විට 80 වැනි වියේ පසුවූ අතර පැවැති රෝගී තත්ත්වයක් හේතුවෙන් යාපනයේ පෞද්ගලික රෝහලකින් ප්‍රතිකාර ලබමින් සිටියදී මෙලෙස අභාවප්‍රාප්ත වී ඇත.

රායප්පු ජෝශප් හිමිපාණන් 1992 වසරේ ජූලි 06 වැනිදා මන්නාරම රදගුරු හිමිපාණන් වශයෙන් පත්වී වසර 25කට ආසන්න කාලයක් මන්නාරම මෙන්ම මරදමඩු දේවස්ථානයේ රදගුරු හිමිපාණන් වශයෙන් ගෞරවාන්විතව කටයුතු කරන ලදී.



තිස්වසරක යුද සමයේදී මන්නාරමේ මෙන්ම උතුරු ජනතාවගේත් ජාත්‍යන්තරයේත් මහත් ජනාදරයට පත්වූ ජෝශප් හිමිපාණන් යුද්ධයෙන් පීඩාවන්ට පත් ජනතාව ආරක්ෂා කරමින් ඔවුන්ට සහන සැලසීමේ පුරෝගාමියෙකි.

මරදමඩු දේවස්ථානයේද ආරක්ෂාව වෙනුවෙන් මහත් සේවාවක් සිදුකරන ලද හිටපු රදගුරු හිමිපාණන් පැවති අසනීප තත්ත්වයක් හේතුවෙන් 2016 වසරේදී රදගුරු පදවියෙන් විශ්‍රාම ගියේය.

## ප්‍රවීණ ලේඛක, ජනාධිපති නීතිඥ කරුණාරත්න හේරත්ගේ අවසන් කටයුතු හෙට



● අනුරාධපුර - බී. ජී. චතුරංග

අභාවප්‍රාප්ත ප්‍රවීණ ලේඛක, ජනාධිපති නීතිඥ කරුණාරත්න හේරත් මහතාගේ දේහය පිළිබඳ අවසන් කටයුතු හෙට (03දා) සවස 3.30ට අනුරාධපුර නිසළ නිම්නය පොදු සුසාන භූමියේදී සිදු කෙරේ.

අවුරුදු 68 වියේ පසුවන ජනාධිපති නීතිඥ හේරත් මහතා පෙරේදා (31දා) රාත්‍රියේ අනුරාධපුර ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියේදී අභාවප්‍රාප්ත විය.

දේහය මේ වනවිට අනුරාධපුර දෙවන පියවර, අංක 741/13 දරණ, නිවසේ තැන්පත් කර ඇත.

ජනාධිපති නීතිඥ කරුණාරත්න හේරත් මහතා නීතිය පිළිබද ග්‍රන්ථ රැසක් ලියා මෙරට අධිකරණ විනිසුරුවරුන්ට සහ නීතිඥ ප්‍රජාවට සහ නීති ශිෂ්‍යයන්ට දායාද කොට අති දක්ෂ ප්‍රවීණ නීති වේදියෙකි. එප්පාවල පොස්පේට් සමාගමේ සභාපතිවරයා ලෙස කලක් සේවය කල ඒ මහතා උතුරු මැද පළාතින් මෙතෙක් බිහිවූ ප්‍රථම ජනාධිපති නීතිඥවරයාද වේ.




# ලංකාවේ හා එංගලන්තයේ රූගත කළ JEKYLL & HYDE

● එච්.ඒ.ගයාන් මධුශංඛ

**Jekyll & Hyde නම් ටෙලි සිනමා වෘත්තාන්තය ලන්ඩනයේ සහ ශ්‍රී ලංකාවේ රූගත කෙරිණි. 1930 ලන්ඩනයේ සිටින Robert Jekyll නම් පුද්ගලයෙකු වටා මේ කතාව ගෙතී ඇත.**

ඔහු වෛද්‍යවරයෙකුගේ මුනුපුරෙකි. ඔහුගේ පවුලේ ස්වභාවය අනුව ඔහුගේ සැබෑ හැඳුනුම්කම සොයා යාම මේ කතාවේදී සිදුවේ. ඔහුට අඳුරු මායාවන් සතු වූ ශක්තිය පාලනය කර ගැනීමට නොහැකි වීම සහ ඊට මුහුණ දෙන ආකාරය මේ කතා මාලාවේ දිගහැරේ.



Action, Adventure, Drama, Fantasy ශානරවලට අයත් මෙම ටෙලි කතා මාලාව මිනි සීරීස් එකක් ලෙස කොටස් දහයකින් අවසන් විය. ITV නාළිකාවේ මෙය විකාශය විය. මෙය ආරම්භ වන්නේ වසර 50කට පෙර සිලෝන් යනුවෙන් සඳහන් කරමින් ලංකාවේ පැරණි ගම්මානයක දර්ශන මගිනි.

Tom Bateman (Robert Jekyll), Donald Sumpter (Garson), Stephanie Hyam (Lily Clarke), Tom Rhys Harries (Sackler), Natalie Gumede (Bella), Michael Karim (Ravi Najaran), Richard E. Grant (Sir Roger Bulstrode) මෙහි ප්‍රධාන චරිත සඳහා රංගනයෙන් දායක විය. මෙම ටෙලි කතා මාලාව සඳහා අධ්‍යක්ෂණයෙන් Stewart Svaasand, Colin Teague, Joss Agnew, Robert Quinn දායක විය. තිර පිටපත් රචනය සඳහා Simon J. Ashford, Guy Burt, Charlie Higson, Sophie Petzal, Jason Sutton දායක විය.

මෙම සමස්ත ටෙලි සිනමාවේ නිෂ්පාදන නිර්මාණ සැලසුම සිදුකිරීම Catrin Meredydd විසින් සිදුකරන ලද අතර, කලා අධ්‍යක්ෂවරු කිහිපදෙනෙක් දායකත්වය දැක්වීය. Vicki Stevenson, Jono Moles, Errol Kelly, Dan Taylor, Henry Woolway එම කලා අධ්‍යක්ෂවරු වේ. ලංකාවේ රූගත කෙරුණු කොටසේ කලා අධ්‍යක්ෂණය සිදුකළේ එරල් කෙලී මහතාය.



මෙම ටෙලි සිනමා වෘත්තාතයේ රූගත කිරීම් සඳහා ලංකාව යොදා ගැනීම තුළින් චිත්‍රපටයේ කතාවටද නව ආලෝකයක් එකතු වූ බව පෙන්වා දිය හැකිය.

පැරණි යුගයට අයත් වන පරිදි දර්ශන තල සකස් කර සහ පැරණි වාහන යොදා ගනිමින් මෙහි පසුබිම සකස් කිරීමට ලංකාවේ කලා දෙපාර්තමේන්තුව සමර්ථව ඇත. මාස දෙකහමාරකට ආසන්න කාලයක් රූගත කිරීම් කළ මෙහි නුවර, අලුත් නුවර, රඹුක්කන ආදී ප්‍රදේශවල රූගත කිරීම් සිදුකර ඇත.

මෙම චිත්‍රපටයේ ආරම්භක දර්ශනයේ ට්‍රක් රථයක් ගොඩනැගිල්ලක බිත්ති කඩාගෙන ඇතුළට පැමිණෙන අවස්ථාවක් ඇත. ඒ සඳහා එම ගොඩනැගිල්ල සෙට් එකක් ලෙස කලා දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද්දක් වේ. මෙම චිත්‍රපටය සඳහා පැරණි Vice Roy දුම්රියද යොදාගෙන ඇත. The Film Team ආයතනය ලංකාවේ රූගත කිරීම් සඳහා නිෂ්පාදන සහය ලබාදී ඇත.



## 2021 සොනික් දුරකථන නාමාවලියට තොරතුරු එක්රැස් කෙරේ

කීර්ති පැස්කුවල් සංගීතවේදියාගේ සංකල්පයකට අනුව 1997 වර්ෂයේ සිට අඛණ්ඩව එළිදක්වන ලද සොනික් දුරකථන නාමාවලිය යාවත්කාලීන කර 2021 වසර සඳහා නිකුත් කිරීමට සැලසුම් කර තිබේ. එබැවින් සංගීත ක්ෂේත්‍රයට අනුයුක්ත සියලුම ශිල්පීන්ගේ සහ ආයතනයන්ගේ (ගායක-ගායිකා, ගීත රචක, සංගීත අධ්‍යක්ෂවරුන්, වාද්‍ය ශිල්පීන්, සංගීත කණ්ඩායම්, ශබ්දාගාර, සංගීත භාණ්ඩ අලෙවි සැල්, සංගීත පුහුණු ආයතන ඇතුළු) දුරකථන අංකයන් එළඹෙන අප්‍රේල් 30වන දිනට පෙර පහත සඳහන් අංකයන්ට වට්ස්ඇප් මගින්, කෙටි පණිවුඩ මගින් හෝ විද්‍යුත් ලිපිනයට හෝ සාමාන්‍ය තැපැල් මගින් ලැබීමට සලස්වන ලෙස ඔවුන් දන්වා සිටී. තම තොරතුරු එවීමේදී තමන් නියෝජනය කරන අංශයද සඳහන් කළයුතු වේ. දැනට මෙම නාමාවලියේ නම සඳහන්ව ඇති, නමුත් දුරකථන අංකයන් වෙනස්ව ඇති අයද තමන්ගේ නවතම අංකයන් ඔවුන් වෙත යොමු කරන ලෙස දන්වා සිටී.

වට්ස්ඇප් සහ කෙටි පණිවුඩ සඳහා 0770212043 /071 8954214 මගින් හෝ antonjocic@gmail.com විද්‍යුත් ලිපිනයෙන් හෝ සොනික් දුරකථන නාමාවලිය , අංක 52/8/ඩී, මඩපාත පාර, කොළමුන්න, පිළියන්දල යන ලිපිනයට ඔබගේ තොරතුරු ලබාදිය හැක.

සාරවිට.lk
සාරෙට මත්වෙන්න
www.saaravita.lk

## නංගීට දක්වන ආදරය 'දෙව්මි'ටත් දක්වනවා

### දේව සුරේන්ද්‍ර





**සුමති සම්මාන උළෙලේදී වසරේ ජනප්‍රියතම ටෙලි නාට්‍යය බවට පත් වූ 'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍යයේ 'ධනුක' ලෙස ඔබේ ආදරය දිනාගත් දේව සුරේන්ද්‍ර මෙවර 'අද' තරු කතා බහට මෙසේ සම්බන්ධ කර ගත්තේමු. 'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍යයට අමතරව තවත් ටෙලි නිර්මාණ කිහිපයකින්ම ඉදිරියේදී ප්‍රේක්ෂක ඔබ හමුවීමට බලාපොරොත්තුවෙන් සිටින දේව ඒ පිළිබඳව අපි සමග මෙසේ පැවසුවේය.**

**දේව කියන නමට වඩා ඔබ වඩාත් 'ධනුක' කියන නමින් නේද?**

ඇත්තටම, වසර කිහිපයක් තිස්සේ මම 'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍යය සමග සම්බන්ධ වෙලා ඉන්නවා. ටෙලි නාට්‍යයට සම්බන්ධ වුණ මුල් කාලේ ලැබුණ රසික ප්‍රතිචාර අදටත් ලැබෙනවා. ගොඩක් අය දේව කියන නමටත් වඩා දැන් මාව අමතන්නේ නමින්. ඒ තරමට මම ප්‍රේක්ෂකයන්ට 'ධනුක' නමින් ළං වෙලා තියෙනවා.

**ඔබ ටෙලි නාට්‍ය කිහිපයකම පසුගිය කාලේ රඟපෑවාත් අදටත් ඔබ ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රිය 'ධනුක' චරිතය තුළින් පමණයි?**

ටෙලි නාට්‍යය පසුගිය වසර දෙකෙ තුනේම ජනප්‍රිය ලැයිස්තුවේ තිබුණානේ. ටෙලි නාට්‍යය ජනප්‍රිය වුණාම ඒකේ රඟපාන චරිතත් ඉබේම වගේ ජනප්‍රිය වෙනවා. මම හිතන්නෙත් 'ධනුක' කියන චරිතයත් ප්‍රේක්ෂකයන් අතර නිතරම ජනප්‍රිය වෙන්න හේතුව ඒ හින්දා වෙන්න ඇති.

මීට මාසයකට පෙර විකාශය නිමා වුණ 'සිහින සමාගම' ටෙලි නාට්‍යයේ මා රඟපෑවා. ඊට අමතරව 'සඳ එළිය' හා 'හිරු ඇවිදින්' කියන ජනප්‍රිය ලැයිස්තුවේ ටෙලි නාට්‍යයවලත් මම රඟපෑවා. නමුත්, මේ හැම එකකටම වඩා අදටත් මාව ප්‍රේක්ෂයෝ අඳුනන්නේ 'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍යයේ 'ධනුක' කියන නමින්.

**'ධනුක' කියන චරිතය ඔබේ ජීවිතයට සමාන එකක්ද?**

බොහෝ දුරට. මටත් ඉන්නවා නංගී කෙනෙක්. ඒ නංගීට මම ආදරය කරන තරමට 'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍යයේ 'දෙව්මිටත්' ඒ සමාන ආදරයක් දක්වනවා. ටෙලි නාට්‍යයේ දර්ශන කරද්දී මට අමාරුවක් වුණේ නැහැ. මොකද මගේ සැබෑ ජීවිතෙත් මටත් නංගී කෙනෙක් ඉන්න නිසා. ඇයට දක්වන ආදරය සෙනෙහස මම 'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍යයේ 'දෙව්මි'ටත් දක්වනවා. 'ධනුක' කියන චරිතය තුළත් මගේ සැබෑ ජීවිතේට සමාන ලක්ෂණ බොහෝමයක් තියෙනවා.

**ඔබ වර්තමානයේ සිටින ජනප්‍රිය නළුවන්ගේ ලැයිස්තුවේ ඉන්නවාද?**

ඇත්තටම මම දන්නේ නැහැ මම ජනප්‍රියද නැද්ද කියලා. මනාප ලැයිස්තුවල මගේ නම නැති වුණාත් මටම ආදරය කරන රසික පිරිසක් මා වටා ඉන්නවා කියලා කියන්න පුළුවන්. උදාහරණයක් විදිහට ගන්නකෝ මගේ ගුරුතුමා මහේන්ද්‍ර පෙරේරා කියන කලාකරුවා. ඔහුව අද නොදන්න කෙනෙක් නැහැ. රුවින් සමහර අයට අඳුන ගන්න බැරි වුණාත් නම කියූ සැණින් පමණක් මහේන්ද්‍ර පෙරේරා කියන කලාකරුවාව ඕනෑම කෙනෙක් දන්නවා. මටත් අවශ්‍යයි අන්න ඒ විදිහට ජනප්‍රිය වෙන්න. මගේ නම ලංකාවේ හැම කෙනෙක්ම දන්න කෙනෙක් වෙන්න.

**'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍යයත් එක්ක වැඩ කරද්දී තවත් නිර්මාණයකට යොමු වෙන්න කාලයක් ඔබට තියෙනවාද?**

තියෙනවා. 'දෙවෙනි ඉනිම' විකාශය වෙද්දි මම රංගනයෙන් දායක වුණ ටෙලි නාට්‍යය කිහිපයක්ම විකාශය වුණා. තවත් නොබෝ දිනකින් සංජුල දිවාරත්න මහත්මයාගේ 'සිත්' කියන ටෙලි නාට්‍යය තුළින් මාව දකින්න පුළුවන්. එහි මම 'සදේව්' කියන චරිතය නිරූපණය කරනවා.

ඊට අමතරව තවත් ටෙලි නාට්‍යය කිහිපයකටම සම්බන්ධ වෙලා මේ දිනවල මම වැඩ කරනවා. පසුගිය කාලේ කෙරුණු තවත් නිර්මාණ කිහිපයකුත් තියෙනවා ඉදිරියට විකාශය වෙන්න.

**දැනට දේව ටෙලි නාට්‍යය කොපමණ ප්‍රමාණයකට දායක වෙලා තියෙනවාද?**

මම ටෙලි නාට්‍යය ක්ෂේත්‍රයට සම්බන්ධ වුණේ 2013 වසරේ. මුලින්ම රඟපෑවේ නිසල් රත්නායකගේ 'දම්සාරි' ටෙලි නාට්‍යයට. එදා ඉඳලා අද වෙනකම් මම ටෙලි නාට්‍යය 15කට ආසන්න ප්‍රමාණයකට දායක වෙලා තියෙනවා. ඊට අමතරව ගීත රූප රචනා 25කට වඩා වැඩි ප්‍රමණයකට දායක වෙලා තියෙනවා. ඉදිරියට නව ගීත රූප රචනා කිහිපයක් නිකුත් වෙන්නත් නියමිතයි.

● කතාබහ - බුද්ධික සේනාධීර



# රැකියාව නිසා Voice වැඩසටහනින් ඉවත් වුණා

## - දිනිති වල්ගම

**සිරස මාධ්‍ය ජාලය ඔස්සේ ඉතාමත් ජනප්‍රියත්වයට පත් The Voice Sri Lanka මේ වන විට බොහෝදෙනාගේ ආදරයට පත් වැඩසටහනක් ලෙස හැඳින්විය හැකිය. එම වැඩසටහනේ ආරම්භක නිවේදිකාව ලෙස කටයුතු කරනු ලැබුවේ ජනප්‍රිය රංගන ශිල්පිනියක් වන දිනිති වල්ගමගේය. නමුත් හදිසියේම එම වැඩසටහනින් ඇය ඉවත් වීම පිළිබඳ බොහෝදෙනා මත පළ කළ අතර, අපි ඒ පිළිබඳව ඇය සමග මෙසේ කතාබහ කළෙමු.**

● ඩිලාන් ක්‍රිෂාන්ත

**මේ දවස්වල මොකද වෙන්නේ?**

දැන් ආයෙත් Flying පටන් ගත්තා. තව ටෙලි නාට්‍යය තුනක රූගත කිරීම් යනවා. චිත්‍රපට වගයක් එන්න තියෙනවා. ඒ කටයුතු තමයි කරගෙන යන්නේ.

**The Voice Sri Lanka එකෙන් අයින් වුනාද? අයින් කලාද?**

වොයිස් එකෙන් ඇත්තටම මම අයින් වුණා. මම කොහොමත් Blinds වලට විතරයි ගිවිසුම් අත්සන් කරලා තිබුණේ. ඊට පස්සේ ඒක ඉවර වුණා. ඒක අලුත් කරන්න බැරි වුණේ මගේ රැකියාවත් එක්කයි. මම වෘත්තියෙන් ගුවන් සේවිකාවක්. අපිට වැඩ තිබුණෙ නැති නිසා මම කොහොමත් වැටුප් රහිතවයි හිටියෙ. වැඩ නැති නිසා කැමති අයට ගන්න විශේෂ වැටුප් රහිත නිවාඩු දුන්නා. මම ඒක මාස 06ක් හිටියා. ඒ වගේම තමයි අපි සේවය නොකර දවස් 180කට වැඩිය හිටියොත් නැවතත් Initial Training කරන්න ඕනේ. ඉතිං මේ මාසෙ ඉඳන් වැඩ පටන් ගන්නවා. මට රැකියාව වැදගත් නිසා මම ඒක තෝර ගත්තා.

**The Voice Sri Lanka ලැබුණු දේවල් මොනවාද?**

ඇත්තටම මට මේක ලොකු අවස්ථාවක්. ලංකාවේ ඉන්න ඉහළම තලයේ ගායක ගායිකාවන් එක්ක තමයි මම මේ වැඩේ කළේ. සිරස හැමදාම මාත් එක්ක හිටියා. මම නිවේදන කටයුතු පටන් ගත්තේ ෆිල්ම් ස්ටාර් එකෙන්. ඒ හින්දා තමයි මට මේ චාන්ස් එක දුන්නේ. මම සිරසට ඇත්තටම ස්තූතිවන්ත වෙනවා මාත් එක්ක හැමවෙලේම හිටියාට. මේක පටන් ගන්නත් කලින් දවසේ ඉඳන් සමාජ මාධ්‍ය තුළින් මට මඩ ගහන්න ගත්තා. මට මේක කරන්න පුළුවන්ද බැරිද කියන එක ඒ අය බැලුවෙ නැහැ. හැබැයි සිරස හැමදාම මාත් එක්ක හිටියා. හැමදාම පුළුවන් උපරිම මට උදව් කළා. හැම අවස්ථාවකදීම මාව උඩින් තිබ්බා. මට වැටෙන්න දුන්නෙ නැහැ. භාතිය අයියා, ශෂිකා අක්කා ඇතුළු හැමෝම මට ගොඩක් උපදෙස් දුන්නා. මගේ කාර්යභාරය ඉවරයි. ඉතිං සුපුරුදු පරිදි රැකියාව කරගෙන ඉන්නවා.

**ඔබව නිවේදිකාවක් ලෙස බොහෝ දෙනා දැන හැඳිනගෙන හිටියේ නැද්ද?**

මාව ගොඩක් මිනිස්සු අඳුරගෙන හිටියෙ නිළියක් විදිහට. Blind Audition එකේ මගේ නිවේදන හැකියාවක් පෙන්වන්න හරියට අවස්ථාවක් ලැබුණේ නැහැ. Blind Audition එකේ නිවේදිකාවකට ඇත්තටම කරන්න දෙයක් තිබුණෙ නැහැ. ඒත් සිරස මේ මිනිස්සු කියන කතන්දර නිසාම Intro Extort දාලා වැඩසටහන පටන් ගන්න මට අවස්ථාව දුන්නා. ඒක ඉවර කළෙත් මම. එහෙම මට සිරස හදලා දුන්නේ මිනිස්සු මට කියන කතාවලට මට නිවේදනය කළ හැකි කෙනෙක් කියලා පෙන්වන්න ඕන නිසා.



**ටෙලි නාට්‍ය වැඩකටයුතු ගැන කිව්වොත්?**

ඇත්තෙන්ම මේ Voice එක හින්දා මම ගොඩක් වැඩ භාර ගත්තෙ නැහැ. මම කරපු වැඩ තුනක් තියෙනවා එන්න. ස්වර්ණවාහිනී නාළිකාවේ මේ මාසෙ ඉඳන් එකක් විකාශය වෙන්න නියමිතයි. අනිත් එක ITN නාළිකාවේ. මම රැකියාව එක්ක ගොඩක් වැඩකටයුතු භාරගන්නෙ නැහැ. ඊට අමතරව රංගනයෙන් දායක වුණු චිත්‍රපටයක් එන්න තියෙනවා. තව චිත්‍රපටයක් සඳහා අත්සන් කරලා තියෙනවා.

**රංගන ජීවිතය ගැන තෘප්තිමත්ද?**

අවංකවම ඔව්. රංගනය මගේ රැකියාව නෙමෙයි. ඒ නිසා මම වැඩ ඉල්ලගෙන පස්සෙන් යන්නෙත් නැහැ. මට ලැබෙන වැඩක් කරනවා විතරයි. මට ලැබෙන වැඩ වලිනුත් මම කරන්නේ මට ආස වැඩේ. වැඩේ කොච්චර හොඳ වුණාත්, ලොකු ගානක් දෙන්නම් කියලා මොනා කිව්වත්, මම ඒ චරිතයට කැමති නැත්නම් කොහොමත් කරන්නෙ නැහැ. මම අලුත් කෙනෙක්. අලුත් කෙනෙක්ව දකින්න කැමති අය ඉන්න නිසා මට අවස්ථා දෙන්න කැමතියි. මම තෝරා බේරා ගැනීමක් ලොකුවට කරනවා. මම රස්සාවක් කරන කෙනෙක්. ඒ නිසා හැමදේම බදාගෙන කරන්න බැහැ. එහෙම කළොත් ඒ අයත් අමාරුවෙ වැටෙනවා, මාවත් අමාරුවෙ වැටෙනවා. මම මේ රඟපෑම කරන්නේ සල්ලිවලට නෙමෙයි. ඒකට ගානක් ලැබෙන එක වෙනම කතාවක්. ඇත්තටම රඟපෑම මම ආසාවෙන් කරන දෙයක්. රස්සාව කරන ගමන් ලැබෙන නිදහසෙන් දෙයක් කරන්නේ මම සතුටින් ඉන්න ඕන නිසානේ. නැත්නම් ගෙදර ඉන්න වෙලාවට නිදාගන්න එක ඊට වඩා සතුටක්නේ. මට ආත්ම තෘප්තියක් ලැබෙන දෙයක් තමයි මම කරන්නේ.

# ගොඩ ඒමක් නැති ශ්‍රී ලංකාවේ සිනමාව

පිම්පෝ 15 රී

සමාජය කිසියම් අවදි වීමකට ලක්වී සතියක් ගත වුවද පිට පළාත්වල කලා කටයුතුවල ප්‍රබෝධයක් තිබේ යැයි සිතිය නොහැක. කොළඹ සමීපයේ නාට්‍ය හා චිත්‍රපට දර්ශන සඳහා කිසියම් ප්‍රේක්ෂක සහභාගිත්වයක් තිබුණද පිට පළාත්වල සිනමාහල්වල දර්ශන වාර අවලංගු වේ.

පිට පළාත්වල හයයි තිහේ දර්ශනය පැවැත්වෙන්නේම නොමැති තරම්ය. උදෑසන 10.30 සහ පස්වරු 2.30 දර්ශන පවා පැවැත්වෙනුයේ කලාතුරකිනි. පැවැත්වුවද හය හත්දෙනෙකුට වඩා නැත. එයද චිත්‍රපට නරඹන්නට එන පිරිස නොවේ පෙම්වතුන්ය. යාමිතම් ජාම බේරා ගන්නේ ඔවුන්ට පින් සිදුවන්නටය.

මෑතදී කොළඹින් පිටත සිනමාහල්වලට චිත්‍රපට සංස්ථාවේ නිලධාරියෙකු පැමිණ සිනමාහල් හිමියන් සමග කතා කරද්දී ඔවුන් කියා ඇත්තේ ප්‍රධාන ප්‍රශ්නය ප්‍රේක්ෂක සහභාගිත්වය අඩුවීම බවයි. එම නගරයේම තවත් සිනමාහලක අලුත්ම චිත්‍රපටයක් නැරඹීමට එදා පැමිණ ඇත්තේ හය දෙනෙකු පමණක් බවද තොරතුරු වාර්තා වෙයි.

අලුත්ම චිත්‍රපටවලටද ප්‍රේක්ෂක සහභාගිත්වය එසේ නම් චිත්‍රපට කර්මාන්තය පිළිබඳව බලාපොරොත්තු තබාගත හැකිද? මෙම සිනමාහල් නඩත්තු කරනුයේ කෙසේද?

පසුගිය කාලයේ බදු සහනයක් ලබාදීම පිළිබඳව තීරණය වුවද එම සිනමාහල් හිමියන් පවසනුයේ එයද තවමත් ලිඛිතව දන්වා නැති බවය. ඒ බදු සහනයද මේ අර්බුදයට කිසිසේත්ම ප්‍රමාණවත් නොවන සොච්චමක් බව සිනමාහල් හිමියන් පවසා තිබේ.

සතියේ දිනවලට නම් සිනමා දර්ශන පැවැත්වෙනුයේම නැති තරම්ය. ඇතැම් සතිඅන්තවලදීද දර්ශන වාර දෙකක් පැවැත්වෙනුයේ ඉතා කලාතුරකිනි. එයද ඉතා සුළු ප්‍රේක්ෂක සංඛ්‍යාවක් සමගය.

සිනමාහල්වලට ප්‍රේක්ෂකයන් නොපැමිණීමට බලපාන්නේ කෝවිඩ් -19 බව සිතිය හැක. තවමත් ජනතාව සුපුරුදු පරිදි නාට්‍ය චිත්‍රපට නරඹන්නට යෑමට මැලිවෙති. ඒ කෝවිඩ්-19 බිය සිත යට තිබීම නිසාය.

ඇත්තය. කලාව නග්ගනවාට වඩා නිරෝගී සුවයෙන් සිටීම වැදගත්ය. ඉදිරියට වන උත්සව සමයේ සංගීත සංදර්ශන ආදී ජනතාව රැස්වන බොහෝ විනෝදාංශ නවත්වා ඇත්තේ එහෙයිනි.

කෝවිඩ්-19 එන්නට පෙරද සිනමාහල්වලට ප්‍රේක්ෂකයන් ගෙන්වා ගැනීමේ ගැටලුවක් තිබූ බව අප අමතක කළ යුතු නැත. මෙය වසර කිහිපයක් තිස්සේම තිබූ ගැටලුවකි.

විශාල පිරිවැයක් යොදමින් ජනප්‍රිය අධ්‍යක්ෂවරුන් නිර්මාණය කළ චිත්‍රපටවලට පවා ප්‍රේක්ෂකයන් අඩුවීමේ හේතුව කුමක්ද? ඔවුන්ගේ බොහෝ මුල් චිත්‍රපට විශාල ප්‍රේක්ෂක ආකර්ෂණයක් දිනාගත් ඒවාය. කෝවිඩ්-19 ආ පසු පවතින තත්ත්වය කබලෙන් ලිපට වැටුණා සේ යයි අපට කිව හැකිය. එහෙත් අප මේ තත්ත්වයෙන් ගොඩ එන්නේ කවදාද?

බොහෝ චිත්‍රපට ශාලා දිගින් දිගටම දර්ශන අවලංගු වීම නිසා වැසී යන තත්ත්වයක් පවතී. ඇතැම් ශාලා දැනටමත් වැසී ගොස්ය. ඇතැම් සිනමා ශාලාවලට ප්‍රශ්නයක් වී ඇත්තේ නව තාක්ෂණික ක්‍රම ඔස්සේ තිරගත කිරීමේ පහසුකම් නැතිකමය.

එම පහසුකම් ලබා ගැනීමටද විශාල මුදලක් වැය වෙයි. අපහසුවෙන් හෝ නව තාක්ෂණික පහසුකම් ලබාගත්තද ඒ වැය කරන මුදල පියවා ගත හැකිද?

තවමත් රීල් ක්‍රමයට චිත්‍රපට පෙන්වන සිනමාහල්වලට ප්‍රශ්නයක්ව ඇත්තේ අලුත් චිත්‍රපට බොහොමයක් මි.මි. 35 රීල් ක්‍රමයෙන් නොවීමය. මි.මි. 35 පිටපතක් මුද්‍රණය කිරීමට යන පිරිවැය නිෂ්පාදකයාට නැවත ලබා ගැනීමට අපහසුය. එම නිසා නිෂ්පාදකයෝද මි.මි. 35 පිටපත් මුද්‍රණය කිරීමට මැලිවෙති.

අවශ්‍යතාව තිබුණද මේ දිනවල පවතින කෝවිඩ්-19 වසංගතය නිසා බොම්බායෙන් මුද්‍රණ කටයුතු කරගැනීමටද දුෂ්කරතා පවතී. එම නිසා මි.මි. 35 රීල් ක්‍රමයට චිත්‍රපට ප්‍රදර්ශනය කරන සිනමාහල් හිමියන්ට සිදුව ඇත්තේ පැරණි චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමය. එකල මි.මි.35 චිත්‍රපටයක මවු පිටපත ගෙන්වීමේදී බදු සහනයක් ලැබිණි. එය පසුගිය කාලයේ අවලංගු කර ඇතැයි වාර්තා පළවෙයි.

චිත්‍රපට සංස්ථාවෙන් ලබාදෙන ලිපිය රේගුවට ඉදිරිපත් කිරීමෙන් එම බදු සහනය ලබාගත හැකිවිය. දැන් මි.මි. 35 මවු පිටපත ගෙන්වන්නේ නම් බදු මුදල්ද ගෙවිය යුතුය. ඊට හේතුව වශයෙන් දැක්වූයේ වර්තමාන චිත්‍රපට ඩී.සී.පී තාක්ෂණයෙන් ප්‍රදර්ශනය කරන නිසා එම බදු සහනය අනවශ්‍ය බවය. හැකියාවක් තිබුණද මේ දුෂ්කරතා නිසා මි.මි. 35 පිටපත් ගෙන්වීම තවත් දුෂ්කර වී ඇත. කෝවිඩ්-19 මෙන්ම මේ කාරණාද පිට පළාත්වල ප්‍රේක්ෂක සහභාගිත්වය අඩුවීමට බලපා ඇත.



රොඩ්නි විදානපතිරණ

# 'ඔටුනු නොපලන් කුමරාගේ දැනුණු සිනමා පෙළහර' 04දා දක්වා





ප්‍රවීණ රංගන ශිල්පී කුමාර තිරිමාදුර ඇගයීමේ සිනමා උළෙල 'ඔටුනු නොපලන් කුමාරාගේ දැනුණු සිනමා පෙළහර' අනිද්දා (04දා) දක්වා කොල්ලුපිටිය ලිබර්ටි සිනමා ශාලාවේදී පවත්වනු ලැබේ.

පසුගිය මාර්තු 31දා කුමාර තිරිමාදුර රංගනයෙන් දායක වූ 'ධර්ම යුද්ධය' සිනමා නිර්මාණය ප්‍රදර්ශනය කිරීමෙන් ඇරඹි 'ඔටුනු නොපලන් කුමාරාගේ දැනුණු සිනමා පෙළහර' හිදී ඊයේ (01දා) 'ටවුමේ ඉස්කෝලේ' සිනමා නිර්මාණය ප්‍රදර්ශනය වූ අතර, අද (02දා) කුමාර තිරිමාදුර රංගනයෙන් හා අධ්‍යක්ෂණ කාර්යෙන් දායක වූ ' ද නිවුස් පේපර්' සිනමා නිර්මාණයත්, හෙට (03දා) 'තණ්හා රතී රඟා' සිනමා නිර්මාණයත්, අනිද්දා (04දා) 'ගාමනී' සිනමා නිර්මාණයත් ප්‍රදර්ශනය කිරීමට නියමිතව තිබේ.

සිනමා උළෙලේ දර්ශන වාර පෙ.ව 10.30, ප.ව 2.30 හා ප.ව 6.30ට පැවැත්වෙන අතර, ප්‍රවේශපත්‍රයක මිල රු.500කි.

# මැටි පිඩක අභිමානය රන් පෝරුව මුහුරත් උළෙලදා





කීර්ති රත්නායක අධ්‍යක්ෂණය කරනු ලබන අනිල් ජයසූරිය නිෂ්පාදනයෙන් දායක වන 'රන් පෝරුව' ටෙලි නිර්මාණයේ මුහුරත් උළෙල පසුගියදා කොට්ටාවේ පැනොරාමා හෝටල් පරිශ්‍රයේදී පවත්වනු ලැබීය.

'රන් පෝරුව' කපිල කුමාර අටුපෙළගේ තිර රචනයක් වන අතර, මීට රංගනයෙන් ඩග්ලස් රණසිංහ, විශාඛා සිරිවර්ධන, රමණී සිරිවර්ධන, පාලිත සිල්වා, සරත් චන්ද්‍රසිරි, ජනක් ප්‍රේමලාල්, නිරෝෂා මෛත්‍රී, සම්පත් අතාවුද, ශාන් බන්දු වීරසිංහ ආදීහු දායක වෙති.






# ශ්‍රී ලංකා සිනමා අධ්‍යක්ෂවරුන්ගේ සංසදයේ මහ සභා රැස්වීම අප්‍රේල් 6දා

දේශීය සිනමා අධ්‍යක්ෂවරුන්ගේ එකමුතුව වන 'ශ්‍රී ලංකා සිනමා අධ්‍යක්ෂවරුන්ගේ සංසදයේ' වසර දෙකකට වරක් පවත්වනු ලබන මහ සභා රැස්වීම මෙම වසරේ අප්‍රේල් මස 06වන දින සවස 3.30ට කොළඹ 07, ශ්‍රී ලංකා පදනම් ආයතන ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

ශ්‍රී ලංකා සිනමා අධ්‍යක්ෂවරුන්ගේ සංසදයේ දැනටමත් සාමාජිකත්වය ලබාගෙන ඇති සියලුදෙනා හටත්, නව සාමාජිකයන් ලෙස සංසදයට බැඳීමට කැමති සෑම කෙනෙකුටමත් මහ සභා රැස්වීම සඳහා සහභාගී විය හැකියි.

මහ සභා රැස්වීම සඳහා සහභාගී වීමට සුදුසුකම් ලැබීමට චිත්‍රපටි අධ්‍යක්ෂවරයෙකු ලෙස එක් චිත්‍රපටියක් හෝ තිරගත කර තිබීම අත්‍යාවශ්‍ය වන අතර, තම චිත්‍රපටිය තවම තිරගත කර නොමැති වුවත් ඒ සඳහා ජාතික හෝ අන්තර්ජාතික මට්ටමින් සම්මාන දිනා සිටින අධ්‍යක්ෂවරයෙකුට වුවද රැස්වීමට සහභාගී වීමට අවස්ථාව සැලසේ.

විවිධ අභියෝග හමුවේ පසුගිය වසර දෙක පුරාවට ශ්‍රී ලංකා සිනමා අධ්‍යක්ෂවරුන්ගේ සංසදයේ ප්‍රගතිය සහ කාර්යක්ෂමතාව පිළිබඳ කරුණු පැහැදිලි කිරීමටත්, වර්තමානයේ සිංහල සිනමා කර්මාන්තය වෙනුවෙන් ගත යුතු සෘජු තීන්දු පිළිබඳ සාකච්ඡා කිරීමටත් මෙම මහ සභා රැස්වීම අවස්ථාවක් වනු ඇති අතර, 2021-2023 යන දෙවසර සඳහා නව විධායක කමිටුව තෝරා පත්කර ගැනීමද එදින සිදුකරනු ලබයි.



# 'සිංහබාහු' 04දා

අ.පො.ස සා/පෙළ සිංහල විෂය සඳහාද නිර්දේශිත මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ විශිෂ්ටතම නිර්මාණයක් වන 'සිංහබාහු' නාට්‍යයේ විශේෂ දර්ශන වාරයන් ද්විත්වයක් අනිද්දා (04දා) සවස 3.30ට සහ 7.00ට කොළඹ 07, ලයනල් වෙන්ඩ්ට් රඟහලේදී වේදිකාගත කිරීමට කටයුතු යොදා ඇත. මෙම දර්ශනයේ සියලුම ආසන සැලසුම්කර ඇත. ප්‍රවේශපත් රඟහලෙන් පමණක් වෙන් කරවාගත හැක. මෙම දර්ශනයේ ප්‍රධාන සංවිධායක ලෙස ජූඩ් ශ්‍රීමාල් කටයුතු කරයි.

# 'ඇන්ටික් කඩයක මරණයක්' හෙට ලයනල් වෙන්ඩ්ට් හිදී




ප්‍රවීණ සිනමාවේදී අශෝක හඳගම 'ඇන්ටික් කඩයක මරණයක්' නාට්‍යය හෙට (03දා) සවස 3.30ට සහ 7.00ට කොළඹ 07, ලයනල් වෙන්ඩ්ට් රඟහලේදී රඟදැක්වේ.

කලක් වේදිකා රංගනයෙන් බැහැරව සිටි ප්‍රවීණ රංගන ශිල්පී සහ සෞන්දර්ය හා ප්‍රාසාංගික කලා මහාචාර්ය සෞම්‍ය ලියනගේ ප්‍රධාන භූමිකාව පණගන්වන 'ඇන්ටික් කඩයක මරණයක්' නාට්‍යයේ අනෙකුත් භූමිකාවන් පසන් රණවීර, නිපුනි ශාරධා සහ ස්ටෙෆාන් තිරිමාන්න විසින් රඟදක්වයි. චින්තක ජයකොඩිගේ සංගීතයෙන්ද, බිමල් දුෂ්මන්තගේ වේදිකා නිර්මාණයෙන්ද හැඩගැන්වෙන මෙහි රංගාලෝකය අනුරුද්ධ මල්ලවාරච්චිගෙනි. මෙහි ප්‍රධාන සංවිධායක ලෙස ජූඩ් ශ්‍රීමාල් කටයුතු කරන අතර, මෙම දර්ශනයේ සියලුම ආසන සැලසුම්කර ඇත.

රජය විසින් නිකුත් කරන ලද කෝවිඩ් පැතිරීම වළකන උපදෙස් මාලාවන්ට අනුගතව ප්‍රවේශපත් සීමිත ප්‍රමාණයක් පමණක් නිකුත් කෙරේ. ප්‍රවේශපත් රඟහලෙන් පමණක් දැන් වෙන්කරවාගත හැක.

## COVID-19 සුවවූවෝ ලක්ෂ 730ක් ඉක්මවති



ලොව පුරා COVID-19 ආසාදනය වී සුවඅතට පත්වූවන් සංඛ්‍යාව ඊයේ සවස 7.00 වන විට 73,198,185ක් බවට පත්ව තිබූ බව එක්සත් ජනපදයේ ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ නව කොරෝනා තොරතුරු මධ්‍යස්ථානය මගින් සඳහන් කෙරිණි. ඒ අතරින් වැඩිම සුවවීම් ප්‍රමාණය වන 11,474,683ක් ඉන්දියාවෙන් වාර්තා වී තිබේ. එසේම බ්‍රසීලයෙන් වාර්තා වන සුවවීම් සංඛ්‍යාව 11,181,371ක් බවට පත්ව ඇත. රුසියාවෙන් වාර්තා වන සුවවීම් 4,128,769ක් දක්වා ඉහළ නැග තිබේ. මේ අතර ඊයේ දිනය වනවිට ලොව පුරා වාර්තා වන සමස්ත COVID-19 ආසාදිතයන් සංඛ්‍යාව 129,032,284ක් දක්වා ඉහළ නැග තිබුණි. එසේම සමස්ත මරණ සංඛ්‍යාව 2,818,245ක් බවට පත්ව තිබුණි.

# නවතම COVID-19 ව්‍යාප්තිය 2020ට වඩා දරුණුවීමේ අවදානමක් පවතීලු

## - PAHO හි විශේෂඥයන් පිරිසක් අනතුරු අඟවති

අද වනවිට ලොව රටවල් කිහිපයකදීම යළිත් COVID-19 වසංගත රැලි ව්‍යාප්තවීමේ ප්‍රවණතාවයේ වේගය අනුව, එම තත්ත්වය 2020 දී ලොව මුහුණදුන් තත්ත්වයට වඩා දරුණු විය හැකි බව විශේෂඥයන් පිරිසක් අනතුරු අඟවා සිටිති. පෑන් ඇමෙරිකානු සෞඛ්‍ය සංවිධානය (PAHO - Pan American Health Organization) මගින් මෙම කරුණු සඳහන් කර සිටියි.

එහි අධ්‍යක්ෂ කරිස්සා එටිඑන්නේ මේ පිළිබඳව අදහස් දක්වමින්, "මෙය හදිසියේම ඇති වූ තත්ත්වයක් නෙමෙයි. ලොව පුරා බොහෝ රටවල් යළිත් වටයකට තම තමන්ගේ රටවල COVID-19 වෛරසයේ නැගී සිටීමක් දකිනවා. එළඹෙන ග්‍රීෂ්ම සෘතුවේදී දකුණුදිග අර්ධගෝලයේදී මේ තත්ත්වය ඉහළ යා හැකියි." යනුවෙන් පවසා තිබේ.

ඒ අනුව මෙම තත්ත්වය පාලනය සඳහා ඉක්මන් පියවරක් නොගතහොත් පසුගිය වසරේදී දුටුවාට වඩා වැඩි වසංගත තත්ත්වයේ නැගී සිටීමකට මේ වසරේදී ලෝකයට මුහුණ දෙන්නට සිදුවනු ඇතැයිද පර්යේෂකයන්ගේ අදහස වී තිබේ. එහිදී ද පෑන් ඇමෙරිකානු කලාපය තුළ තත්ත්වය පෙර වසරට වඩා විශාල බවත් පැවසෙයි.

"ගෙවුණු සති හතර තුළදී අපිට සෑම දින හතකටම වරක් මිලියනයක නව ආසාදිතයන් හමුවන තත්ත්වයක් වාර්තා වුණා. ඒ අනුව මෙම වසංගතයේ සම්ප්‍රේෂණය තවදුරටත් ලෝකයේ බොහෝ ප්‍රදේශ තුළ වඩාත් ක්‍රියාකාරී බව මින් පෙන්නුම් කරනවා. ඒ නිසා මට කියන්න තියෙන්නේ හැකිතාක් නිවෙසටම වී සිටින්න කියලයි." ඇය පවසයි. එහිදී ඇය අදහස් කරන්නේ මුඛ ආවරණ පැළඳීම, නිතර දෑත් සේදීම මෙන්ම සමාජ දුරස්ථකරණය අඛණ්ඩව පවත්වා ගැනීමේ වගකීමය.



# එන්නත්කරණය නැවතුනොත් ලබන වසරේදී විකෘති වූ COVID-19 ප්‍රභේදයක අවදානමක්



COVID-19 වෛරසයට එරෙහිව ලොව පුරා ක්‍රියාත්මක එන්නත්කරණයේ මන්දගාමී බව සහ එම එන්නත් ලොව පුරා සමානව බෙදී නොයෑම යන කාරණා හේතුවෙන් ලෝකයම අනාගත අවදානමක පසුවන බව ලොව මුල් පෙළේ සෞඛ්‍ය විශේෂඥයන් අනතුරු අඟවා සිටියි.

මෙහිදී මූලිකවම මෙම පමාව සහ අසමානතා නිසා ලබන වසරේදී පමණ ලොව තුළ ඇතිවිය හැකි විකෘතියකට ලක් වූ COVID-19 වෛරසයේ නව ප්‍රභේදයකට සාර්ථක ලෙස මුහුණදීම සඳහා එන්නත් තුළ බලයක් නොමැති වීම ඊට හේතුව බව ඔවුන් පෙන්වා දෙයි.

ලොව පුරා මුල් පෙළේ අධ්‍යයන ආයතන රැසක විද්‍යාඥයන් හැත්තෑ හත්දෙනෙකු එක්ව මෙම අදහස් පළ කරයි. මෙහිදී ඔවුන් සියලු දෙනා සම්බන්ධ කරගනිමින් අදහස් විමසීමක් සිදුකර ඇති අතර, ඔවුන්ගෙන් 30%ක ප්‍රතිශතයක්ම දෙවැනි පරම්පරාවේ එන්නත් තවත් මාස නවයක කාලයක් තුළදී ලොව තුළ පැවතිය යුතු බව පවසා ඇත. එසේම මෙම COVID-19 මර්දන එන්නත් ලොව පුරා පුළුල් ලෙස නිෂ්පාදනය කිරීම මෙන්ම ලෝකය පුරාම බෙදා හැරීමත් සිදු විය යුතු බව ඔවුන් අවධාරණය කර සිටියි.

# ජොන්සන් ඇන්ඩ් ජොන්සන් එන්නත් මාත්‍රා මිලියන 15ක් විනාශ කරලා?



◀ UNITED STATES ▶

ඇමෙරිකා එක්සත් ජනපදයේ ඖෂධ නිෂ්පාදන සමාගමක් වන ජොන්සන් ඇන්ඩ් ජොන්සන් සමාගම මගින් නිපදවූ COVID-19 මර්දන එන්නත් මාත්‍රා මිලියන 15ක් විනාශ කරදමා ඇතැයි ඇතැයි වාර්තා වෙයි.

සමාගම පවසන ආකාරයට බැල්ටිමෝට්හි පිහිටි සිය කර්මාන්තශාලාව තුළදී නිපදවූ එන්නත් තොගයක් මෙලෙස විනාශ කර දමා තිබේ. අදාළ පරිශ්‍රය පවත්වාගෙන ගිය Emergent BioSolutions නම් සමාගම එම එන්නත් නිපදවීමේ ප්‍රමිතිය ආරක්ෂා කරගැනීමට අපොහොසත් වීම ඊට හේතුව බව සඳහන් වෙයි.

මෙම ජොන්සන් ඇන්ඩ් ජොන්සන් එන්නතේ එක් මාත්‍රාවක් පමණක් වෛරසය මර්දනයට ප්‍රමාණවත් වන බවට සඳහන් වීම එම එන්නත පිළිබඳව ලොව පුරා වැඩි අවධානය යොමු වීමට හේතු විය. කෙසේ වෙතත් තමන්ට මෙම එන්නත් මිලියන 15 භාවිතයෙන් ඉවත් කිරීමට සිදුව තිබෙන බව සමාගම පවසයි.

"මේ එන්නත් මාත්‍රා සියල්ලම දැන් විනාශ කර තිබෙන්නේ. ඒවා කිසිම අයුරකින්වත් එන්නත් බෝතල් වෙත පිරවීමක් හෝ නිෂ්පාදනයේ අවසන් අදියරක් වෙත ළඟාවී තිබුණේ නැහැ" සමාගම සඳහන් කරයි. කෙසේ වෙතත් මෙලෙස එම එන්නත් මාත්‍රාවන්හි ප්‍රමිතිය ආරක්ෂා කරගැනීම සඳහා අපොහොසත් වීමට හේතුව කුමක්ද යන්න ජොන්සන් ඇන්ඩ් ජොන්සන් සමාගම මෙතෙක් පැහැදිලි කර නැත.

## චීනයේ COVID-19 මර්දන එන්නත් වෙත WHO වෙතින් සහතිකයක්

චීනය මගින් ඉදිරිපත් කර ඇති COVID-19 මර්දන එන්නත් වන Sinovac සහ Sinopharm එන්නත් රෝග ලක්ෂණ සහිත COVID-19 රෝගීන් සඳහා ඉතාමත් සුරක්ෂිත සහ ඉහළ සාර්ථකත්වයක් සහිත එන්නත් බවට නම් කළ හැකි යැයි ලෝක සෞඛ්‍ය සංවිධානයේ එන්නත් පිළිබඳ විශේෂඥයන් පිරිසක් පවසයි.

මෙම එන්නත් දෙක සම්බන්ධයෙන් මෙතෙක් සිදු කර ඇති සායනික පරීක්ෂාවන්හි දත්ත පදනම් කරගනිමින් අතරමැදි විශ්ලේෂණයක ප්‍රතිඵල ලෙස එම විශේෂඥයන් මෙම කරුණු සඳහන් කර තිබේ. කෙසේ වෙතත් මෙම එන්නත් දෙක ලෝක සෞඛ්‍ය සංවිධානය තුළ අනුමත කිරීම සඳහා තවත් දත්ත අවශ්‍ය ඇති බවත් එම පිරිස් පවසා සිටියි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ ක්‍රියාත්මක ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන ආයතනය ලෙස මෙම විශේෂඥයන්ගෙන් සමන්විත කණ්ඩායම කටයුතු කරයි. මෙය SAGE (Strategic Advisory Group of Experts on Immunization) ලෙස හැඳින්වෙයි.

## බ්‍රිතාන්‍යයේ සිදු කළ කැණීමකින් වසර 6,000ක් පැරැණි ලුණු ගබඩාවක් හමුවේ



අදින් වසර 6,000කට පමණ පෙරාතුව නව ශිලා යුගයේදී බ්‍රිතාන්‍ය තුළ විසූ ජනතාව ලුණු නිෂ්පාදනය කර එම ලුණු ගබඩාකර තබා ගත් බවට අලුත්ම සාක්ෂි හමුව ඇතැයි ගවේෂකයන් පිරිසක් පවසති. එරට උතුරුදිග යෝර්ක්ෂයර්හි ගොවිපොළක් ආශ්‍රිතව සිදු කළ කැනීමකදී මෙම සොයා ගැනීම සිදු කර තිබේ.

ඒ අනුව ක්‍රි.පූ. 3800 පමණ කාලයේදී මෙම ලුණු මිනිසා විසින් නිෂ්පාදනය කර ගබඩා කර තබා ගන්නට ඇතැයි විශ්වාස කෙරෙන බව පර්යේෂකයන් සඳහන් කරයි. මෙම සොයා ගැනීම් අතර උදුන් තුනකින් සමන්විත අගල්ද පවතී. එසේම නවශිලා යුගයට අයත් මැටි භාණ්ඩ කොටස් කිහිපයක්ද හමුව ඇති අතර, ඒවා තුළ තැන්පත්ව තිබූ ලුණුද සොයාගෙන තිබේ. ඒ අනුව එම යුගයේදී මිනිසා ලුණු සැකසීමේ යෙදී සිටි බවට මෙය කදිම සාක්ෂියක් බව පර්යේෂකයෝ පවසති.

මීට පෙර බ්‍රිතාන්‍ය තුළදී හමුවුණු පැරණිතම ලුණු නිෂ්පාදන පරිශ්‍රය ක්‍රි.පූ.1400 පමණ කාලයට අයත්ව තිබූ බවට වාර්තාවල සටහන්ව තිබේ. මීට පෙර නවශිලා යුගයට අයත් ලුණු පතල් යුරෝපයේ රටවල් කිහිපයකදීම හමුවී තිබුණත් බ්‍රිතාන්‍යයෙන් එවැන්නක් හමුව නොතිබුණි.

# ගැබිනි අවධියේදීත් COVID-19 එන්නත් සාර්ථකයිලු

## - ගැබිනි සහ කිරිදෙන මවුවරුන් තුළත් සාමාන්‍ය කාන්තාවන්ට ලැබුණු ප්‍රතිදේහ මට්ටම ලැබිලා



COVID-19 වෛරසය මර්දනය සඳහා ලබාදෙන එන්නත් ගැබිණී මවුවරුන් සඳහාත් සාර්ථක ප්‍රතිඵල අත්කර දෙන බව විද්‍යාඥයන් පිරිසක් සිදුකළ අලුත්ම අධ්‍යයනයක් මගින් සහතික කර තිබේ. බ්‍රිතාන්‍යයේ බර්මිංහැම් නුවර මැසචුසෙට්ස් රෝහල, මැසචුසෙට්ස් තාක්ෂණික ආයතනයේ Ragon Institute of MGH සහ කාන්තා රෝහල මෙන්ම හාවර්ඩ් විශ්වවිද්‍යාලයේද විද්‍යාඥයන් පිරිසක් එක්ව මෙම අධ්‍යයනය සිදුකර ඇත.

මෙහිදී පර්යේෂකයන් Moderna එන්නත හෝ Pfizer-BioNTech එන්නත ලබාගත් කාන්තාවන් 131 දෙනෙකු සම්බන්ධයෙන් තොරතුරු රැස්කර තිබේ. ඒ අතරින් 84දෙනෙකුම ගැබිනි මවුවරුන් ලෙස හඳුනාගෙන ඇත. එසේම 31දෙනෙකු කිරිදෙන මව්වරුන් වන බවත්, 16දෙනෙකු ගැබිනි තත්ත්වයට පත් නොවූවන් වන බවත් පැවසෙයි. 2020 දෙසැම්බර් 17දා සිට 2021 මාර්තු 02දා දක්වා කාලය තුළදී මෙම අධ්‍යයනය සිදුකර තිබේ.

ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලවලට අනුව මෙම කාන්තාවන් ගැබිනි තත්ත්වයේ පසුවුවත්, කිරිදෙන තත්ත්වයේ පසුවුවත් එසේත් නැත්නම් ගැබිනියක බවට පත්ව නොසිටියත් ඒ සියලු දෙනා තුළම එන්නත ලබා ගැනීමෙන් අනතුරුව නිර්මාණය වී ඇති ප්‍රතිදේහ මට්ටම් එක හා සමාන බව හඳුනාගෙන ඇත.

"මේ එන්නත් එම කාන්තාවන් කෙරෙහි ඉතාමත් සුවිශේෂී අන්දමින් සාර්ථක වෙලා තිබෙනවා කියලා මින් පෙන්නුම් කරනවා." පර්යේෂකයන් පවසයි.

මේ අතර මෙම ගැබිනි මව්වරුන් හරහා අලුත උපන් බිළිඳුන් වෙත COVID-19 වෛරසයට එරෙහි එම ප්‍රතිදේහ හුවමාරුවීමක් වන බවත්, එය මවු කිරි සහ වැදැමහ හරහා සිදුවන බවත් හඳුනාගෙන ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රතිදේහ අලුත ඉපැදුණු එම දරුවන්ගේ සිරුරු තුළ කොපමණ කාලයක් රැඳී පවතිනවාද යන්න සම්බන්ධයෙන් මෙම අධ්‍යයනයේදී මෙතෙක් පැහැදිලි කරගෙන නැත.

## රට ලොක්ඩවුන් කිරීමට ප්‍රංශ ජනපති තීරණය කරයි




◀ FRANCE ▶

ආසන්න සති කිහිපයේදී ප්‍රංශය තුළ වර්ධනය වෙමින් පවතින COVID19 ආසාදිතයන් සංඛ්‍යාව හේතුවෙන් ලබන අප්‍රේල් 03වැනිදා සිට සති හතරක කාලයකට රට පුරා ක්‍රියාත්මක වන ලෙස ලොක්ඩවුන් සීමා පනවන බව ජනපති එමානුවෙල් මක්රොන් නිවේදනය කරයි.

රූපවාහිනිය හරහා ජනතාව අමතමින් ජනපතිවරයා සිය තීරණය ප්‍රසිද්ධියට පත් කර තිබේ. ඒ අනුව මෙතෙක් රට තුළ ක්‍රියාත්මක වූ ලිහිල් ලොක්ඩවුන් සීමා රට පුරාම බලපැවැත්වෙන ලෙස දැඩි කරන බව ජනපතිවරයා පවසයි. එහිදී මෙතෙක් විවෘතව පැවැතුණු ප්‍රංශයේ පාසල්ද ලබන අප්‍රේල් 26වැනිදා දක්වා සති තුනක කාලයකට වසා දැමීමට තීරණය කෙරී ඇත.

පාසල් වැසීමට අමතරව එම රට පුරාම සංචරණ සීමා පැනවීමක්ද සිදුව තිබේ. එසේම අත්‍යවශ්‍ය නොවන කඩසාප්පු වසාදැමීමක් සම්බන්ධයෙන් ජනපතිවරයා නියෝග ලබා දී ඇත. කෙසේ වෙතත් ජනපතිවරයා මෙහිදී ජනතාවට නිවසේ රැඳී සිටින ලෙස ඉල්ලීමක් කර නොමැති අතර, ජනතා ඒකරාශීවීම් වෙත සහභාගි වීමෙන් වළකින ලෙසට හෝ දැනුම්දීමක් හෝ සිදු කර නැත.

බදාදා දිනයේදී පමණක් ප්‍රංශය තුළින් නව ආසාදිතයන් 53,000ක් හමුව ඇති අතර මරණ 304ක් වාර්තා වී ඇත. ඒ අනුව මේ දක්වා එරට තුළ වාර්තා වන මරණ සංඛ්‍යාව 95,667ක් දක්වා ඉහළ නැග තිබේ.

## පාකිස්තානයේදී COVID-19එන්නත් මාත්‍රා 550ක් අස්ථානගත වෙලා

### - තවත් මාත්‍රා 350ක් කුණු ගොඩකට දමලා



◀ PAKISTAN ▶

පාකිස්තානය තුළ ක්‍රියාත්මක COVID-19 එන්නත්කරණය සඳහා යොදා ගැනීමට නියමිතව තිබූ එන්නත් මාත්‍රා 550ක් අස්ථානගත වී ඇතැයි වාර්තා වෙයි. එරට ලාහෝර් නුවර රජයේ රෝහලේදී මෙම එන්නත් මෙලෙස අස්ථානගත වී තිබේ.

ඒ අනුව මෙම එන්නත්වලට සිදුවූයේ කුමක්ද යන්න සොයා බැලීම සම්බන්ධයෙන් විමර්ශනයක් දැනටමත් ආරම්භ කෙරී ඇත. මෙම අස්ථානගතවීම සම්බන්ධයෙන් තවමත් රෝහල් බලධාරීන් කිසිදු පැහැදිලි කිරීමක් සිදුකර නොතිබීමත් විශේෂත්වයකි. රෝහලේ බලධාරියෙකුට අනුව මෙහිදී එන්නත් නැතිවීමක් සිදුව නොමැති අතර සිදුව ඇත්තේ එහි වාර්තා තැබීමේ ඇති වූ ගැටලුවක් බව කියැවෙයි.

මේ අතර ලාහෝරයේ පිහිටි රජයට අයත් මොසැන්ග් ශික්ෂණ රෝහල තුළ ගබඩා කර තිබූ තවත් COVID-19 එන්නත් මාත්‍රා 350ක්ද, අපද්‍රව්‍ය ගොඩකට දමා ඇතැයි එරට මාධ්‍ය පවසයි. මෙම සිදුවීමෙන් අනතුරුව රෝහලේ සේවා කටයුතු සුපරීක්ෂකවරයාගේ සේවය අත්හිටුවීමක්ද සිදුව තිබේ.

## හිටපු ඇමෙරිකානු රාජ්‍ය ලේකම් ජෝන් කෙරී යළිත් රාජකාරියේ

### - ඇමෙරිකාව නියෝජනය කරමින් එක්සත් අරාබි එමීරය, ඉන්දියාව සහ බංග්ලාදේශයේ සංචාරයක

ඇමෙරිකා එක්සත් ජනපදයේ නව ජනාධිපති ජෝ බයිඩන් විසින් දේශගුණික කාරණා පිළිබඳ එරට නියෝජිතයා ලෙස නම් කර තිබෙන ජෝන් කෙරී ඉදිරි දිනවලදී එක්සත් අරාබි එමීරය, ඉන්දියාව සහ බංග්ලාදේශය යන රටවල සංචාරයක නිරත වීමට නියමිත බව එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව පවසයි.

මෙම මාසයේදී එක්සත් ජනපදයේදී පැවැත්වීමට නියමිත දේශගුණික සමුළුවට පෙරාතුව ඔහු මෙලෙස එම රටවලට යාමට තීරණය කර තිබේ.

අප්‍රේල් 01දා සිට 09දා දක්වා මෙම සංචාරය සංවිධානය වී ඇත. හිටපු ජනාධිපති බැරැක් ඔබාමාගේ පාලන සමයේදී ජෝන් කෙරී එරට රාජ්‍ය ලේකම්වරයා ලෙසින්ද කටයුතු කළේය. ඒ අනුව එම අත්දැකීම්ද සමග ඔහු මෙවර වත්මන් ජනපතිවරයාගේ දේශගුණික කාරණා පිළිබඳ නියෝජිතයා ලෙස රාජ්‍යතාන්ත්‍රික රාජකාරි අරඹා තිබෙන බව විදෙස් මාධ්‍ය පවසයි.

මෙම සංචාරයේදී ජෝන් කෙරී අබුඩාබි, නව දිල්ලිය සහ ඩකා නුවර යන එම රටවල අගනුවර වෙත පැමිණෙන බව රාජ්‍ය දෙපාර්තමේන්තුව නිවේදනයක් මගින් සඳහන් කර තිබේ. මෙම රාජ්‍යයන් තුනෙහිම රාජ්‍ය නායකයන් ලබන අප්‍රේල් 22 වැනිදා සිට දින දෙකක් අන්තර්ජාලය හරහා පැවැත්වෙන හමුව සඳහා ආරාධනා ලැබ සිටින රාජ්‍යයන් 40 අතරටද ඇතුළත්ව සිටියි.



2015 වසරේදී ප්‍රංශයේදී ඇති කරගත් දේශගුණික විපර්යාස පිටුදැකීමේ සම්මුතියෙන් එක්සත් ජනපදයේ හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් සිය රට ඉවත් කර ගත්තේය. ඊට හේතුව වූයේ එම සම්මුතිය යටතේ එකඟ වී ඇති මෙම සියවස අවසන් විට පෘථිවි උෂ්ණත්වය සෙල්සියස් අංශක 1.5කින් පහත හෙළීම සඳහා දායකවීමට සිය රටට නොහැකි වීම බව ට්‍රම්ප් එවරදී පවසා තිබුණි. අද වනවිට ලෝකයේ දෙවැනි විශාලතම හරිතාගාර වායු විමෝචකයා වන්නේද ඇමෙරිකා එක්සත් ජනපදයයි.

## බංගබන්දු කුසලාන ජාත්‍යන්තර කබඩ් තරගාවලිය

# ශ්‍රී ලංකාවෙන් වැඩි දස්කම්



● සංජීව ධර්මසේන

බංග්ලාදේශයේ පැවැත්වෙන බංගබන්දු කුසලාන පස් සාමාජික ජාත්‍යන්තර කබඩි තරගාවලියේ අවසන් මහා තරගයට සුදුසුකම් ලබාගැනීමට සත්කාරක බංග්ලාදේශ කණ්ඩායම සමත් විය. ශ්‍රී ලංකාවට එරෙහි තීරණාත්මක තරගයෙන් ලකුණු 33 -31ක් ලෙස තියුණු ජයක් ලැබීමත් සමග බංග්ලාදේශයට අවසන් සටනේ දොරටු විවර විය.

සත්කාරක බංග්ලාදේශයට අමතරව ශ්‍රී ලංකාව, කෙන්යාව, නේපාලය හා පෝලන්තය සමගින් පැවැත්වෙන මෙම තරගාවලියේ මූලික වටයේ තරග පෙරේදා අවසන් වූ අතර, එහිදී සහභාගි වූ තරග හතරෙන් තරග 03ක් ජයගනිමින් අවසන් සටනට පිවිසීමේ සුදුසුකම් ලැබීමේ තරගයට පිවිසීමට ශ්‍රී ලංකා කණ්ඩායම අවස්ථාව උදා කරගත්තේය.

පසුගිය මාර්තු මස 28වැනිදා ආරම්භ වූ මෙම තරගාවලියේ මූලික වටයේ තරග අවසානයේදී සත්කාර බංග්ලාදේශය මුහුණදුන් තරග 04ම ජයගනිමින් ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ අත්පත් කරගත් අතර, ශ්‍රී ලංකාවට එහි දෙවැනි ස්ථානය හිමිවිය.

තරග 04කට ක්‍රීඩාකර ඉන් තරග 02ක් ජයගත් කෙන්යාව ප්‍රසාද ලකුණු සටහනේ තෙවැනි ස්ථානයේ පසුවන අතර, තරග 04න් එක් තරගයක් පමණක් ජයගත් නේපාලයට සිවුවැනි ස්ථානයත්, තරග සියල්ලම (04) පරාජය වූ පෝලන්තයට අවසන් ස්ථානයත් හිමිවිය.

මූලික වටයේ ශ්‍රී ලංකාව මුහුණදුන් පළමු තරගයෙන් කෙන්යාවට එරෙහිව ලකුණු 35-33ක් ලෙස තියුණු ජයක් ලැබූ අතර, පෝලන්තයට එරෙහි තරගය ලකුණු 45 - 16ක් ලෙස පහසුවෙන් ජයගත්තේය. සමස්ත බංග්ලාදේශයම බලාසිටි තරගාවලියේ තෙවැනි තරගයෙන් තියුණු සටනක් දී ලකුණු 33-31ක් ලෙස බංග්ලාදේශය හමුවේ පසුබැසීමට ශ්‍රී ලංකාවට සිදුවිය. මෙම ජයත් සමග මූලික වටයේ ක්‍රීඩාකළ සියලුම තරග අපරාජිතව අවසන් කිරීමට බංග්ලාදේශයට අවස්ථාව උදාවිය.

ශ්‍රී ලංකාව මූලික වටයේ තරග අවසන් කරමින් පෙරේදා (31දා) පස්වරුවේ නේපාලයට එරෙහිව ක්‍රීඩාකළ තරගය ලකුණු 45 -28ක් ලෙස විශිෂ්ට අයුරින් අවසන් කිරීමට සමත් විය. ශ්‍රී ලංකා කණ්ඩායම අවසන් මහා තරගයට සුදුසුකම් ලැබීමේ තරගය ඊයේ පස්වරුවේ කෙන්යාවට එරෙහිව පැවැත්වීමට නියමිතව තිබුණි. මෙම සියලුම තරග ඩකාහි ෂහිඩ් නූර් හුසේන් ජාතික වොලිබෝල් ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.

# අපිට අහිමි සඳරුවන්ගේ වේගය



## කුවේට් ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරන ඉහළම ප්‍රහාරක වේගයක් සහිත අන්තර්ජාතික පිතිකරුවා රවිජ සඳරුවන්

● ඕෂිත වරකපිටිය

අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලය (අයි.සී.සී.) නිකුත් කරන ලද නවතම ඉහළම ප්‍රහාරක වේගයක් සහිත අන්තර්ජාතික පිතිකරුවන්ගේ ලැයිස්තුවේ පෙරමුණ ගැනීමට, කුවේට් ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරන ශ්‍රී ලාංකිකයෙකු වන රවිජ සඳරුවන් සමත්විණි. රවිජගේ පිතිකරණ වේගය දැක්වෙන්නේ 165.80ක් ලෙසිනි. ජාත්‍යන්තර ක්‍රිකට් ආයතනය නිකුත් කළ සටහනට අනුව පිතිකරණ වේගය 160 ඉක්මවූ එකම පිතිකරුවා වන්නේ ද රවිජ සඳරුවන්ය. ශ්‍රී ලංකා කණ්ඩායම වෙනුවෙන් මෙම සටහනේ ඉදිරියෙන්ම සිටින පිතිකරුවා තිසර පෙරේරාය. ඔහුගේ පන්දුවට පහරදීමේ වේගය 151. 63කි. කෙසේ වෙතත් සමස්ත සටහනේ තිසර පසුවන්නේ 09වැනි ස්ථානයේය.

මේ වන විට 28 හැවිරිදි වියේ පසුවන රවිජ කොළඹ ලුම්බිණි විදුහලේ ආදි ශිෂ්‍යයෙකු වේ. හෙතෙම කලක් සැරසන්ස් ක්‍රීඩා සමාජයද නියෝජනය කර තිබේ.

ඔහු මේ වන විට අන්තර්ජාතික පන්දුවාර විස්සයි20 තරග 15කට ක්‍රීඩා කරමින් ලකුණු 577ක් ලබා සිටින අතර, එහි සාමාන්‍යය 44.38කි. ඊට ශතකයක් හා අර්ධ ශතක 04ක් ඇතුළත්ව ඇත. රවිජ මේ වනවිට අන්තර්ජාතික තරගවලදී හයේ පහර 36ක් හා හතරේ පහර 52ක් එල්ල කර ඇත.

මෙහි දෙවැනි ස්ථානයේ ඔස්ට්‍රේලියානු කණ්ඩායමේ ප්‍රවේගකාරී පිතිකරු ග්ලේන් මැක්ස්වෙල් සිටින අතර ඔහුගේ පන්දුවට පහරදීමේ වේගය 158.92කි. තෙවැනි ස්ථානය සිංගප්පූරුවේ ටිම් ඩේවිඩ් (158.52) මෙහි සිවුවැනි ස්ථානයේ නවසීලන්තයේ කොලින් මුන්රෝ (156.44) රැඳී සිටින අතර කොදෙව් කණ්ඩායමේ එවින් ලුවිස් (155.74) පස්වැනි ස්ථානයේ රැඳී සිටියි.

## ශ්‍රී ලංකා කණ්ඩායමේ බ.ඉ. කොදෙව් සංචාරය

# වර්ෂාවෙන් බාධා මැද පැතුම්ගෙන් සංසුන් ඉනිමක්

ශ්‍රී ලංකා - බ.ඉ. කොදෙව් දෙවැනි හා අවසන් ටෙස්ට් ක්‍රිකට් තරගයේ තෙවැනි දිනය වර්ෂාව නිසා ක්‍රිකට් ක්‍රීඩාවට සාර්ථක දිනයක් නොවූ අතර, දිනය නිමා වනවිට පළමු ඉනිම ක්‍රීඩා කරමින් සිටි ශ්‍රී ලංකා කණ්ඩායම කඩුලු 08ක් දැවී රැස්කරගෙන සිටියේ ලකුණු 250ක් පමණි. ඒ අනුව ඔවුන්,කොදෙව් පළමු ඉනිමට වඩා තවත් ලකුණු 104ක් පසුපසින් සිටියි.

මෙරට වේලාවෙන් ඊයේ අලුයම (01දා) අවසන් වූ තරගයට අවස්ථා කිහිපයකදීම වර්ෂාවෙන් බාධා වූ අතර, ඒ හේතුවෙන් සමස්ත තෙවැනි දිනයේදීම ක්‍රියාත්මක කිරීමට හැකි වූයේ පන්දුවාර 42.1ක් පමණයි.

පළමු ටෙස්ට් තරගයේදීම ශතකයක් වාර්තා කරමින් වාර්තා පොත් අතරට ඇතුළත් වූ පැතුම් නිශ්ශංක මෙම තරගයේද සිය වගකීම කණ්ඩායම වෙනුවෙන් ලබාදුන්නේය. අංක 06 පිතිකරු ලෙස පිටියට පිවිසි ඔහු දිනය නිමාවන විට පන්දු 119කට ක්‍රීඩාකර ලකුණු 49ක් රැස් කරගෙන ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය දායකත්වයක් ලබාදුන්නේය.

ඇන්ටිගුවාහි ශ්‍රීමත් විවියන් රිචඩ්ස් ක්‍රීඩාංගණයේ පැවැත්වෙන මෙම තරගයේ තෙවැනි දිනට තරගය ආරම්භ කරන විට අසීරුවෙන් ඉනිම ගොඩනගමින් සිටි ශ්‍රී ලංකා කණ්ඩායම කඩුලු 03ක් දැවී ලකුණු 136ක් රැස් කරගෙන සිටියේය.ඉනිම ගොඩනැගීම වෙනුවෙන් සටනක් දුන් දිනේෂ් චන්දිමාල් ලකුණු 34ක් හා ධනංජය ද සිල්වා ලකුණු 23ක් රැස්කරගෙන සිටියහ.

කෙසේ නමුත් චන්දිමාල්ට රැස්කිරීමට හැකිවූයේ තවත් ලකුණු දහයක් පමණි. මුළු ලකුණු 152දී ලකුණු 44ක් රැස්කරගෙන සිටි චන්දිමාල්ගේ ඉනිම අවසන් විය.දිනයේ පළමු කඩුල්ල ලෙස ෂැනොන් ගේබ්‍රියල් යොමු කළ කෙටි පන්දුවකට අනවශ්‍ය පහරක් එල්ල කිරීමට යාමෙන් චන්දිමාල් දැවී ගියේය.

මේ අතර ධනංජය ද සිල්වා ලකුණු 39ක් රැස්කරගෙන සිටියදී කඩුල්ල මුවා කිරීමේ වරදට හසුකර ගැනීමට ජර්මේන් බ්ලැක්වුඩ් සමත් වුවද, එය දැවී යාමක් නොවන බව පුනරූපණවලින් දක්නට ලැබුණි. කෙසේ නමුත් විනිසුරු තීරණ නැවත විමසීමේ ක්‍රමවේදය (DRS) එම අවස්ථාවේදී ධනංජය යොදා ගත්තේ නම් ඔහුට තවදුරටත් පන්දුවට පහරදීමේ අවස්ථාව හිමිවීමට තිබුණි. නමුත් ඔහු ඒ සඳහා යොමු නොවීම ශ්‍රී ලංකා ඉනිමට අවාසියක් විය. නිරෝෂන් දික්වැල්ල ලකුණු 20ක් රැස් කළේය.

පන්දු යැවීමේදී අල්සාරි ජෝෂප් සහ ජේසන් හෝල්ඩර් කඩුලු දෙක බැගින් බිඳ හෙලු අතර, කෙමා රෝච්, ෂැනොන් ගේබ්‍රියල්, කයිල් මේයර්ස් සහ ජර්මේන් බ්ලැක්වුඩ් එක් කඩුල්ල බැගින් දවාගැනීමට සමත් වූහ.

මෙම තරගයේ සිවුවැනි දිනය ඊයේ ක්‍රියාත්මක වූ අතර, තෙවැනි දිනයට වර්ෂාවෙන් දැඩි බාධා එල්ල වීම හේතුවෙන් සිවුවන දිනය පැය භාගයක් ඉදිරියට ගෙන ඇත. ඒ අනුව මෙරට වේලාවෙන් ඊයේ (01) රාත්‍රී 07.00ට තරගය ආරම්භ කිරීමට නියමිතව තිබුණි.

ශ්‍රී ලංකා කණ්ඩාමේ ආරාධනයෙන් මෙම තරගයේ පළමුවෙන් පන්දුවට පහර දුන් කොදෙව් කණ්ඩායම පළමු ඉනිමට ලකුණු 354/10ක් රැස්කිරීමට සමත් විය.

එහිදී විශිෂ්ට ඉනිමක් ක්‍රීඩා කළ නායක ක්‍රෙයිග් බ්‍රැත්වෙයිට් සිය 09වැනි ටෙස්ට් ශතකය වාර්තා කරමින් ලකුණු 126ක් රැස් කළේය. පන්දු යැවීමේදී සුරංග ලක්මාල් කඩුලු 04ක් සහ දුෂ්මන්ත චමීර කඩුලු 03ක් බිඳලීමට සමත් විය.



පැතුම්

**බ.ඉ. කොදෙව් පළමු ඉනිම 287/7 (පන්දුවාර 86)**

ක්‍රෙග් බ්‍රැත්වේට් 126 (311, 4x13), රකීම් කෝන්වෝල් 73 (92,4x10,6x1), කයිල් මේයර්ස් 49 (61,4x8), ජේසන් හෝල්ඩර් 30 (34,4x5), අල්සාරි ජෝෂප් 29 (41,4x3,6x1), සුරංග ලක්මාල් 4/94 (28), දුෂ්මන්ත චමීර 3/69 (21.1)

**ශ්‍රී ලංකාව පළමු ඉනිම 250/8 (පන්දුවාර 103.1)**

පැතුම් නිශ්ශංක නොදැවී 49 (119,4x4), ලසිත් ඇඹුල්දෙණිය නොදැවී 0 (11), ළහිරු තිරිමාන්න 55 (106,4x61), දිනේෂ් චන්දිමාල් 44 (101,4x6), ධනංජය ද සිල්වා 39 (140,4x3), නිරෝෂන් දික්වැල්ල 20 (25,4x2), ජේසන් හෝල්ඩර් 2/39 (21), අල්සාරි ජෝශප් 2/64 (10)

# 87වැනි මහගස්තොට කඳු තරණය

## හෙට සහ අනිද්දා



● විශ්ව මුදියන්සේ

ශ්‍රී ලංකාවේ පැරණිම ධාවන ක්‍රීඩා සංගමය වන සිලෝන් මෝටර් ස්පෝර්ට්ස් ක්ලබ් (CMSC) විසින් 87වැනි වරට සංවිධානය කරන 'මහගස්තොට කඳු තරණය' මෝටර් රථ හා යතුරුපැදි ධාවන තරගාවලිය හෙට සහ අනිද්දා (03, 04) යන දෙදින තුළ නුවරඑළිය මහගස්තොට තේ කඳුයාය කේන්ද්‍ර කරගනිමින් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

දීර්ඝ අතීතයක් ඇති මෙම තරගාවලිය 1934 වර්ෂයේ සිට පැවැත්වෙයි. මෙහි යතුරුපැදි සහ පැරණි මෝටර් රථ ධාවන තරග හෙට (03දා) පැවැත්වෙන අතර, පසුදින මෝටර් රථ ධාවන තරග සඳහා වෙන් කර තිබේ. ජයග්‍රාහකයන්ට කුසලාන සහ සහතිකපත් පිරිනැමීමද ඒ ඒ දිනයන්හිදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

මෙම තරගාවලියේ ප්‍රධාන අනුග්‍රාහකයා ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් (SLT-MOBITEL) ආයතනය කටයුතු කරන අතර, ඔවුන් මේ සඳහා අඛණ්ඩව අනුග්‍රහය ලබාදෙන තෙවැනි අවස්ථාව මෙයයි.

තරගාවලියේ නිල අනුග්‍රාහකත්වයට අදාළ ගිවිසුම් හුවමාරු කරගැනීමේ අවස්ථාව පසුගියදා පැවැත්විණි.

## වයස 19න් පහළ ක්‍රිකට් තරගාවලිය (Division I)



### ශා.අන්තෝනි පිලට කඩුලු 05ක ජයක්

රත්ගම දේවපතිරාජ විදුහල පරාජය කර කඩුලු 05ක ජයක් ලැබීමට වත්තල ශා.අන්තෝනි විදුහල සමත් විය. මෙම තරගය ගාල්ලේදී පැවැත්විණි.

**දේවපතිරාජ විදුහල 207/10 (පන්දුවාර 49.1)**

ජීවක ශෂීන් 73, සසංක නිර්මාල් 23, ගිහාන් සත්මික 2/14, ශාන් අනිකෙත් 2/31

**ශා. අන්තෝනි විදුහල 211/5 (පන්දුවාර 38.2)**

ගිහාන් සත්මික 50, රොමේෂ් සුරංග 44, අවිශ්ක තරිඳු 43*, සඳුන් රෙක්ස්මෝටියර් 29, චමින්ද සඳරුවන් 4/42

### රාජකීය විදුහලට ලකුණු 06ක ජයක්

කැලණිය ගුරුකුළ විදුහල පරාජය කර ලකුණු 06ක තියුණු ජයක් ලැබීමට කොළඹ රාජකීය විද්‍යාලය සමත් විය. මෙම තරගය රාජකීය විදුහල් ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

**රාජකීය විදුහල210/3 (පන්දුවාර 31)**

අහන් වික්‍රමසිංහ 92*, කවිඳු පතිරත්න 53*, සදීෂ රාජපක්ෂ 22

**ගුරුකුල විදුහල 204/8 (පන්දුවාර 31)**

කෙමිර නයනතාරු 50, සිතිජ චමෝද් 47, රෂ්මික මෙවන් 33, ගිශාන් බාලසූරිය 3/33, සොනාල් අමරසේකර 2/42

### ශා. පීතර විදුහලට දැවැන්ත ජයක්

මහනුවර ධර්මරාජ විදුහල පරාජය කර ලකුණු 125ක දැවැන්ත ජයක් ලැබීමට බම්බලපිටිය ශා. පීතර විදුහල සමත් විය. මෙම තරගය ශා. පීතර විදුහල් ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

**ශා. පීතර විදුහල 265/7 (පන්දුවාර 50)**

විනුධ ලියනගේ 64", නිපුණක ෆොන්සේකා 63, ශන්ශයි ගුණතිලක 39, ළහිරු චේතක 35, ශානුක ගලගොඩ 24, සදීප රත්නායක 2/81, උපේන්ද්‍ර වර්ණකුලසූරිය 2/41

**ධර්මරාජ විදුහල140/8 (පන්දුවාර 50)**

පුලිඳු පෙරේරා 61, චමෙල්කර් ද සිල්වා 3/15

### මහින්ද විදුහලට කඩුලු 03ක ජයක්

කොළඹ තර්ස්ටන් විදුහල පරාජය කර කඩුලු 03ක ජයක් ලැබීමට ගාල්ල මහින්ද විදුහල සමත් විය. මෙම තරගය මහින්ද විදුහල් ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

**තර්ස්ටන් විදුහල 230/10 (පන්දුවාර 50)**

භාවන්ත ජයසිංහ 71, ධනංජ සිල්වා 37, පුන්තිල කුමාර 21, සුබානු රාජපක්ෂ 3/34, නවෝද් පණවිතාන 3/36, කුෂාන් මධුෂ 2/40

**මහින්ද විදුහල 231/7 (පන්දුවාර 44.5)**

කවිසිත කොඩිතුවක්කු 97, සඳෙව් ඉඳුවර 27, ධනුජ ඉඳුවර 21, උපුල් හෙට්ටිආරච්චි 5/35

### මාතර ශා. තෝමස්ට කඩුලු 06ක ජයක්

කුරුණෑගල ශා. ආනා විදුහල පරාජය කර කඩුලු 06ක ජයක් ලැබීමට මාතර ශා. තෝමස් විදුහල සමත් විය. මෙම තරගය කුරුණෑගලදී පැවැත්විණි.

**ශා. ආනා 155/10 (පන්දුවාර 47.1)**

රිසිත පෙරේරා 66, ත්‍රිමල්ෂ සිල්වා 21, සචිර රෂ්මික 4/16

**ශා. තෝමස් විදුහල 156/4 (පන්දුවාර 45.2)**

හිරන්ත ජයසිංහ 60*, හරිඳු ජයසේකර 58

## වයස 19න් පහළ ක්‍රිකට් තරගාවලිය (Division II)

### ශා. ජෝන්ස්ට ලකුණු 98ක ජයක්

මීගමුව ශා. පීතර විදුහල පරාජය කර ලකුණු 98ක ජයක් ලැබීමට පානදුර ශා. ජෝන් විදුහල සමත් විය. මෙම තරගය පානදුරේදී පැවැත්විණි.

**ශා. ජෝන්ස් විදුහල 204/6 (පන්දුවාර 42)**

අමිල තුරුවන් 53, යසිරු සන්දීප 35, දිනුෂ්ක මධුෂාන් නොදැවී 24, දිනෙත් ප්‍රසංග නොදැවී 23, නවීන් අතිෂ්ට 2/16, දිනෙත් තත්සර 2/28

**ශා. පීතර විදුහල 106 (පන්දුවාර 29.4)**

දිනෙත් සත්සර 31, ඔෂේන් දිලංක 26, සුමුදු උදාර 4/22, තිශාන් අචින්ත 3/24, රෙශාන් මලිත් 2/01

## වයස 19න් පහළ ක්‍රිකට් තරගාවලිය (Division III)

### රත්නපුර ශා. ඇලෝසියස්ට ලකුණු 86ක ජයක්

මොනරාගල රාජකීය විදුහල පරාජය කර ලකුණු 86ක ජයක් ලැබීමට රත්නපුර ශා. ඇලෝසියස් විදුහල සමත් විය. මෙම තරගය රත්නපුර සීවලී ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

**ශා. ඇලෝසියස් විදුහල 161/9 (පන්දුවාර 50)**

විහාර අත්තනායක 54, චානුක ධනංජය 31, සචිත් තරුෂාන් 21, දමිත් කුමාර 4/24, අවිෂ්ක ලක්ෂාන් 2/12

**රාජකීය විදුහල 75/10 (පන්දුවාර 27.4)**

රංගන ජයලත් නොදැවී 32, චානුක ධනංජය 4/16, විහාර අත්තනායක 2/10, කවිඳු ඩිල්ෂාන් 2/16


රැඩිකල් ලොක්කෝ දෙන්නෙක් පුට්ටු කරන්න අලුත් කපුවෙක්!

මේ සතියේ දේශය බලන්න....

දේශය
ඉරිදා සංග්‍රහය
දේශයේ අනාගතය වෙනුවෙන්...
මිල රු 50/- යි
ඔබේ පිටපත කලින් වෙන්කරවා ගන්න..
wijeyanewspapers
විජය ප්‍රකාශනයක්


කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 08 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 අප්‍රේල් මස 02වැනි සිකුරාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.